ශ්‍රී ලංකාවේ අංක එකේ කාන්තා පුවත්පත

ධරණී

සතුටින් ජීවිතය දරන්නී

2022 දෙසැම්බර් 21 වන බදාදා
3 කාණ්ඩය 03 කලාපය
මිල රු. 80 යි

විශේෂ අතිරේකයක් නොමිලේ

රනින් වාත්තු කරලා දුන්නත් පම්පෝරි නෝනලානම් එපා!

මං වගේ සෙකන්ඩ් හෑන්ඩ් කොල්ලෙකුට අහුවෙන්න එපා කියලා ඒකි කැම්පස් එකේ හැමෝටම කියලා

ආර්ථික අර්බුද මැදත් වසන්තය උදා කරගන්න හැටි වසන්ති කියයි

මගේ පුතා මම දුන්නු කිරිවල ණය ගෙවලා ඉවරයි

ටී.එම්.ඩිල්ශාන්ගේ මව නන්දනී ප්‍රියලතා

කවී රාජපක්ෂ

ප්‍රධාන අලෙවි නිලධාරී
සොෆ්ට්ලොජික් ලයිෆ් ආයතනය

ඡායාරූප
ක්‍රිෂාන් කාරියවසම්

නත්තල් දා අමුත්තන්ට රස සංග්‍රහයට කදිමයි

මිශ්‍ර නූඩිල්ස්

අවශ්‍ය ද්‍රව්‍ය

- නූඩිල්ස් ග්‍රෑම් 750
- ලීක්ස් හෝ ලූනු කොළ ග්‍රෑම් 200
- කැරට් ග්‍රෑම් 150
- සුදුලූනු ග්‍රෑම් 25
- ඉඟුරු ග්‍රෑම් 25
- ඉස්සෝ ග්‍රෑම් 200
- දැල්ලෝ ග්‍රෑම් 200
- කටු නැති කුකුල්මස් ග්‍රෑම් 200
- බිත්තර 3
- ගම්මිරිස් ග්‍රෑම් 10
- සීනි මේස හැඳි 2

සාදන ක්‍රමය

- පළමුව නූඩිල්ස් ඇති පමණට ලුණු දමා තම්බා ගන්න.
- ඉන්පසු ඇල් ජලයෙන් හොඳින් සෝදා වතුර පෙරා භාජනයකට එක්කර ගන්න.
- දැන් ඉස්සන්, දැල්ලන්, කුකුල් මස් වෙන වෙනම බැදගන්න.
- භාජනයක් ලිප තබා එයට තෙල් එක්කර සිහින්ව කපාගත් ඉඟුරු, සුදුලූනු දමා රන්වන් පැහැ වනතුරු බැදගන්න.
- ඉන්පසු එයට බිත්තර එකතු කර කැරට්ද එකතු කර කලවම් කරගන්න.
- පසුව තම්බාගත් නූඩිල්ස් දමා අවශ්‍ය පමණට ලුණු, ගම්මිරිස් කුඩු, සීනි ද දමා කලවම් කරගන්න.
- ඉන්පසුව බැදගත් ඉස්සන්, දැල්ලන් හා කුකුල් මස් ඊට එකතු කර ලූනු කොළ දමා හොඳින් කලවම් කර කෑම මේසයට යවන්න.



වෙජිටබල් සැලඩ්

අවශ්‍ය ද්‍රව්‍ය

- කොළ පිපිඤ්ඤා ගෙඩි 1
- බී ලූනු ගෙඩි 1
- අමුම්රිස් කරල් 2
- ලුණු කුඩු අවශ්‍ය පමණට
- කැරට් පොඩි ගෙඩි 1
- කොත්තමල්ලි කොළ ග්‍රෑම් 20
- ගම්මිරිස් කුඩු ස්වල්පයක්
- යෝගට් 1

සාදන ක්‍රමය

- කැරට්, බී ලූනු ගෙඩිවල පොතු ඉවත් කර හොඳින් සෝදාගන්න.
- එසේ සෝදාගත් කැරට්, බී ලූනු, පිපිඤ්ඤා කුඩා කොටු හැඩයට කපාගන්න.
- අනතුරුව කොත්තමල්ලි කොළ ටික සිහින්ව කපා අමුම්රිස් කරල් දෙකද කුඩාවට කපාගන්න.
- දැන් කොටු කපාගත් එළවලු ටික බෝල් එකකට දමා ලුණු කුඩු, ගම්මිරිස් කුඩු රස අනුව එක්කර එයට අමුම්රිස් ටික දමා හොඳින් කලවම් කර යෝගට් එක දමා කලවම් කරන්න.
- මෙම සලාදය පිළිගන්වන භාජනයට දමා ඒ මතට කොත්තමල්ලි කොළ ටික විසිරී යන ආකාරයට දමා පිළිගන්වන්න.

ෆෘට් කේක්

අවශ්‍ය ද්‍රව්‍ය

- රේසින්ස් ග්‍රෑම් 400
- බ්ලැක් කරන්ට් ග්‍රෑම් 400
- වියළි මිදි ග්‍රෑම් 400
- කජු ග්‍රෑම් 200
- ඉඟුරු දෝසි ග්‍රෑම් 200
- කැන්ඩිඩ් පීල්ස් ග්‍රෑම් 200
- පුහුල් දෝසි ග්‍රෑම් 200
- චෙරි ග්‍රෑම් 200
- ග්ලේස් චෙරීස් ග්‍රෑම් 200
- රෝස් එසන්ස් තේ හැඳි 2
- ආමන්ඩ් එසන්ස් තේ හැඳි 2
- වැනිලා තේ හැඳි 3
- තලාගත් කරදමුංගු, කරාබුනැටි, සාදික්කා තේ හැඳි 3ක් පමණ (ස්පයිසස් මිශ්‍රණය)
- රම් මිලිලීටර් 100
- මික්ස් ෆෘට් ජෑම් මේස හැඳි 4
- ගෝල්ඩන් සිරප් මේස හැඳි 4
- මී පැණි මේස හැඳි 4
- දෙඩම් ගෙඩි 1ක සහ දෙහි ගෙඩි 1ක ලෙලි

කේක් මිශ්‍රණය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය

- පිටි ග්‍රෑම් 250
- බටර් ග්‍රෑම් 250
- දුඹුරු සීනි ග්‍රෑම් 100
- බිත්තර 5
- ස්පයිසස් පවුඩර් තේ හැඳි 2

සාදන ක්‍රමය

- පලතුරු හා දෝසි වර්ග හොඳින් කුඩා කැබලිවලට කපාගන්න.
- කජු කුඩාම කැබලිවලට කපාගන්න.
- දෙඩම් සහ දෙහි ලෙලි ටික ග්‍රේට් කරගන්න.
- ජෑම්, මී පැණි, ගෝල්ඩන් සිරප්, රම්, වැනිලා, ආමන්ඩ් එසන්ස්, ස්පයිසස් පවුඩර්වලින් කොටසක් කපාගත් පලතුරු මිශ්‍රණයට දමා හොඳින් කලවම් කරන්න.
  මෙම මිශ්‍රණය පැය 24ක් වසා තබන්න.

කේක් මිශ්‍රණය සාදාගැනීම සඳහා

- දැන් බටර් සහ දුඹුරු සීනි දමා බිත්තර එකින් එක දමා බීට් කර හලාගත් පිටි, ස්පයිසස් පවුඩර්ද ඊට එකතු කර හොඳින් බීට් කරන්න.
- මෙසේ සාදාගත් කේක් මිශ්‍රණය පලතුරු මිශ්‍රණයට කලවම් කරන්න.
- දැන් තැටියකට තෙල් කඩදාසියක් දමා අඟලක උස ප්‍රමාණයට බැටර් එක දමාගන්න.
  සෙල්සියස් අංශක 130 පැය 2යි විනාඩි 15ක් පමණ බේක් කරගන්න.

ඩබ්ලිව්. එම්. ආර්. ඉදුනිල් වීරසේකර
ආපනශාලා ප්‍රධාන සූපවේදී
ආගමන විගමන දෙපාර්තමේන්තුව
බත්තරමුල්ල

වසන්ති නානායක්කාර

ආර්ථික අර්බුද මැදත් වසන්තය උදා කරගන්න හැටි වසන්ති කියයි

බුද්ධ කාලේ හිටියා ජීවක කියලා බොහොම දක්ෂ වෙදැදුරෙක්. සාකේත නුවර සිටුතුමාගේ දේවිය කාලයක ඉඳලා සුව නොවන හිසේ රුදාවකින් පීඩා විඳිනවා කියලා මේ ජීවක වෛද්‍යතුමාට දැනගන්න ලැබුණා. ඉතින් තමන්ට දේවියගේ රෝගය සුව කරන්න පුළුවන් කියන විශ්වාසෙන් ඔහු සිටු මාලිගයට ගියා.

පස්සේ දේවියව පරීක්ෂා කරලා බලලා ප්‍රතිකාරවලට ගිතෙල් ස්වල්පයක් ඉල්ලාගත්තා. ප්‍රතිකාර කරන අතරතුරේ ජීවක අතින් ගිතෙල් ස්වල්පයක් බිමට හැලුණා. ඒක දැකපු සිටු දේවිය පුළුන් කෑල්ලකින් ගිතෙල් ටික අරන් තියන්න සේවිකාවකට නියම කළාලු. ඉතින් එවෙලේ මේ සිදුවීම දැකපු ජීවක හිතුවේ සිටුතුමිය මහ මසුරු ලෝභ තැනැත්තියක් කියලයි.

කොහොමින් කොහොමහරි ප්‍රතිකාර නිසා දේවිය සුව වුණා. ඒ වගේම වෙදතුමා තමන් ගැන සිතපු විදිය ගැනත් ඈට නොතේරුණා නෙවෙයි.

"බිම වැටුණු තෙල් අරන් තියන්න උපදෙස් දුන් නිසා මම ලෝභී අයෙක් කියලා හිතුවා නේද? අපි වගේ සමහර කාන්තාවන් සම්පත්වල ආරක්ෂාව ගැන නිතර හිතනවා. අනවශ්‍ය ලෙස සම්පත් භාවිතා කිරීමෙන් ඒවා නාස්ති වෙලා යනවා දකින්න අපි අකමැතියි. ඒ ඇරත් මේ ගිතෙලින් ගන්න පුළුවන් ප්‍රයෝජන බොහෝමයක් තියෙනවා" තමන්ගේ අරපිරිමැස්ම ගැන සිටු දේවිය පැහැදිලි කළා.

ඉස්සර කාලේ ජීවත්වෙච්චි බොහෝදෙනා ඔය සිටුදේවිය වගේ හරි අරපිරිමැස්මයිලු. හැබැයි දැන් කාලේ කාන්තාවන්ගෙ නම් ඒ ගුණය ටිකක් අඩු බව අකමැත්තෙන් වුණත් අපිට පිළිගන්න වෙනවා.

හැබැයි ඔය අතරේ සාකේත නුවර සිටුදේවිය වගේ කාන්තාවොත් නැතිවම නෙමෙයි. දෙරණ මාධ්‍ය ජාලයේ සාමාන්‍යාධිකාරී, ජ්‍යේෂ්ඨ මාධ්‍යවේදිනී වසන්ති නානායක්කාරත් එහෙම කාන්තාවක් බවයි අපි අහලා තියෙන්නේ. ඉතින් මේ වගේ හැමෝටම අමාරු කාලෙක ඇගේ ගෙදර කුස්සියේ ආර්ථිකය සමබර කරගන්න හැටි දැනගන්න අපි ඇයට කතා කළා.

"ලෙඩක් හැදිලා බෙහෙත් කරන්න කලින් ඒක හැදෙන එක නතර කරගන්න කියලා කතාවක් තියෙනවනේ. හැබැයි අපේ ගොඩක් අය කරන්නේ මුලින් පරිස්සම් නොවී පස්සේ බෙහෙත් හොයන එක. ඒවගේ තමයි අරපිරිමැස්ම, පරිස්සම වගේ දේවල් කතා කරන්නත් අපිට ප්‍රශ්නයක් වුන්නම ඕනේ. හැබැයි මම එහෙම නෙවෙයි. අපේ අම්මයි, තාත්තයි පුංචි කාලෙදිම අපිට අරපිරිමැස්ම හුරුකළා. ඉතින් විවාහ වුණු දවසේ ඉඳලා මම හරි සකසුරුවම් ගෘහනියක්. ඒ නිසා සමහර පොඩි පොඩි වෙනස්කම් ඇරෙන්න ආර්ථික අර්බුදේ කියලා අමුතුවෙන් මහ වෙනස්කම් කරන්න මට ඕන වුණේ නැහැ.

ඉස්සර මම පාවිච්චි කළේ ගෑස් ලිප විතරයි. ගෑස් ප්‍රශ්නේ කාලෙදි ගෑස් පෝලිම්වල ඉන්න අපිට කාලය තිබුණේ නැහැ. ගෑස් පිරිමහගන්න අපි පොල්කටු අඟුරු ලිපට හුරුවුණා. දැනුත් ගොඩක් වෙලාවට උයන්නේ ඒකෙන්. ඒක නිසා ඉස්සර මාස 4න් ඉවරවුණු ගෑස් සිලින්ඩරය මාස හතක් පාවිච්චි කරන්න පුළුවන්.

ඉස්සර ඉඳලම ගෙදර කරන්ට් එකත් හරියට පිරිමහනවා. සති දෙකකට සැරයක් වොෂින් මැෂින් එකේ රෙදි සෝදනවා. පුංචි පුංචි ඇඳුම් එකතු නොකර එදිනෙදා සෝදගන්නවා. ගොඩක් අය රෙදි සෝදනකොට වොෂින් මැෂින් එකට සබන් කුඩු හැඳි හතර පහක් දානවා. එහෙම කළාම සබන් කුඩු ටිකත් නාස්ති වෙනවා. ඒ සබන් සෝදන්න වැඩිපුර වතුරත් යනවා. ඒ වගේ දේවල් ගැන ලොකුවට හිතන්න පුළුවන් නම් නාස්ති ගොඩක් අවම කරගන්න පුළුවන්.

දරුවට අසනීප නිසා රැකියා සම්බන්ධයෙන් මහත්තයටයි මටයි තීරණයක් ගන්න වුණා. මගේ රැකියාවෙන් මට වගේම දරුවටත් ලැබෙන ප්‍රතිලාභ වැඩියි. ඒ නිසා දුව වෙනුවෙන් රැකියාව කැප කරන්න ඔහු කැමති වුණා. ඉතින් ගෙදර වියදම් බලාගන්නේ මම. මට ලැබෙන්නේ මාසික වේතනයක්.

මුදල් වියදම් කරද්දි අවශ්‍ය දේවල්, අත්‍යවශ්‍ය දේවල්, අනවශ්‍ය දේවල් කියලා කොටස් තුනකට බෙදගෙන තියෙනවා. ලයිට් බිල්, බෙහෙත්, ගෑස් වගේ දේවල් අත්‍යවශ්‍ය දේවල් නිසා ඒවට මුලින්ම මුදල් ඉවත් කරනවා.

ගෙදරට ගන්න කළමනාත් කොටස් හතරකට වෙන් කරගෙනයි තියෙන්නේ. සිල්ලර බඩු, එළවලු/පලතුරු/පළා, සබන්, ෂැම්පු වගේ දේවල්, දුවට අවශ්‍ය දේවල්. ඒ දේවල් ගන්න විදියත් කියන්නම්.

කරපිංචා, මිරිස්, තෙබු, පැෂන්, කංකුං, ගොටුකොළ වගේ දේවල් වත්තේ හිටවගත්තා. ඉතින් ඒ ටිකට සල්ලි යන්නේ නැහැ. මේ ළඟදි මම තව වැඩක් පටන්ගත්තා. කොවිඩ් කාලේ දෙරණෙන් කාබනික පොහොරවලින් වගා කරන ප්‍රෝග්‍රැම් එකක් පටන්ගත්තා. ඕක කරගෙන යද්දි 'රසායනික පොහොර නැතිව වගා කරන්න බැහැ, ටීවී චැනල්වලින් බයිලා ගහනවා' කියලා සමහරු කිව්වා. ඒක බොරුවක් නොවන බව පෙන්වන්න මාත් පෞද්ගලිකව වගා කරන්න හිතුවා. ලක්මිණී කියලා මම දන්න නංගි කෙනෙක් ඉන්නවා අල්ගම පැත්තේ. ඒක හරි සරුවට වැවෙන ගමක්. එහේ අක්කරේක ඉඩමක් අරන් කෙසෙල්, බතල, එළබටු, වම්බටු හිටවන්න ගත්තා. දවස් කීපයකට සැරයක් එහේ යනවා. මේ ළඟදිත් ගිහින් පැෂන් වැල් හිටවලා ආවා. ටික කාලෙකින් ඒවගේ පලදෙවත් ලැබෙයි. එතකොට ඒ අවශ්‍ය ටික ගෙදරට අරගෙන ඉතිරිවයින් ආදායමක් ලබාගන්නත් පුළුවන්.

කොහේ හරි ගම් පළාතකට ගියොත් එහේ තියෙන කොස්, දෙල් ඉල්ලගන්නවා. ඒකට මම ලැජ්ජා නැහැ. මේ වෙලාවේ අපි කාටත් ඔය පුහු මාන්නය බිමින් තියන්න වෙනවා.

ගෙදර අයට හරියන්න මාසෙකට සැරයක් සිල්ලර බඩු, සබන් බඩු ටික ගේනවා. මිරිස්, තුනපහ වගේ දේවල් මාසෙටම පරිස්සම් කරනවා. නොකා නොබී ඉඳලා එහෙම නෙමෙයි අවශ්‍ය ප්‍රමාණවලින් දාලා.

මිදි, දෙඩම්, ඇපල් වගේ පලතුරු ගේන්නේ නැහැ. ඒ වෙනුවට දේශීය පලතුරු වැඩිපුර කනවා. දවස් කිහිපයකට සැරයක් එළවලු, පලතුරු ගන්නවා. ඒවා ගන්නකොට ලොකු ලොකු සුපර් මාකට්වලින්ම ගන්න ඕන නැහැ. පාර අයින්වල ගෙවල්වලින් කඩාපු අලුත් එළවලු, පලතුරු බොහොම අඩුවට තියෙනවා. අනික බොහොම ඉස්තරම් ඒවගෙන් තෝරගන්නත් පුළුවන්.

ඒ විතරක් නෙමෙයි බිස්කට්, පැණි බීම, චොක්ලට් වගේ දේවලුත් අපි ගේන්නෙම නැහැ. පිටරටින් තොග පිටින් එන විෂ කෑමවලට වඩා අඩු මිලට හොයාගන්න පුළුවන් අපේ කෑම කොයිතරම් නම් තියෙනවද?

සති තුනකට සැරයක් මාළු මාකට් ගිහිල්ලා මාළු ගෙනැල්ලා සුද්ද කරලා ෆ්‍රීජ් එකේ දාලා තියනවා. ඒක හරි පහසුයි. ගාණත් අඩුයි.

ඒ වගේම ආහාර ආදේශක පාවිච්චි කරන්න අපිට පුළුවන්. මස් 100gක ගුණ කොස් ඇට කිහිපයක තියෙනවා. දැන් හිතන්නකෝ වෙනදා පරිප්පු කිලෝ හතරක් ගිය ගෙදරක් නම් පරිප්පු කිලෝ දෙකක් ගන්න. පරිප්පුවලට කංකුන්, අලකොළ, තම්පලා, සාරණ එකතු කරලා තෙම්පරාදු කරලා හොද්දක් හදාගන්න. ඒකත් එක්ක යහමින් බත් කන්නත් පුළුවන්. පරිප්පුත් ඉතිරියි.

මම දැන් පිට ගෙදරකට ගියත් බිස්කට්, කේක් වගේ දේ අරගෙන යන්නේ නැහැ. සීනි පැකට් එකක්, තේ, පොල් ටිකක් අරන් යනවා. මේ වෙලාවේ බිස්කට්, කේක් වැඩක් තියෙන්නේ කාටද? ඒ වගේම කොහේ හරි ගම් පළාතකට ගියොත් එහේ තියෙන කොස්, දෙල් ඉල්ලගන්නවා. ඒකට මම ලැජ්ජා නැහැ. මේ වෙලාවේ අපි කාටත් ඔය පුහු මාන්නය බිමින් තියන්න වෙනවා.

ඉස්සර අපේ අම්මලා, අත්තම්මලා පැන්සල් ඇඟලක් තරමට ඉතිරි වුණහම ඒකට උණ බට කෑලි හයි කරලා පාවිච්චි කරනවලු. මේ වෙලාවේ ඒ තරම් සකසුරුවම් වෙන්න ඕන වෙලාවක් කියලයි මට හිතෙන්නේ. ඒ නිසා මම අනවශ්‍ය දේවල් ගන්නේම නැතිතරම්. ඒකට ගෑනු අපිටත් යම් යම් කැපකිරීම් කරන්න වෙනවා.

ගොඩක් කාන්තාවන්ට ඇඳුම් පැළඳුම්වලට මාසිකව ලොකු වියදමක් යනවා. ඇත්තටම මම නම් ඉස්සර ඉඳලම ඇඳුම් ගන්නේ බොහොම අඩුවෙන්. ඇඟේ හැඩය වෙනස් වෙලා ඉවත් කළොත් ඇරෙන්න මම ඇඳුම් අයින් කරනවා අඩුයි. මීට අවුරුදු දහයකට කලින් ගත්ත ඇඳුම් එහෙමත් තවම අඳිනවා.

මට සපත්තු කුට්ටම් තුනක් තියෙනවා. ඒ තුන මට ඇති. මේකප් බඩුත් ලොකුවට පාවිච්චි කරන්නේ නැහැ. හොඳ ප්‍රමිතියේ ලිප්ස්ටික් දෙකක් අරගන්නවා. ඒ දෙක අවුරුදු කීපයක් ගාන්න පුළුවන්. පර්ෆියුම් එකක් අරන් ඒක ඉවර වුණාම තව එකක් ගන්නවා. මම දැන් පාවිච්චි කරන හෑන්ඩ්බෑග් එකට අවුරුද්දයි. ඒකත් මට තෑග්ගකට ලැබුණු එකක්.

හැබැයි අපේ ගොඩක් අයට කෘත්‍රිම ආහරණ, ඇඳුමේ පාටට කියුටෙක්ස්, ලිප්ස්ටික්, හෑන්ඩ් බෑග් නැතුවම බැහැනේ. එහෙම නෙමෙයි, මේ වෙලාවේ අපි ටිකක් සකසුරුවම් වෙමු. වෙඩින් එකකට ගියත් තනියම පුංචි මේකප් එකක් දාගන්න බලන්න. වෙලාව තියෙනවා නම් රෙදි අරන් තමන්ගේ ඇඳුම් මහගන්න බලන්න. දන්නේ නැත්නම් ඒවා ඉගෙනගන්න. ඒවගෙන් අපේ කාලය වගේම සල්ලිත් ඉතිරි වෙනවා කියන එකයි කියන්න ඕනේ."

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

අහිංසක බඩුවකට ෆොටෝ මැන් පදයක් හදලා



පුවත්පත් ආයතනවල සේවය කරන ස්ථිර සේවයේ නියුතු ඡායාරූප ශිල්පීන්ට අමතරව අවස්ථානෝචිතව බාහිරින් සේවයට චක්කරගනු ලබන ඡායාරූප ශිල්පීහුද වෙති. ඔවුන් අතරේ සිටි චක්තරා සුවිශේෂී චරිතයක් මේ මොහොතේ මගේ මතකයට නැගෙයි. මීට කලෙකට ඉහත ජාඇලට නොදුරුව කුඩා ඡායාරූපාගාරයක් පවත්වාගෙන ගිය ඔහු පසුකලෙක එය වසා දමා ඉඩම් සහ වාහන බ්‍රෝකර් වැඩවල යෙදුණි. ඉන්පසුව මඟුල් කපුකම් කළ බවක්ද මතකය. ඒ කෙසේ හෝ ඡායාරූපකරණය සම්බන්ධයෙන් පැවති හැකියාව මෙන් දස ගුණයක කූඨ හැකියාවන්ගෙන් සපිරි ඔහු 'මනෝ' යනුවෙන් හඳුන්වමු.

මීට මද කලෙකට පෙර මනෝ තමන් සේවය කළ පුවත්පතේ මාධ්‍යවේදිනියක සමඟ දිවුලපිටිය ප්‍රදේශයේ පැරණි වලව්වක් බඳු නිවෙසකට ගියේ එම ගෙහිමියන්ගෙන් මාධ්‍යයට අවශ්‍ය කුමක් හෝ කරුණු ටිකක් ගොනුකර ගැනීමටය. මනෝගේ වයසින් අඩක් පමණ වූ එම මාධ්‍යවේදිනිය තමන් මෙන් ඇට්ටකුණා වී නොමැති බව මනෝ දැන සිටියේය.

එම පැරණි නිවස අනේකවිධ පිත්තල භාණ්ඩ ඇතුළු නොයෙකුත් කෞතුක වස්තූන්ගෙන් පිරී පැවතුණු තැනක් විය. සාමාන්‍යයෙන් කිසියම් තැනකට ගිය විටෙක හෝ මඟතොටදී යමෙකු මුණගැසුනු විට ඒ තැනැත්තා සමඟ අන්තයටම කුළුපහ වීමේ කලාව මනෝ උස්මුරුත්තාවටම දනී. ඒ අනුව තමන් ගිය කරුණට අමතරව එම ගෙහිමියන් සමඟ ඕනෑවටත් වඩා සුහද වූ මනෝ එම නිවසේ සාලය මැදට වන්නට තිබූ පිත්තල පහනක් වටා කැරකෙමින් ඒ දෙස මහත් සුපරීක්ෂාකාරීව බලන්නට විය. ඔහුගේ හැසිරීම් රටාව සහෘද මාධ්‍යවේදිනියගේ සේම ගෙහිමියන්ගේද විශේෂ අවධානයට යොමුව තිබිණි.

"ඇයි මොකද ඔය පහනේ මොකක්හරි ප්‍රශ්නයක් තියෙනවද? ඕක මීට අවුරුදු පනහකට විතර කලින් අපේ මුත්තා දේවාලෙකින් ගත්තු එකක්ලු." මනෝගේ සුපරීක්ෂාකාරී බව දුටු ඒ ගෙහිමියා කීය.

"ඒක තමයි මාත් මේ බැලුවේ මේ වගේ එකක් ගෙදරකට ආවේ කොහොමද කියලා." මනෝ කීයේ එම පහන මුදුනේ ඇති කුකුළු රූපයේ කරමල් සහ පියාපත් පිරික්සමිනි. ඊළඟට ඔහු එම පහනේ මාල කිහිපයක් වශයෙන් ඇති වැට්ද ගණන් කරන්නට විය.

"මම දන්න විදියට නම් මේ වගේ පහන් ගෙවල්වල තියාගන්නේ නෑ. හැබැයි ඔබතුමන්ලා කැමති නම් මේකේ පින්තූරයක් අරන් මට අපේ ගුරුතුමාගෙන් අහන්න පුළුවන්." තවදුරටත් මද කල්පනාවක යෙදුණු මනෝ කීය.

"මේ වගේ පහනක් ගෙදරක තිබුණම මොකද වෙන්නේ?" මනෝගේ කතාවෙන් අන්දමන්ද වූ ගෙහිමියා ඇසීය. "මම එහෙම හැමදෙයක්ම කියන එක හරි නෑ. ඒත් මම හිතන්නේ මේ ගෙදරට පවුලට බලාපොරොත්තු වුණු දියුණුව නම් අත්වෙන්න නැතුව ඇති?" මනෝ කීයේ යන්තම් හඬ නගමිනි.

"ඒක නම් සම්පූර්ණ ඇත්ත." එම නිවසේ ගෘහණිය වහා ඉදිරියට පැන කීවාය. පසුව මාධ්‍යවේදිනිය එහි ගිය කාර්ය සිදුකරන අතරේ මනෝ තමන්ගේ මෙම ගුප්ත විමර්ශන කාර්ය දිගටම කරගෙන යනු පෙනිණ.

"ඉතින් අපි කොහොමද දැනගන්නේ මේ පහන හින්දෑ ගෙදරට හරි අපිට හරි දෝෂයක් තියෙනවද කියලා?" එම මාධ්‍යවේදිනිය සමඟ මනෝ ආපසු එන්නට සැරසෙද්දී ගෙහිමියෝ ඇසූහ.

"ඒකට ඒ තරම් කලබල වෙන්න එපා. කෝකටත් මට දවස් දෙක තුනකින් කෝල් එකක් දෙන්නකෝ. මම අපේ ගුරුතුමාට ඒ පින්තූරේ පෙන්නලා හරිම විස්තරේ කියන්නම්. අපේ ගුරුතුමාට ඔය වගේ දේවල් ගැන පුදුම දැනුමක් තියෙන්නේ." මනෝ කීය.

කෙසේ හෝ එම මාධ්‍යවේදිනිය දිවුලපිටිය ප්‍රදේශය මුල්කොට සිදුකරන ලද තොරතුරු සම්පාදනය එතරම් සාර්ථක නොවීම මත එම පුවත්පතේ විශේෂාංග කර්තෘගේ දැඩි දෝෂාරෝපණයක් ඇය වෙත එල්ල විය. ඒ සම්බන්ධයෙන් නිදහසට කරුණු වශයෙන් තමන් ගිය දිවුලපිටිය නිවසේදී මනෝ කී දේ සහ ඔහු හැසිරුණු අන්දම හා ඉන් තමන්ට වුණු බාධාව ඇය විශේෂාංග කර්තෘවරයාට අකුරක් නෑර හෙළි කළාය. එවිට විශේෂාංග කර්තෘගේ මුහුණේ පැවති නොපහන් බව වෙනුවට ඊට මහත් විමසුම් සහගත බවක් ආරෝපණය විනි.

"මට ඒ ගෙදර මිනිස්සුන්ගේ ෆෝන් නම්බර් ටික දෙන්න. මං ඉතුරු හරිය බලාගන්නම්."

විශේෂාංග කර්තෘ සන්සුන් ලෙස කීය.

සාමාන්‍යයෙන් එවන් බාහිර ඡායාරූප ශිල්පීන් පුවත්පත්වල සේවයට කැඳවාගනු ලබන්නේ සේවා අවශ්‍යතා මත පමණි.

මට ඒ ගෙදර මිනිස්සුන්ගේ ෆෝන් නම්බර් ටික දෙන්න. මං ඉතුරු හරිය බලාගන්නම්

එහෙත් එම දිවුලපිටි ගමනින් සතියකට හමාරකට පසු මනෝගේ සේවය අත්හිටුවා ඔහුට එම මාධ්‍ය ආයතනයට පිවිසීම පවා තහනම් කරන ලදි. ඒ බව දැනගත් මාධ්‍යවේදීන් ඒ පිළිබඳව මනෝගෙන් විමසූ විට ඔහු ඒ සැමට කියා ඇත්තේ "අර මාත් එක්ක ගිය කෙල්ල මං ගැන ලොක්කන්ට කේලම් කියලා. ඒකි මහ ගිනි බෝම්බයක්, ඔය හතරමායිමකවත් තියාගන්න එපා" යනුවෙනි. ඒ කෙසේ හෝ මනෝ කී එම කතාව මාධ්‍යවේදිනියටද අසන්නට ලැබුණු අතර ඇය හඬාගෙන ගොස් මනෝගේ එම අභූත චෝදනාව පිළිබඳව විශේෂාංග කර්තෘ වෙත සේම ප්‍රධාන කර්තෘ වෙතද සැලකොට හිඳින ලදි.

එතෙක් මනෝගේ සේවය අත්හිටුවීමට හේතුව කිසිවකුත් නොදැන සිටි අතර ඔහුගේ 'බළලා මල්ලෙන් එළියට පැන්නේ' එම මාධ්‍යවේදිනියට කළ චෝදනාවත් සමඟිනි.

ඇගේ කීම අනුව දිවුලපිටියේ එම නිවස වෙත දුරකතන ඇමතුමක් දුන් විශේෂාංග කර්තෘ, මනෝ විසින් එම නිවසේ සිදුකරන ලද සීතල මංකොල්ලය පිළිබඳ තොරතුරු රැසක් අනාවරණය කරගෙන තිබිණි. එම නිවැසියන් කියා සිටි අන්දමට ඊට පසු දින ඔවුන් මනෝ වෙත ලබාදුන් දුරකතන ඇමතුමට අනුව මනෝ තම ගුරුතුමා වශයෙන් හඳුන්වාගත් පුද්ගලයෙකුද සමඟ එම නිවසට ගොස් තිබේ. එහිදී ඒ පුද්ගලයා විසින් එම නිවසේ තිබූ පිත්තල සහ කෞතුක භාණ්ඩවලින් සැලකිය යුතු කොටසක් අසුබ පල ගෙනදෙන ඒවා ලෙස නම්කොට ඇත.

"පස්සේ කොහොමහරි ඒ කියන බඩු කීයකට හරි කමක් නෑ ඉක්මනට විකුනන්න කියලා එයාලා දන්න මුස්ලිම් මුදලාලි කෙනෙක් ඒ ගෙදරට යවලා ඒවා කුණුකොල්ලෙට අරගෙන. නමුත් අපේ මිනිහා ඒ වගේ වංචාවක් කළා කියලා අදටත් ඒ ගෙදර මිනිස්සු පිළිගන්නේ නෑ. එයාලා හිතන්නේ අපේ මිනිහා ඒ ගෙදරට ආවේ පූරුවේ වාසනාවකට කියලා." පසුව මනෝගේ එම උප්පරවැට්ටිය පිළිබඳව එම ආයතනයේ කාර්ය මණ්ඩලය දැනුවත් කළ ප්‍රධාන කර්තෘවරයා කියාසිටියේ මනෝ එල්ල කළ අභූත චෝදනාවෙන් එම මාධ්‍යවේදිනිය නිදෙස්කොට නිදහස් කරමිනි. එමෙන්ම එම ආයතනයේ සෙසු පිරිස කී අන්දමට පසුව මනෝ එම භාණ්ඩ තොගය කුණුකොල්ලයට ගත් ව්‍යාපාරිකයාද ඒ අයුරින්ම කොල්ලකන්නට ඇත. ඒ කෙසේ හෝ අප රටේ බහුරූපී මෙවන් විවිධාකාර වංචාවන්ට නතුවීමට තමන් තුළ පවතින මිථ්‍යා විශ්වාසද හේතුවන බව කිව යුතුමය.

මාධ්‍යවේදී
තිලක් සේනාසිංහ

Astra ගෙදර හදමු නත්තල් රස

ඇස්ට්‍රා සමඟ නත්තල වෙනුවෙන් රසවත් සහ පහසු කෑම වට්ටෝරු

නත්තල වෙනුවෙන් ඇස්ට්‍රාස්කොච් පුඩිං

අවශ්‍ය ද්‍රව්‍ය

ඇස්ට්‍රා	ග්‍රෑම් 63
කෝන්ෆ්ලා	ග්‍රෑම් 30
රතු සීනි	ග්‍රෑම් 100
කිරි	මි.ලීටර් 473
වැනිලා	මි.ලීටර් 5

සාදන ක්‍රමය

- කිරි හා කෝන්ෆ්ලා හොඳින් මිශ්‍ර කර ගන්න
- සීනි භාජනයකට දමා ලිප තබා කැරමල් කර ගන්න
- සීනි හොඳින් දිය වූ පසු ඇස්ට්‍රා එකතු කර මිශ්‍ර කර ගන්න
- කිරි සමඟ දිය කර ගත් කෝන්ෆ්ලා මිශ්‍රණය එකතු කර අඩු ගින්දරේ හැදි ගාමින් උකු මිශ්‍රණයක් සාදා ගන්න
- අවසානයට වැනිලා එක්කර හොඳින් මිශ්‍ර කර පිළිගන්වන බඳුන් වලට දමා ශීතකරණයේ විනාඩි 30 තබා සිසිල් කර සරසා රස බලන්න

ඇස්ට්‍රා සමඟ ක්ලබ් සැන්ඩ්විච්

අවශ්‍ය ද්‍රව්‍ය

පාන් පෙති	6
ඇස්ට්‍රා	ග්‍රෑම් 100
තම්බාගත් කුකුල් මස්	ග්‍රෑම් 20
බිත්තර ඔම්ලට්	1
සළාද කොළ	10
ලොකු තක්කාලි පෙති	2
අඹ පේස්ට්	තේ හැඳි 1
රස කිරීමට ගම්මිරිස්	
රඳවා ගැනීමට ටූත් පික්ස් කිහිපයක්	

සාදන ක්‍රමය

- මුලින්ම බඳුනකට ඇස්ට්‍රා, අඹ පේස්ට්, ගම්මිරිස් හා කුකුල් මස් මිශ්‍ර කර පෙති මත මිශ්‍රණය තවරා පැත්තකින් තබා ගන්න
- දෙවෙනි පාන් පෙත්ත මත ඔම්ලට්, තක්කාලි සහ ගම්මිරිස් තට්ටුවක් අතුරා ගන්න
- පාන් පෙති එක මත එක අතුරා අවසන් පාන් පෙත්ත උඩින් තබා ගෙන අවසන් කරගන්න
- ක්ලබ් සැන්ඩ්විච් එකේ කොන් කපා ටූත්පික් මගින් රඳවා ගන්න
- කොටු හතරකට කපා පිළිගන්වන්න

තවත් රසවත් කෑම වට්ටෝරු සහ විස්තර සඳහා AstraSriLanka වෙත පිවිසෙන්න.

අත්තනායක
එම්. හේරත්

විහාරමහාදේවි වගේ ඇට්ටර ගැහුණු දුවලා අදත් ඉන්නවා

රත්තරන් දුවේ

කාලෙකට උඩදි වසන්ත දුක්ගන්නාරාලත්, මමත්, රෝහණ බැද්දගේ මහත්මයත් විසින් මෙහෙයවපු දේශන මාලාවක් අපි ගමින් ගමට ගෙනිච්චා. මම සාහිත්‍ය ගැන කතාකරනකොට දුකා සමාජ මානව විද්‍යාව ගැන කතා කළා. රෝහණ බැද්දගේ මහත්තයා ගීතය පිළිබඳව කතා කළා.

එක දවසක් එහෙම වැඩසටහනකට අපි ගියා ඇඹිලිපිටියට. දුකාගෙයි, බැද්දගේ මහත්තයගෙයි කතාවලින් පස්සේ කතා කරන්න තිබුණේ මට. අපේ දේශන සකස් කරලා තිබුණේ විභාගය ගැන කතා කරන්න නෙවෙයි ජීවිතය ගැන කතා කරන්න. ඉතින් එදා මම කතා කළේ දියණියකගේ දඩබ්බරකම් ගැන. මං ඒ සඳහා නොයෙක් උදාහරණ තෝරාගත්තා. එක උදාහරණයක් තමයි විහාරමහාදේවිය. හැබැයි හැමෝම දන්න දේ නෙවෙයි මම කතා කළේ. විහාරමහාදේවි ගැන අපේ ඉතිහාසය විසින් සඟවපු දේ ගැනයි මම කතා කළේ.

විහාරදේවියගේ අම්මයි තාත්තයි අතර පොඩි ගැටලුවක් තිබුණා. කැලණිතිස්ස රජ්ජුරුවෝ විහාරදේවිගේ අම්මට ගොඩක් ආදරෙයි. ඒ නිසාම එයා කවුරු දිහා බැලුවත් කැලණිතිස්ස රජ්ජුරුවන්ට සැකයි. දේවිට මේක මහ හිසරදයක්. ඇය කවදාවත් රජුට ද්‍රෝහිවෙච්ච කාන්තාවක් නෙවෙයි. ඒත් සැමියාගේ මේ මානසික අසහනය දේවිට දරාගන්න බැරි වුණා. කිසිම වැරැද්දක් නොකර විඳවන්න වීම ඇයට දරාගන්න බැරි වුණා. වරදක් නොකර බැණුම් අහන එක දේවියට විශාල පීඩනයක් වුණා. රජුට තිබුණෙ එක්තරා අන්දමක මානසික රෝගයක්. ඔහොම කල් ගතවෙද්දී දේවියගේ හිත ඉබේම රජුගේ සොහොයුරා පැත්තට හැරුණා. දේවියගෙයි මල්ලිගෙයි රහස් සබඳතාව අන්තිමට රජුට අහුවුණා. එහෙම දෙයක් වුණේ තමන්ගේ ආත්මාර්ථය නිසා කියලා මතක් වෙනකොටවත් රජුගේ කෝපය අඩුවුණේ නැහැ, වැඩි වුණා. ඔහු මල්ලි මරන්න හැදුවා. මල්ලි පැනලා ගියා. ඇත්තටම දුවේ ඒ සහෝදරයා රජුට වඩා දේවියට ආදරය කළා. ඉතින් පැනලා ගිය මල්ලිට ඕන වුණා දේවියට ලියුමක් ලියන්න. එයා ලියුමක් ලියලා එයාගේ යාළුවෙකුට බොරුවට සිවුරු පොරවලා රජ මාලිගය පැත්තට එව්වා.

කැලණිතිස්ස රජුට තිබුණා හැමදෙම එක්තරා හාමුදුරු නමකට දැනේ දෙන පුරුද්දක්. රජුගේ මල්ලි සිවුරු බොරුවට දරාගත් යාළුවට කිව්වා, උඹත් ඒ හාමුදුරුවෝ පස්සේ පලයන්. රජ්ජුරුවෝ හිතයි මේ හාමුදුරුවන්ගේ ගෝලයා කියලා, හාමුදුරුවෝ හිතයි අද රජ්ජුරුවෝ දැනෙට තව හාමුදුරු නමකට ආරාධනා කරලා කියලා. රජගෙයි ඇතුළෙදි සිවුරු පෙරවූ යාළුවා කලබලයේ ලියුම දේවිය පැත්තට විසි කරනකොට ඒක රජ්ජුරුවෝ ඇහිළගත්තා. රජ හිතුවේ මගේ බිසව ලොකු හාමුදුරුවෝ එක්ක යාළුයි, පොඩි නම එන්න ඇත්තේ ලියුම මට හොරෙන් දේවියට දෙන්න කියලා. රජ්ජුරුවෝ ඉස්සෙල්ලම කළේ නායක හාමුදුරුවෝ තෙල් කටාරමක දාලා පණ පිටින් පුච්චපු එක. ඒකෙන් පේනවා රජුගේ ඊර්ෂ්‍යාවේ තරම. දෙවනුව පොඩි හාමුදුරුවෝ කපලා කොටලා මූදට දැම්මා.

දැන් දුවේ මගේ මාතෘකාව වුණේ දඩබ්බර දියණියකගේ දඩබ්බරකම යහපත් ලෙස භාවිතයට ගැනීමනේ. ඉතින් එතන හිටපු දූලා පුතාලා බලාගෙන ඉන්නවා මං මේ මොකද කියන්න යන්නේ කියලා.

ඉතින් එදා මේ සිද්ධිය වෙන අතර හදිසි මුහුදු ගොඩගැලීමක් වෙලා තියෙනවා. ඒ වෙලාවේ විහාරදේවිය වියළි ආහාර තොගයක් බෝට්ටුවකට දගෙන මුහුදට ඇතුළු වෙනවා. විහාරදේවි දන්නවා තාත්තා, අම්මා දෙසම බලාගෙන ජීවත්වෙන කෙනෙක් කියලා. එහෙන් අම්මා බාප්පා එක්ක යාළුයි, දැන් නායක හාමුදුරුවෝ ගැන කතාවක්. මේකෙ ඇත්ත විහාරමහා දේවිය දන්නේ නැහැ. කවුරු හරිද කවුරු වැරදිද කියලා. ඇයට මේ දෙන්නම එපා වුණා. ඇය මුහුදට බිලිවුණාට වඩා ඇය මුහුදට බෝට්ටුවකින් ගමන් කළා යන අතක යන්න. ඇය බෝට්ටුවට කෑම දගත්තේ මුහුදට බිලිවෙන්න නෙමෙයි. ජීවිතේ තිත්ත වෙලා. නායක හාමුදුරුවෝ අපවත් කළා කියලා මුහුද ගොඩ ගැලුවානම් මුහුදට තිබුණේ තෙල් කටාරම ගිනි තියන වෙලාවේ ගොඩට ඇවිත් හාමුදුරුවෝ බේරගන්න. මුහුදු ගොඩගැලීමයි විහාරදේවිය මුහුදට එකතුවීමයි සිද්ධි දෙකක්.

හැබැයි ඇය බේරගන්න රජ්ජුරුවෝ කිසි දෙයක් කළේ නැහැ. ඇය දඩබ්බර ලෙස යන්නේ අම්මාත් තාත්තාත් එපාවෙලා කියලා රජ්ජුරුවෝ දන්නවා. කොහොමහරි හිතුවක්කාර දඩබ්බර විහාරදේවිය බෝට්ටුවට පාවෙන්න ඇරලා ඔහේ හිටියා. මාගම පෙදෙසට පාරුව එනකොට ඒ ආරංචිය කාවන්තිස්ස රජුට ආරංචි වුණා.

"සර් ඔකෙ මම ලියපුවා වගයක් තියෙනවා. ඒක කියවලා බලන්න. ඔය පොතේ අපේ අම්මගෙ දුරකතන අංකය තියෙනවා. බලලා ඉවරවෙලා සර් ඒකට කතා කරන්න." මං ඉතින් ඔය පොත ගෙනත් ටික දවසකට පස්සේ ඒක කියෙව්වා.

ඒ වනවිට කාවන්තිස්ස රජු විවාහවෙලයි හිටියේ. රජ්ජුරුවෝ ඇයව පාරුවෙන් ගොඩට අරගෙන විවාහ කරගත්තා. රජුට මේ විවාහයේ දේශපාලන පැත්තකුත් තිබුණා. ඇය රජ පවුලකට සම්බන්ධ වීම ඉන් එකක්. අනෙක ඇගේ හිතුවක්කාර දඩබ්බර ක්‍රියාව. ඔන්න ඔය විවාහයෙන් තමයි ලංකාව වෙනස් කරපු තවත් දඩබ්බර ඇට්ටරයෙක් ඉපදුණේ. ඒ ඇට්ටරකම ඔහුට ආවේ අම්මගෙන්. ඒ දඩබ්බර අම්මා නැත්නම් ගැමුණු එළාර රජුව පරද්දන්නේ නැහැ.

ඔය විදියට දුවේ මම දියණියකගේ දඩබ්බරකම රටක දේශපාලනය වෙනස් කරපු හැටි මං ඒ දරුවන්ට පහදලා දුන්නා.

ඉතින් අපි එදා ළමයින්ට පොතකුයි, පෑනකුයි තෑගි දීලා තිබුණෙ කැමති දෙයක් ලියන්න, ලියලා පොත අරගෙන යන්න කියලා. උත්සවය ඉවරවෙච්ච ගමන් එක දුවෙක් මගේ ළඟට ආවා. අර අපි දුන්න පොතම ඒ දුව මට දුන්නා. **"සර් ඔකෙ මම ලියපුවා වගයක් තියෙනවා. ඒක කියවලා බලන්න. ඔය පොතේ අපේ අම්මගෙ දුරකතන අංකය තියෙනවා. බලලා ඉවරවෙලා සර් ඒකට කතා කරන්න."** මං ඉතින් ඔය පොත ගෙනත් ටික දවසකට පස්සේ ඒක කියෙව්වා. ඒ පොත ඇතුළෙ මට දඩබ්බර දුවෙක් පේන්න ගත්තා. දර්ශනිකයෙකුගේ කල්පනා ඒ පොතේ තිබුණා.

"සර් කියපු දඩබ්බර ගති මටත් තියෙනවා. ඒකයි මං මේ පොත සර්ටම දෙන්නේ" කියල ඒකෙ ලියලා තිබුණා.

මම ඒ අම්මට කතා කළා. මගේ නම අහලා ඒ අම්මා පුදුම වුණා. ඊටපස්සේ දුව දුන්න පොතේ ලියපු දේවල් ගැන මං ඒ අම්මගෙන් ඇහුවා.

"ඔව් සර් අපේ දුව දඩබ්බරයි. හිතුවක්කාරයි. එයාගෙ අත එයාම කපාගන්නවා. කිසිම කෙනෙක් ගැන විශ්වාසයක් නැහැ. අපි එක්ක වුණත් ඒ තරම් ළඟ ඇසුරක් නැහැ. යාළුවොත් නැහැ. බැරිම තැන කරාපිටියට එක්කරගෙන ගිහිල්ලා දෙස්තර හරිස්චන්ද්‍ර මහත්තයට පෙන්නුවා. ඒ බෙහෙත් බිව්වම මෙයා එකදිගට නිදි."

"අම්මේ මං මාතර පැත්තේ යනකොට එන්නම් බලලා යන්න" කියලා එදා මම නිහඬ වුණා.

ඊට ටික කාලයකට පස්සෙ මං මාතර යන ගමන් ඒ දුව බලන්න ගෙදරට ගියා. මං එන ආරංචියට වටපිටාවේ ගොඩක් අය ඇවිත් හිටියා. මාව පිළිගන්න ඒ දුව බුලත් අතකුත් හදාගෙන බලන් හිටියා. ඒ දුවගේ ඇට්ටර දඩබ්බරකම මං අගය කළා. ඈ තුළත් විහාරදේවියක් ඉන්න බව මට වැටහුණා. මං දුවගේ ඔලුව අතගාලා එයාට සුබ පැතුවා. ඒ පැත්තෙන් යන එනකොට දුව බලන්න එන බව කියලා මං එදා ඒ ගෙදරින් නික්මුණා. එදා ඉඳලා ගෙදර අයත් එයා දිහා බැලුවෙ ගෞරවයකින්.

ඊටපස්සේ මම යන හැම දවසකම ඇය මං ආව වාර ගණන මතක් කරනවා. ඇයගෙ අම්මලට ඕන වුණේ ඇයව දෙස්තරවරියක් කරන්න. හැබැයි දුවගෙ ශරීරයේ ඊට වැඩිය හයියක් තිබුණා. සොබාදහම ඇය යා යුතු තැන තීරණය කළා. බෙහෙත් පෙතිවලට වඩා ඇයට සෙනෙහස අවශ්‍ය බව මං හැමෝටම තේරුම් කරලා දුන්නා. පෙති ටික නැවැත්තුවා. ඇය අවසානයට මං හිතපු තැනට ගියා. දුව අම්පාර හාඩි කාර්මික විද්‍යාලයට ඇතුළු වුණා. ආදරයකට පුළුවන් දුවේ බෙහෙත් පරාද කරන්න. දැන් ඇය අන්‍යයන්ගේ ගෞරවයට පාත්‍රවන චරිතයක්. මං ඇයට පියෙකු මෙන් සැලකුවා. නපුරුකම දඩබ්බරකම ඇගේ දුබලතාවක් නෙවෙයි. සමාජය ඇයට පැවරූ දෙයක්. ඒ සමාජයටම තමයි පුළුවන් ඒ දඩබ්බරකම හොඳ පැත්තට හරවන්න.

ඒ නිසා කියවන අම්මලාත් මේක වටහාගන්න. පුතාලගේ දඩබ්බරකම් සාධාරණීකරණය කරලා දුවලගේ දඩබ්බරකම් අපරාධයක් විදියට දකින්න එපා. දුවලා දඩබ්බර වෙනකොට සමහර අම්මලා කියනවා උඹව හදාගත්තට වඩා හොඳයි ගඟක මුහුදක දැම්මනම් කියලා. නැත්නම් තව කොල්ලෙක් හදාගත්තනම් හොඳයි කියලා. මතක තියාගන්න, ලෝකය වෙනස් කරලා තියෙන්නේ ඇට්ටරයෝ මිසක් කීකරු අයම නෙමෙයි. ඒක දුවලටත් පොදුයි.

අත්තනායක එම්. හේරත්

> **"සර් ඔකෙ මම ලියපුවා වගයක් තියෙනවා. ඒක කියවලා බලන්න. ඔය පොතේ අපේ අම්මගෙ දුරකතන අංකය තියෙනවා. බලලා ඉවරවෙලා සර් ඒකට කතා කරන්න." මං ඉතින් ඔය පොත ගෙනත් ටික දවසකට පස්සේ ඒක කියෙව්වා**

ඔටිසම් රෝගයෙන් පෙළෙනා දරුවනට සුහද ඇරයුමක්

Pain from sciatica radiates from the buttock down the leg and can travel as for as the feet and toes



ADAM

ලොවපුරා ඉතා ප්‍රචලිත ඔස්ටියෝපති බටහිර වෛද්‍ය ක්‍රමයෙන් කොඳුඇට පෙළ ආශ්‍රිත සියලු අස්ථි රෝග සන්ධි රෝග හා සියළුම ස්නායු රෝගද සුවකරනා ශ්‍රී ලංකාවේ ඇති විකම වෛද්‍ය මධ්‍යස්ථානය මාලඹේ පිහිටි ඔස්ටියෝපති වෛද්‍ය මධ්‍යස්ථානය බව දැන් ඔබ හොඳින්ම දන්නා කරුණකි. එහෙත් මෙවැනි විවිධ රෝගාබාධයන්ට ලක්වී සුවය ලබනා රෝගීන් පිළිබඳව සවිස්තරාත්මකව ඔබ දන්නේ කීයෙන් කීදෙනාද?.

එවැනි එක් රෝගාබාධයකින් සුවය ලැබූ ඉතා සුවිශේෂීවූ රෝගියකු පිළබඳව ඇයගේ වචනයන්ගෙන්ම දැන ගැනීමට මෙම ලිපිය මාර්ගයෙන් ඔබට අවස්ථාව උදාවී තිබේ.

ඔටිසම් නම් රෝගී තත්ත්වයෙන් පීඩා විඳි ඇයට අද ඉතාම සාමාන්‍ය ජීවිතයක් ගත කිරීමට ඉවහල් වී ඇත්තේ විශ්මිත ඔස්ටියෝපති සහ හීලින්පති යන වෛද්‍ය ක්‍රමයට පින්සිදු වන්නටය. ඇය පිළිබඳව සවිස්තරාත්මකව ඇයගේ වචන මඟින්ම දැන ගැනීමට මෙම ලිපිය හරහා ඔබට අවස්ථාව උදාවී ඇත.

ජීවිතයේ විවිධ දුෂ්කර අවස්ථාවන් ජයගෙන සාර්ථකත්වය කෙමෙන් කෙමන් තම ජීවිතයට ලංකරගනමින් නොපසුබට උත්සාහයෙන් ජීවිතය ජය ගත් ඇය තව බහෝ දුර ගමනක් යෑම සඳහා තම ආත්ම ශක්තිය මෙහෙයවමින් සිටියි. ඉතා කුඩා වයසක

Prof Sir Steve Russell (Dr.)

I Have known Prof, Karunathilaka now many years both as Student and colleague. I commend this gentleman to anyone who has need of any medical help. He is second to none as a dedicated and professional practitioner, who is passionate in what he does. Many people world- wide, have been helped by his unique way of improving people's structure and lifestyle. He could so easily keep this Knowledge to himself, but selflessly he wishes to teach others so that all can benefit from his range of abilities.
A great man with great ability.

ගතකරමින් සිටිනා ඇයට දෙපයින් නැඟී සිටීමට විවිධ පුද්ගලයන්ගේ සහාය හා ගුරුහරුකම් ලැබුවද ඇය පත්ව සිටි ඔටිසම් රෝගී තත්ත්වයට පිළිසරණ වූයේ ඔස්ටියෝපති රෝහලයි. අප මේ ලිපිය මඟින් සමාජගතකිරීමට යන පණිවිඩය නම්, අසරණ මිනිස් ජීවිත තවත් අසරණවීමට නොදී ඉන් මුදවා ගැනීමට දැන් ශ්‍රී ලාංකික අපට මහඟු අවස්ථාවක් උදාවී ඇතිබවයි. විශේෂයෙන්ම රටක කොඳුනාරටිය වන් දරු පරපුර මෙවැනි විවිධාකාරවූ රෝගී තත්ත්වයනට ලක්වීම කෙතරම් බේදජනකද. එහෙත් නිවැරදි ප්‍රතිකාර පවතිනතාක් කල් ඔබ මොහොතකටවත් ඒ සඳහා බිය වියයුතු නැත. මෙවැනි විෂමාකාර රෝගී තත්ත්වයන් හා සටන්වැද රෝගීවූ දරුපරපුර රැක ගැනීමට ඔස්ටියෝපති වෛද්‍ය ක්‍රමය හා ඔස්ටියෝපති රෝහල නිරන්තරයෙන් සැදීපැහැදී ඇත. අද අපගේ කථානායිකාව වූ මෙම දරුවා සියලුම පරාජිත සිතුවිලි වලින් අත්මිදී, විශේෂයෙන්ම සමාජය විසින් ඇය හිස පැටවූ ඒ දැවැන්ත පරාජිත මෙන්ම ඍණාත්මක ආකල්පයන් පසෙකට දමා තම දිවිමගේ සාර්ථකත්වය කරා ඇයව මෙහෙයවීමට ඔස්ටියෝපති රෝහලේ ප්‍රධාන වෛද්‍යතුමා ගන්නා වෙහෙස මහන්සියද ප්‍රශංසනීයයි. ඇයගේ පෙර පාසැල් සමය තම නිවසට සීමා වූයේ ඒ සෑම තැනකින්ම දරුවා ප්‍රතික්ෂේප වූ නිසාය. අද ඇය කුඩා ගද්‍ය රචකයෙකි.

කිවිඳියකි. ඇය විසින් රචිත පොත පත පවා කුඩාකල ඇය ප්‍රතික්ෂේප කල සමස්ථ සමාජයටම දෙන්නේ මහඟු පණිවිඩයකි.

මෙම දරුවාගේ හැකියාවන්, සහජ ඥාණය ආදිය දරුවා තුල සැඟවී දරුවාතුලම මියයාමට නොදී නැවත ජීවය ලබාදී සමාජය වෙත පිරිපුන් දරුවක් ලෙස මෙලෙස පය තබන්නේ තම රෝගීතත්ත්වයට නිවැරදිවම ප්‍රතිකාර ගතයුතු ස්ථානය තම වැඩිහිටියන් විසින් දැනසිටීම නිසාය. එසේ නොවන්නට අදටත් ඇය සදාකාලික ඔටිසම් රෝගියෙකි.

අවසාන වශයෙන් ඇයව මෙම රෝහලට හඳුනවා දුන් කැනඩාවේ වෙසෙන තනුජා මහත්මියවත් විශේෂයෙන් සිහිපත් කරමු

මාලබේ අතුරුගිරිය

පාරේ පිහිටි අප

වෛද්‍ය මධ්‍යස්ථානයේ ශාඛාවක් මහජනයාගේ දැඩි ඉල්ලීම පරිදි මාතර කඹුරුගමුව ප්‍රදේශයේ පවත්වාගෙන යන අතර එය එම ප්‍රදේශය අවට සියලු රෝගීන් හට මහත් අස්වැසිල්ලක් වී ඇත.

ඔබ ප්‍රතිකාර සඳහා මාලබේ පිහිටි වෛද්‍ය මධ්‍යස්ථානයට පැමිණෙන්නේ නම් බදාදා , බ්‍රහස්පතින්දා, සිකුරාදා, සෙනසුරාදා, ඉරිදා දිනයන්හි උදේ 8:00 සිට සවස 2:00 දක්වාත්, මාතර කඹුරුගමුව ශාඛාවට පැමිණෙන්නේ නම් සඳුදා උදේ 8:00 සිට සවස 2:00 දක්වාත් පැමිණිය යුතුවේ. වැඩි විස්තර සඳහා. **www.osteodr.com** වන අපේ වෙබ් අඩවියට පිවිසෙන්න.

ඉන්දික ප්‍රියදර්ශන විතාන

මගේ නම දිනුෂි උදාරා මල්වත්තගේ. මගේ වයස අවුරුදු 14යි. මම ඉගෙනුම ලබන්නේ මාවත්ගම කනිෂ්ඨ විද්‍යාලයේ. මම ඉන්නේ හෝමාගම. මගේ අම්මගේ නම දේවිකා. මට තාත්තෙක් නෑ. මං පුංචි කාලේ මම ලෙඩෙක් කියලා මාව දාලා ගියා. ඒත් අපේ අම්මනම් මාව දාලා ගියේ නෑ. පුංචි කාලේ ඉඳන්ම මමයි, අම්මයි ජීවත් වුණේ කුලී ගෙවල්වල. මගේ රෝගී තත්ත්වය මූණේ ඔටිසම්. ඒ රෝගී තත්ත්වය නිසා කවුරුත් මාව ගණන් ගත්තේ නෑ. අම්මා මාව පෙර පාසල් 13කට එක්කන් ගියා. කවුරුත් මේ ලෙඩේ නිසා භාරගත්තේ නෑ. ඉස්කෝලවලටත් ගියා. මේ ලෙඩේ නිසා කවුරුත් මාව භාරගත්තේ නෑ. ඉතින් මේ රෝගී තත්ත්වය නිසා අපේ අම්මට රුකියාවක් කරන්නත් අපහසු වුණා. ඉතින් මේ ප්‍රශ්නේ නිසා අපේ අම්මා නිතරම හිටියේ හැඬූ කඳුළෙන්. වෛද්‍යවරු කියන්නේ මේ තත්ත්වය නිසා අපේ අම්මට මාත් එක්කම ඉස්කෝලෙට ඉන්න වෙයි කියලා. ඒ වුණාට අපේ අම්ම තමයි ඉස්සර මට පෙර පාසල් දැනුමත් ලබා දුන්නේ. ඒ කාලෙදි මගෙ පෙර පාසල වුණේ මගේ නිවස. මගේ පෙර පාසල් ටීචර් වුණේ මගේ අම්මා. ඉතින් මම ඉස්කෝලේ යන දවසෙදි කවුරුත් මාව පාසලෙන් භාර ගත්තේ නැනේ. මගේ ජීවිතේ ඒ වෙනකොට බොහෝ බාධා පීඩා, නින්දා අපහාස විඳගෙන තමා අම්මත් මමත් ජීවත් වුණේ. ඒ නිසා මං සමාජයෙන් ගොඩාක් කොන් වෙලා තමා හිටියේ. ඒත් මගේ අම්මා මාව දාලා ගියේ නෑ. මං ඉදිරියේ දැවැන්ත මුරකාරයෙක් වගේ මං ළඟින්ම හිටියා. ඒ විතරක්ම නෙමේ. අපේ අම්මගේ ඉවසීම, උත්සාහය නිසා තමයි මේ හැම දෙයක්ම. ඉතින් අද කාලයේ තියෙන, ආර්ථික අපහසුතාව නිසා මාත්, අම්මත් බොහෝ පීඩා විඳිනවා. අපේ අම්මා ගෙදර ඇඳුම් මහනවා. ඉස්සර අපේ අම්මා ගෙදර ඇඳුම් මැහුවේ මැෂින් කුලියට අරගෙන. දැන් ඒ මැෂින් ඔක්කොම අරන් ගියා. සමහර ඒවා කැඩිලා. දැන් මාව ඉස්කෝලෙට දැම්මට පස්සේ අම්මා කෙළින්ම යන්නේ වෙන ගෙදරකට. ඒ වැඩ කරන්න. ඒ ගාණත් අපිට ජීවත් වෙන්න හරි අමාරුයි. අපේ ගෙවල් කුලියත් රු. 10,000යි. අපේ අම්මගේ යාළුවෙක් තමයි, රට ඉන්න තනුජා නැන්දවත් හොයලා දුන්නේ. තනුජා නැන්දා තමයි ඩොක්ටර් අංකල්ව හොයලා දුන්නේ. ඩොක්ටර් අංකල් මට ඒරප්එපැබව් කරනවා. ඉතින් ඒවාවලින් තමයි, මං මේ වගේ තැනක ඉන්නේ. ඉතින් මේ හැම බාධකයක්ම ජය අරගෙන මං දැන් සින්දු කියනවා. වයලීන්, මෙලෝඩිකා වාදනය කරනවා. ජන ගායනාත් කියනවා. කවි කතත් ලියනවා. චිත්‍රත් අඳිනවා, ක්‍රීඩාත් කරනවා, මම පොත් 4ක් ලිව්වා. එකක් කවි පොත් දෙකකුයි, කතා පොත් දෙකකුයි. මේ එකක්. ලස්සනයි නේද? මම ක්‍රීඩාවලින් සමස්ත ලංකාත් ගියා. චිත්‍ර ඇඳලත් සමස්ත ලංකා ගියා. කවි කතා, තව පොත් ලියන්න ආරාධනා මං ගොඩාක් හම්බෙලා තියෙනවා. දැන් මට ඉගෙන ගන්න පුළුවන්. මං වැඩි පුරම කැමැති ඉංග්‍රීසි, සංගීතය, සිංහල වගේ විෂයන්වලට. ඉතින් මම අනාගතයේ ලේඛිකාවක් වගේම හොඳ රංගන ශිල්පිනියක් වෙන්න මම හීන මවනවා. මගේ ජීවිතේ හෙවණැල්ල මගේ අම්මා. එයා තමා නොසැලී සිටියේ. එයාගේ ආදරය. මං එයාව ගොඩාක් ආදරයෙන් සිහිපත් කරනවා. ඉතින් දැන් මට එරප්එපැබව් කරන සාගර කරුණාතිලක ඩොක්ටර් අංකල්වත්, ඒ ආයතනයේ සේවය කරන සේවක සේවිකාවන්ටත් මං මේ අවස්ථාවේ මතක් කරමින් ඉන්නවා. ඉතින් මේ වගේ දුරකට මාව එක්කන් ආපු මගේ පාසලේ සිංහල ගුරුතුමිය, මං මේ අවස්ථාවේ ආදරයෙන් සිහිපත් කරනවා. ඉතින් අනිත් උදව් කරන හැමෝම මම මේ අවස්ථාවේ සිහිපත් කරනවා. ඒ විතරක්ම නෙමේ, හෝමාගම ඩයමන්ඩ් සිංහ සමාජයේ සාමාජිකයන් හා මාවත්ගම සමෘද්ධි මහත්තයාවත් මං මේ අවස්ථාවේ ඉතා ගෞරවයෙන් සිහිපත් කරනවා. ඉතින් මමත් දැන් කියන්නේ ඒ වගේම තමන්ටත් විවිධ හැකියාවන් ඇති. මේ මට වගේ හැකියාවන් ගොඩක් නැතිව ඇති. තමන් ගාව තියෙන එක හැකියාවකින් පුළුවන් තමන්ව සමාජයේ හොඳම තැනට අරන් යන්න. ඉතින් ඔයත් මං ඔයාලා වගේම ගොඩාක් දුක් විඳලා තියෙනවා. ඔයාලා වගේම විවිධ බාධා පීඩාත් මටත් හමුවෙලා තියෙනවා. ඉතින් ඒවගෙන් නොසැලී ඉදිරියට යන්න මං ඔයාලට සුබ පතනවා.

ප්‍රතිකාර ලබාගත හැකි රෝග

Some of the diseases which are being treated.

- කොඳු ඇට පෙළ සම්බන්ධ සියලු රෝග / Back Pain
- හිසේ රෝග Migraine
- හන්දි වේදනා / Neck Pain / Arthritis/ Shoulder Pain
- අස්ථි රෝග / Bone Disorders
- හිරිවැටීම් / Numbness
- සඳ මිදුලු හා කශේරුකා වෙන්ස්වීම් / Vertebrae & disc Misalignments
- අස්ථි තදවීම් / Bone Tightness
- ස්නායු තෙරපීම් / Spinal Nervous Decompression
- මානසික ආතතිය / Stress
- Parkinson රෝගය / Parkinson's Disease
- පැතිකුදය / Scoliosis
- අංශභාගය / Paralysis
- ස්නායු රෝග / Nervous Disorders
- විඩාබර බව / තෙහෙට්ටුව / Fatigue
- නින්ද නොයාම / Sleeplessness
- විශාදය / Depression
- රුධිර සංසරණ පද්ධතිය ආශ්‍රිත රෝග All Circulatory Disorders
- මාංශපේශී තදවීම් Tight Muscles
- මධ්‍ය ස්නායු පද්ධතිය ආශ්‍රිත රෝග All Central Nervous System Related Problems

ඔස්ටියෝ ක්ලිනික් වෛද්‍ය මධ්‍යස්ථානය, මාලඹේ.
531/ 1, අතුරුගිරිය පාර, මාලඹේ. කෂණික ඇමතුම් 076 73 33 971 / 077 52 60 401
දුරකථන ඇමතුම් 0112 054 444 / 0112 054 433 / 0112 054 499

ශාඛා : කඹුරුගමුව, මාතර
වැඩි විස්තර සඳහා www.osteodr.com වන අපගේ වෙබ් අඩවියට පිවිසෙන්න.

රනින් වාත්තු කරලා දුන්නත් පම්පෝරි නෝනලානම් එපා!

සමහර ගෑනු ඉන්නවා මාරම ආකර්ෂණීයයි. හදිසි වැඩකට යන ගමන් හිටියත් ටිකක් නැවතිලා වචනයක් කතා කරලා යන්න හිතෙනවා. මේ අයව ආශ්‍රය කරන්න කවුරුත් හරි කැමතියි.

තව කොටසක් ඉන්නවා ඈත එනවා දැක්ක ගමන් මඟ ඇරලා යන්න හිතෙනවා. මේ අයට යාළුවෝ එහෙමත් අඩුයි. ඔය කිව්ව ජාති දෙකේම අය අපි වටේ ඉන්නවා. ටිකක් කල්පනා කරලා බැලුවොත් නම් වශයෙන් වුණත් මතක් වෙයි.

එතකොට ඔයා වැටෙන්නේ ඔතනින් මොන කාණ්ඩෙටද? හිතාගන්න බැහැ නේද... කමක් නැහැ ලිපිය කියවද්දි ඔයාටම ඒක පැහැදිලි වෙයි.

අනිත් අය තමන්ව ප්‍රිය කරනවා නම්, ආශ්‍රය කරන්න කැමති නම් මිනිස්සු හරි කැමතියි. හැබැයි හැමෝම එක වගේ ආකර්ෂණීය නැහැ. මූණට ක්‍රීම් ගාලා ලස්සන ඇඳුමක් ඇන්ද පලියට මනුස්සයෙක්ට ආකර්ෂණීය වෙන්නෙ බැහැ. මොකද උස් මිටිකමට, කළු සුදු බවට වඩා ආකර්ෂණීයබවට බලපාන්නේ අපේ සමහර හැසිරීම්.

බියුටි කන්ටෙස්ට්වලදි තේරෙන බියුටි ක්වීන්ව දැක්කහම 'අපෝ මෙයාට වඩා ලස්සන අය මෙතන ඉන්නවනේ' කියලා හිතලා තියෙනවද? ඒ වගේ තරඟවලදි පවා ලස්සනට වඩා බලන්නේ ආකර්ෂණීයබව. ඉතින් ආකර්ෂණීයබව කියන්නෙම ලස්සනේ කොටසක්. අන්න ඒ නිසා අපි හිතුවා ආකර්ෂණීය ගැහැනියක් වෙන්නේ කොහොමද කියන එක ගැන කතා කරන්න.

මුලින්ම තමන් ගැන ආත්මවිශ්වාසය ඇති කරගන්න. තමන්ට තමන් ගැන හොඳ විශ්වාසයක් තියෙන්න ඕනේ. එතකොට තමයි අනිත් අයටත් අපිව විශ්වාස කරන්න පුළුවන්. 'මට මේක කරන්න බෑ. මම කැතයි. මම අරමයි මෙහෙමයි' කියලා නිතරම තමන්ටම දෙස් කියාගන්න අයට මිනිස්සු කැමති නැහැ.

නිතරම ගිරවෙක් වගේ කියවන්න ගියාම අනිත් අය එයාට ආකර්ෂණය වෙනවා කියලා හිතන බවලත්තු ඉන්නවා. ඒක වැරදියි. තොරතෝංචියක් නැතිව කියවන මිනිස්සු ආකර්ෂණීය නැහැ. 'අපෝ ඔන්න එනවා. අදත් ඉතින් කෝච්චියට අහුවුණා වගේ තියෙයි' කියලා තමයි අනිත් මිනිස්සු ඒ අයව දැක්කහම යටිහිතෙන් හිතන්නේ.

අපිට කන් දෙකකුයි එක කටකුයි දීලා තියෙන්නේ වැඩිපුර අහගෙන ඉඳලා අඩුවෙන් කතා කරන්න කියලා පොඩි කාලේ ටීචර් කියලා දුන්නා මතකයි. හැබැයි සමහරු ඉන්නවා කෙනෙක් දෙයක් කියන්න පටන්ගද්දිම 'මටත් ඔය වගේම දෙයක් වුණා නැත්තම් මගේ අල්ලපු ගෙදර මිනිහටත් වුණා' කියලා තමන්ගේ කතාව පටන්ගන්නවා. නැත්තම් කතාවක් හදලා හරි කියනවා. එතකොට ඉතින් අර තමන්ගේ දේ කියන්න ආපු එකාට දිව විකාගෙන මැරෙන්න තමයි හිතෙන්නේ. ඒ නිසා අඩුවෙන් කතා කරන වැඩිපුර ඇහුම්කන් දෙන මනුස්සයෙක් වෙන්න. හැබැයි කෙනෙක් දෙයක් කියද්දි බොරුවට අහන් ඉන්න එපා අවධානෙන් අහන්න. මොකද එහෙම අයටත් කවුරුත් කැමති නෑ.

මොහිදීන් බෙග් මාස්ටර් කියන කතාව මනෝවිද්‍යාවට විරුද්ධයි

හැබැයි ඒ කියන ඒවා අහගෙන ඉඳලා අනිත් අයට කියන්නත් එපා. කෙනෙක් අපිට දෙයක් කියන්නේ විශ්වාසෙට. ඉතින් අපිට කියන දේවල් අනිත් අයට කියන කෙනෙක්ගේ ළඟින් යන්නත් කට්ටිය බයයි. ඒ නිසා රහස් රකින්න.

ඒ වගේම කාත් එක්ක හරි කතා කරද්දි තමන් පොර කියලා හිතාගෙන තමන්ගේ කයිවාරුවයි ගෙදර අයගේ කයිවාරුවයි ගහන්න යන්න එපා. මොකද පම්පෝරි ජනකලාටත් කවුරුත් ආකර්ෂණ වෙන්නේ නැහැනේ.

සමහර උදවිය කට අරින්නෙම ප්‍රශ්නයක් කියන්න. තමන්ට තියෙන ප්‍රශ්නයක් තව කෙනෙක් එක්ක කතා කරන එක මනසට හොඳයි තමයි. හැබැයි එකක් ඉවර වුණාම ඊළඟ මාසේ වෙන ප්‍රශ්නයක් කියනවා නම් ඒක පුරුද්දට කරන දෙයක්. එහෙම කෙනෙක්ට මිනිස්සු අනුකම්පා කරනවා ඇරෙන්න ආකර්ෂණ වෙන්නේ නැහැ කියන එක මතක තියාගන්න.

'සිනහවෙන් හෝ කතාවෙන් බැහැ මනින්නට මිනිසා' කියලා මොහිදීන් බෙග් මහත්තයා කිව්වට මනෝවිද්‍යාවෙන් කියැවෙන්නේ වෙන දෙයක්. අපි කෙනෙක්ට දෙයක් කියද්දි භාවිතා කරන වචනවලින් ඒ පණිවිඩය අපේ මොළයට යන ප්‍රතිශතය 7%යි. 55%ක්ම අල්ලගන්නේ ඒ කෙනාගේ භාව ප්‍රකාශනවලින්. හඬේ ස්වරයෙන් 38%යි. උදාහරණයක් විදියට මෙහෙම හිතන්නකෝ. ඔයා කෙනෙක්ට ඇත්තක් කියනවා. හැබැයි ඔයාගේ භාව ප්‍රකාශන සහ හඬේ ස්වරය සැකසහිත නම් අනිත් කෙනා ඒ කතාව පිළිගන්න පුළුවන් ප්‍රවණතාවය අඩුයි.

ඒ වගේම වචනවලින් විතරක් අපිට මිනිස්සු මනින්නත් බැහැ. රූප ඉරියව් නොදැක ඔන්ලයින් මැසේජ් කරලා, වීඩියෝ කෝල් අරන් රැවටෙන ගෑනු ළමයි කොච්චර ඉන්නවද.

ඒ නිසා කෙනෙක් එක්ක කතා කරද්දි වචනවලට වඩා ඒ දේවල් ගැන හිතන්න. කෙනෙක්ට වැදගත් දෙයක් කියන්න තියෙනවා නම් මැසේජ් කරලා කියනවට වඩා මුණගැහිලා කතා කරන එක හොඳයි.

'Your Body Doesn't Lie' ශරීර ඉරියව්වලින් මනුස්සයෙක් ආකර්ෂණීය වෙන්නේ කොහොමද කියන එක ගැනයි වෛද්‍ය ජෝන් ඩයමන්ඩ් ලියපු මේ පොතෙන් කතා කරන්නෙ. ඩොක්ටර් ජෝන් කියන විදියට නිතරම කුදුවෙලා ඉන්න අයට ලැබෙන ආකර්ෂණ අඩුයිලු. ඒ නිසා ටිකක් උරහිස පස්සට දාලා ඉන්න. දැන් ඉතින් බයිසිකල් හැන්ඩ්ල් එකක් ගිලපු පිඹුරෙක් වගේ ඉන්න එපා. නිතරම සැහැල්ලුවෙන් කෙළින් ඉන්න බලන්න.

ඩොක්ටර් ජෝන් කියන විදියටත් කරලා බලන්න

කෙනෙක් එක්ක කතා කරද්දි අත් දෙක බැඳන් ලොකු මිනිහා වගේ ඉන්දැද්දි තමන් ගැන ගෞරවයක් නෑ වගේ එකක් ප්‍රතිපුද්ගලයට දැනෙනවලු. ඒ නිසා කෙනෙක් එක්ක කතා කරද්දි අත් සැහැල්ලුවෙන් තියාගන්න. ඇස් අපේ ආත්මයේ දෙරටුව කියනවනේ. ඉතින් කෙනෙක්ගේ ඇස් නිරවුල් නම් ඒ කෙනාට හංගන්න දෙයක් නැතිලු. ඒ නිසා කෙනෙක් එක්ක කතා කරද්දි ඇස් මඟ අරින්න එපා. හැබැයි ඇස් දිහා බලාගෙනම කතා කරන්න යන්නත් එපා. ඒකෙන් ඒ කෙනා අපහසුතාවයට පත්වෙන්න පුළුවන්.

ඇටිකෙහෙල් කාපු උගුඩුවෙක් වගේ තිස්සේම මූණ බුකවාගෙන ඉන්න අයට කොහොමත් කට්ටිය කැමති නැහැනේ. ඒ නිසා නිතරම දකින අයට හිනාවකින් සංග්‍රහ කරන්න. හිත ඇතුළේ ප්‍රශ්නයක් තිබුණත් හිනාවෙලා ඉන්න පුළුවන් නම් අර ගැටලුවේ පීඩනය පවා අඩුවෙනවා කියන එක මනෝවිද්‍යාත්මක කරුණක්.

ඒ වගේම තමයි දැනුම. අර අපි මුලින්ම කිව්වේ රූප රාජිනී තරඟ ගැන. කෙනෙක් සතු දැනුම ගැන තමයි ඒවගේත් වැඩියෙන්ම බලන්නේ. දැනුමින් වැඩි මිනිස්සු කවදා කොතැනත් ආකර්ෂණීයයි. තමන්ට අදාළ විෂය ගැන වගේම අනිත් අයගේ විෂයපථ ගැනත් පුංචිවට හරි ඉගෙනගන්න. එතකොට කෙනෙක් එක්ක සංවාදයක් කරගෙන යන්න අපිට කරුණු තියෙනවා. හිතන්නකෝ පරිගණක තාක්ෂණය වගේ අංශයක රැකියාවක් කරන කෙනෙක් චිත්‍ර ශිල්පියෙක් එක්ක ඒ දේවල්ම කතා කරන්න ගියොත් ඒ කතාබහ එච්චර සාර්ථක වෙන්නේ නැහැනේ. ඉතින් තමන්ගේ විෂය ගැන විතරක් නෙමෙයි හැම විෂයක් ගැනම කියවන්න, ඉගෙනගන්න.

ළඟකදි අඳුනගත්තු කෙනෙක් තමන්ගේ නම කියලා කතා කරනවට මිනිස්සු හරි කැමතිලු. මෙයා මාව මතක තියාගෙන වගේ විශේෂ හැඟීමක් එතකොට ඇතිවෙනවා. ඒ නිසා අනිත් අයගේ නම් මතක තියාගන්න බලන්න. නම අමතක නම් අනුමානෙට වෙන නම් කියන්න යන්න එපා. අර මනුස්සයා එතකොට අනිවාර්යයෙන්ම අපහසුතාවයට පත්වෙනවා. නම අමතක නම් බොහොම ආචාරශීලී විදියට ඒක ඒ කෙනාට කියන්න.

ඒ වගේම තමන්ට කරන්න බැරි දෙයක් නම් වැදගත් විදියට ඒකට බෑ කියන්න. යාළුවෙක් කොහේහරි යන්න කතා කතා කළාම ඔයාට ඒක බැරි වුණත් හා කියන්න එපා. මුලදි හා කියලා පස්සේ ඒක කරන්න බැරි වුණාම අපි ගැන තියෙන විශ්වාසය අඩුවෙන්න පුළුවන්. ඒ නිසා කිසිම වෙලාවක කාටවත් බොරු පොරොන්දු දෙන්න එපා.

වෙලාවට වැඩ කරන එකත් ආකර්ෂණීය බවේ ලක්ෂණයක්. කාවහරි මුණගැහෙන්න පරක්කු වෙලා යනවා නම් ඒ කෙනාගේ කාලය ගැන, රස්තියාදුව ගානක් නැති මනුස්සයෙක් කියලා හිතෙන එක ඉතින් සාධාරණයිනේ.

සහකරුවෙක් මුණගැහෙන්න යද්දි, ජොබ් ඉන්ටවීව් එකකට නැත්තම් යාළුවෝ මුණගැහෙන්න යද්දි විතරක් නෙමේ එදිනෙදා ජීවිතේදි මේ දේවල් කරලා බැලුවොත් ඔයාටත් ආකර්ෂණීය කාන්තාවක් වෙන්න පුළුවන්.

හැබැයි මේ දේවල් බොරුවට මවාපාන්න යන්න එපා. හදවතින්ම කරන්න. කාලයක් පුරුදු පුහුණු වෙද්දි ඒ දේවල් ඉබේම අපේ ජීවිතේ කොටසක් වෙනවා. එතකොට ඉතින් අනිත් අයගේ ආකර්ෂණය ලැබෙන එක නතර කරන්න සක්කරයගේ පුතා වයිමටවත් බැහැ.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

සමාවෙන්න අම්මේ



"බබා මම හොඳට නෝට් කරලා තියෙනවා. ඔයාගේ අම්මිගේ මූණට ගැලපෙන්නේ ළා දම් පාට. ඒ නිසා අපි මේ සාරිය ගමුද?" සාගරී සාරිය අතගගා කියන හැටි මංජුල බලාගෙන හිටියේ සතුටෙන්.

"අපි ගමු ඒකත්." මංජුල කිව්වා.

ඇඳුම් මිලදී අරගෙන දෙන්නා ළඟම තියෙන කොෆී ෂොප් එකට ගොඩවැදුනේ විඩාව නිවාගන්නත් එක්ක.

"ඇත්තටම සාගරී, ඔයා අපේ අම්මට ඇයි ඔච්චර ආදරේ?" මංජුල ඇහුවේ චොකලට් බීම වීදුරුවෙන් පොඩ්ඩක් රස විඳින ගමන්.

"අනේ ඔයාගේ අම්මි හරි ගුණයහපත්නේ. හරිම කරුණාවන්තයි. අනිත් එක ඔයාව මේ තැනට ගේන්න අම්මි කොච්චර දුක් විඳලා තියෙනවද? මට නම් ඔයාලගේ අම්මි සුරංගනා කතාවක ඉන්න සුරංගනාවියක් වගේ." සාගරී කියද්දී මංජුලගේ මුහුණ සොවින් බිමට බර වුණා.

"මට ඔයාට කියන්න දෙයක් තියෙනවා සාගරී." ඔහු කිව්වා.

"කියන්න මොකද්ද?"

"මම දන්නවා අම්මා මම වෙනුවෙන් කොච්චර කැපවීම් කළාද කියලා. ඒත් එක දවසක් මගේ අතින් අම්මට ලොකු වරදක් වුණා."

"ඒ මොකද්ද?" සාගරී ඇහුවේ පුදුමයෙන්.

"ඔයා මම ගැන වැරදියට හිතන්නේ නැහැ නේද?" මංජුල ආයෙමත් ඇහුවේ හිතේ සැකයෙන්. සාගරී දයාබර පෙම්වතියක්. මංජුලට අම්මාට පසුව මුණගැහුනු ආදරණීයම කාන්තාව සාගරී. ඉතින් ඇය ඉස්සරහා ඒ කතාව කියන්න මංජුලට ලොකු උවමනාවක් වගේම බයකුත් දැනුණා.

"මම ඔයා ගැන වැරදියට හිතන්නේ නැහැ. කියන්නකෝ බබා.."

"ඒ මම රස්සා හොයන කාලේ. ඇත්තටම මම හෙම්බත් වෙලා හිටියේ රස්සා හොයලම. කැම්පස් එකේ අපි ඉගෙනගත්තේ ඉන්ග්ලිෂ් මීඩියම්. හැබැයි මට ඉංග්‍රීසි කතා කරන්න බැහැ ඉස්සර. මගේ යාළුවන්ට හොඳට ඉංග්‍රීසි පුළුවන් නිසා එයාලට ඉක්මණට රස්සා හම්බුණා. ඒත් මම යන යන ඉන්ටර්විව් එක ෆේල් වෙනවා."

"ඉතින්?"

"දවසක් මම ඉන්ටර්විව් එකකට ගිහින් ගෙදර ආවේ ලොකු කළකිරීමකින්. දුකකින්. අම්මා ඇහුවා රස්සාවට තේරුණාද පුතේ කියලා. මට හොඳටම තරහ ගියා. මම කෑ ගැහුවා. මේවා අම්මලාගේ වැරදි. අර රසල්ට, කව්දුට හොඳට ඉංග්‍රීසි පුළුවන්. ඇයි උන්ගේ අම්මලා උන් එක්ක ගෙදරදීත් කතා කරන්නේ ඉංග්‍රීසියෙන්නේ. මම මෙතන ගොඩයෙක් වගේ. මට කිසිම රස්සාවක් ලැබෙන්නේ නැහැ කියලා. අම්මා බයවෙලා බලාගෙන ඉඳලා අඬන්න ගත්තා. එතකොටයි මට තේරුණේ මම කරපු වැඩේ වරදියි කියලා." මංජුල කිව්වේ වේදනාවෙන්.

"අනේ මංජුල..." සාගරීත් වේදනාවෙන් කිව්වේ මංජුලගේ රතු වේගෙන එන ඇස් දිහා බලාගෙන.

"මට අම්ම ගාවට දුවගෙන ගිහින් අම්මව බදාගන්න ඕනෙ වුණා. අම්මගෙන් සමාව ඉල්ලන්න ඕනෙ වුණා. මම වැරදියි කියලා පිළිගන්න ඕනෙ වුණා. ඒත් මට ඒ කිසිම දෙයක් කර ගන්න බැරි වුණා. මම කළේ ආයෙමත් බයික් එකට නැගලා ටවුන් එකට ගිය එක. පැය දෙකකින් විතර මම ආයේ ගෙදර ආවා. එතකොට අම්මා ගෙදර පඩිය උඩ වාඩිවෙලා මම එනකම් බලාගෙන හිටියා. මම ආපු ගමන් පුතේ බත් කාලා ඉන්න. මම මේසෙට ඇරලා තියෙන්නේ කිව්වා."

"ඉතින්?"

"මම හා අම්මේ. හරි බඩගින්නේ හිටියේ කියලා අම්මා එක්ක හොඳට හිනාවෙලා කන්න ගියා. මගේ හිතේ තරහක් නැහැ කියලා අම්මට තේරෙන්න ඇති. ඒත් ඒ සිද්ධිය අදටත් මාව රද්දනවා. අවුරුදු ගාණක් ගියත් මට ඒ සිද්ධිය මතක් වෙද්දී ලොකු දුකක් දැනෙනවා." මංජුල කිව්වේ දුකෙන්.

"එහෙනම් අපි අම්මගෙන් සමාව ඉල්ලමු." සාගරී කියද්දී මංජුල ගැස්සිලා ගියා.

"දැන්? අම්මට ඕක මතකත් නැතුව ඇති. මටනේ මේක අමතක කරගන්න බැරි." මංජුල කිව්වේ සාගරීගේ දෙනෙත් මඟ හරිමින්.

"ඔයා කොහොමද හරියටම කියන්නේ අම්මට ඒක මතක නැහැ කියලා. අම්මට ඒක මතක ඇති. අම්මටත් ඔයාට වගේම දුක ඇති. අම්මට වරදකාරී හැඟීමක් ඇති අනේ මගේ නුගත්කම නිසා පුතාට හොඳ රස්සාවක් හොයාගන්න බැරි වුණා කියලා. මංජුල, අපේම අයගෙන් සමාව ඉල්ලන්න ලැජ්ජා වෙන්නේ ඇයි? පාරේ යද්දී කාගේ හරි ඇඟේ හැප්පුණොත් අපි සොරි කියනවා. ඔෆිස් එකේදී අපේ අතින් කාගේහරි පෑනක් බිම වැටුණත් අපි සොරි කියනවා. හැබැයි ගෙදර ඉන්න අම්මගෙන්, තාත්තාගෙන්, වයිෆ්ගෙන්, හස්බන්ඩ්ගෙන් සමාව ඉල්ලන්න වෙන එක ලැජ්ජාවක් විදියට දකිනවා." සාගරී කියද්දී මංජුල බලාගෙන හිටියේ පුදුමයෙන්.

"අනිත් එක බලන්න මංජුල ඔයාට මේ සිද්ධිය තාමත් මතක් වෙලා දුක හිතෙනවා. අපේ ජීවිත ස්ථිර නැහැ. හෙට අම්මගේ ජීවිතේට කරදරයක් වුණොත් ඔයාට කවදාවත් සමාව ඉල්ලන්න අවස්ථාවක් ලැබෙන්නේ නැහැ. ඔයා මැරෙනකම් ඔයාගේ හිත වදදෙයි. නේද?" සාගරී කියද්දී මංජුල පපුව අල්ලගත්තේ වේදනාවෙන්.

"මට තේරෙනවා." ඔහු හෙමිහිට කිව්වා.

"අපි දෙන්නා කසාද බැන්දම අපිටත් තරහ යාවි. ඔෆිස් එකේ ස්ට්‍රෙස් එක, දරුවන්ගේ ප්‍රශ්න නිසා හෙම්බත් වෙලා අපි අපේ හිත් රිදවා ගනීවි. ඒක වරදක් තමා. ඒත් අපි පෘතග්ජන මිනිස්සුනේ. ඉතින් අපි අපේ තරහ දුක ළඟම ඉන්න කෙනාගේ පිටින් යවාවි. හැබැයි දවස ඉවර වෙන්න කලින් අපි කලේ වරදක් කියලා තේරුම් අරන් අනිත් කෙනාගෙන් සමාව ගත්තොත් අපේ වචන නිසා අනිත් කෙනාගේ හිතේ ඇතිවුණු තුවාලේ වේදනාව අඩුවෙයි." සාගරී කියද්දී මංජුල හිස වැනුවා.

අම්මට ගත්තු ඇඳුම් ටිකත් අරගෙන මංජුල ගෙදර ගියේ අම්මා එක්ක කතා කරන්න.

"අම්මේ දවසක් ඉන්ටර්විව් එකකින් ෆේල් වෙලා ඒ තරහට මගේ අතින් අම්මට කියවුණු දේ ." මංජුලට කියාගන්න ලැබුණේ ඒ වචන ටික විතරයි. අම්මගේ ඇස්වලට පිරිගෙන ආපු කඳුළු මංජුලව තිගැස්සුවා. ඒ පිහිතුඩු වගේ වචන අම්මට අමතක වෙලා නැහැ කියලා ඒ කඳුළු මංජුලට කියා දුන්නා.

"මට එදා අම්මගෙන් සමාව ඉල්ලන්න ඕනේ වුණා. මම එහෙම කියපු එක වැරදියි කියලා මට එවෙලේම තේරුණා අම්මා. ඒත් මට කියාගන්න බැරි වුණා. එදා වුණු දේට මට සමාවෙන්න." මංජුල එහෙම කිව්වේ අම්මව තුරුල් කරගෙන.

"ඒ සිද්ධියෙන් පස්සේ මගේ පුතාට මම නිසා අවැඩක් වුණා කියලා මම හැමදම දුක්වුණා පුතේ. මගේ හිතට අද ලොකු සැනසීමක් දැනුණා.." අම්මා කියද්දී මංජුල අම්මව තවත් තදින් තුරුළු කරගත්තා. මෙතරම් කාලයක් තමන්ගේ හිතේ තිබුණු බරත් නිදහස් වුණු බව මංජුලටම දැනෙන්න පටන්ගත්තා.

ඔයත් ඔයාගේ ළඟම කෙනෙක්ගේ හිත රිද්දලා, සමාව ඉල්ලන්න ලැජ්ජා නිසා "එයාට ඒක අමතක වෙලා ඇති" කියලා හිත හදාගෙන ඉන්නවාද? සමාව ඉල්ලන්න ලැජ්ජා වෙන්න එපා. අවුරුදු ගාණක් තිස්සේ හිතේ තිබුණු තුවාල, වේදනාවන් පුංචි සමාව ඉල්ලීමකින් සුව කරලා දාන්න පුළුවන්.

■ සමාධි ඛයස්

මං වගේ සෙකන්ඩ් හෑන්ඩ් කොල්ලෙකුට අහුවෙන්න එපා කියලා

ඒකි කැම්පස් එකේ හැමෝටම කියලා

පොඩ්ඩියෙ අම්මා අම්මාමයි තාම
වැරදුණෙ අපි නිසයි ඇය වැරදිද කෝම
බක්මහේ කොවුල් බිඳු පුපුරන දක
නංගියෙ අම්මාගෙන් උඹ ඉල්ලනවද ගේම

සතා කියා ඉඳහිටකදි ඇහුණාට
කතා හදන උන් සේරම බෝසත්ද
යකා වැහෙන්නට පෙර උඹෙ අයියාට
කතන්දර එපා වැඳපන් අම්මාට

මේ ගීතයට නිමිත්ත වෙලා තියෙන්නේ මොකක්හරි හේතුවක් මත වෛශ්‍යාවක් වුණු අම්මා කෙනෙක් තමන්ගේ දුව ඉදිරියේ අසරණ වෙන අවස්ථාවක්. නංගි අහන ප්‍රශ්නවලට උත්තර දීගන්න බැරුව අසරණ වෙන අම්මව සාධාරණීකරණය කරන්න පුතා දරණ උත්සාහය ගැන තමයි මේ ගීතයෙන් කියැවෙන්නේ.

කපුටු කුඩුවක් ඇතුළෙ කොහා පැටව් දැම්මම උන් කොවුල් පැටව් කියලා දැනගන්න ලැබෙන්නේ ලොකුවෙලා කෑගහන්න ගත්තට පස්සේ කියනවනේ. ඉතින් මේ ගීතයේ කියැවෙන විදියට මේ දුවත් කපුටු අම්මෙකුගෙ කුඩුවේ හැදුණු කොහා පැටියෙක්. ඒ ගැන කියලා පස්සේ කාලෙක රට්ටු කතා හදනවා. හැබැයි එහෙම කතා හදන උන් ඔක්කොම බෝසත් ද කියන ප්‍රශ්නෙ අහන්න තියා, අප්පත් නැතුව මං උඹව හදගත්තු එකම මදිද කියලා දුවගෙන් අහන්න තරම්වත් හයියක් අර අම්මා ගාව ඉතුරු වෙලා නෑ.

ඇත්තටම ඒ අම්මට විතරක් නෙවෙයි. අද කාලේ ජීවත්වෙන ගොඩක් ගෑනුන්ට ඒ හයිය නෑ. විවාහයට කලින් තමන් පිරිමි කී දෙනෙක් ඇසුරු කළාද කියලා කියන්න, දික්කසාදෙකින් පස්සේ බය නැතුව පාරේ තොටේ බැහැල ඇවිදින්න, අප්පලා නැති කිරි සප්පයෝ තනියම ලොකු මහත් කරන ගමන් ඒ කරන හපන්කම ගැන ලෝකෙට කියන්න බැරි ගැහැනු අපි අතරේ ඕනතරම් ඉන්නවා.

ඒ වගේම අයාලේ යන, අනාචාරයේ හැසිරෙන පිරිමි අපි අතරේ කොච්චර ඉන්නවද? හැබැයි වෙනසකට තියෙන්නේ ගැහැනුන්ට තරම් ලේසියෙන් පිරිමින්ට ලේබල් වදින්නේ නෑ. ගණිකාව කියලා වචනයක් නිර්මාණය වෙලා තිබුණට ඒ වැඩේම කරන පිරිමි හඳුන්වන්න පුරුෂාර්ථ පදයක් නිර්මාණය වෙලා නෑ. නමුත් ගැහැනියක් කැමැත්තෙන් හෝ අකමැත්තෙන් එක පිරිමියෙක් සමඟ

යහන්ගත වූ පමණින් වෙනත් පිරිමියෙකු සමඟ යහන්ගතවීම මහා අපරාධයක් විදියට සලකන සංස්කෘතියක් බිහිවෙලා තියනවා. ගැහැනුන්ව හඳුන්වන්න අපේ වහරේ භාවිතා වෙන සමහර වචන ඒවාට ඉතාම පැහැදිලි උදාහරණ විදියට හඳුන්වන්න පුළුවන්. නමුත් ඒ එක ලේබලයක්වත් පිරිමින්ට වදිනවා අපි දැකලා නෑ. ඒ නිසා කිසියම් ගැහැනියකගේ පිරිසිදුකම ප්‍රශ්න කරන හෝ යටගියාව අවුස්සන ඕනෑම පිරිමියෙක්ගෙන් පෙරලා ඒ ප්‍රශ්නයම අහන්න ගැහැනියකට හයියක් තියෙන්න ඕන.

ඒ වගේ කොන්ද පණ ඇති ගැහැනියක් ගැන කියැවෙන හොඳම උදාහරණය විදියට ගීත සාහිත්‍යයේ අපි දකින්නේ මේ ගීතය.

මුදු මුහුණේ සුව දැනුණේ
ප්‍රිය ළඳුනේ මට විතරද
ඔබෙ සුසුමේ සුව දැනුණේ
හිමි සඳුනේ මට විතරද
පුළුලුකුලේ සුව යහනේ
නිදි වැරුවේ මම විතරද
උරතලයේ හිස රන්දූ
සුව වින්දේ මං විතරද
ඉඟ නෙරියේ රැලි බින්දේ
ප්‍රිය ළඳුනේ මම විතරද
ඉඟ නෙරියේ රැලි සැදුවේ
හිමි සඳුනේ මගෙ විතරද

අතීතයේ සිද්ධ වුණු වැරදි මූලික කරගෙන අනාගතයේදීත් ඔබ ලේබල් අලවාගත යුතු නෑ

තමන්ගෙන් ප්‍රශ්න කරන පිරිමින්ගෙන් මේ විදියට ප්‍රශ්න කරන්න ගැහැනියකට හැකි විය යුතුමයි. එහෙම නැතිව සමතැන දියව්, නිසි තැන දියව් කියලා බෝඩ් උස්සගෙන ලිප්ටන් වටරවුමට ගිහිල්ලා කෑ ගැහුව පලියට කවදාවත් ඒ සම තැන හෝ නිසි තැන ලැබෙන්නේ නෑ. ඒ තැන හදගත යුත්තේ තමන් විසින්මයි.

මහාචාර්ය අත්තනායක එම් හේරත් මහතා සමඟ සිදුකළ මේ සංවාදයත් ඒ කාරණාව සම්බන්ධවමයි.

"මට විශ්වවිද්‍යාලයේදී විසඳන්න වුණ ප්‍රශ්නයක් කියලම මම කතාව පටන්ගන්නම්.

මම විශ්වවිද්‍යාලයේ උගන්වන කාලේ ඉතාමත් ආවේගයෙන් මගේ ළඟට ආපු ශිෂ්‍යයෙක් මට කිව්වා, 'සර් මම අරකිව ඉතුරු කරන්නෙ නෑ මරාගෙන මැරෙනවා' කියලා. පස්සේ මම ඒ පුතාට ටිකක් නිවෙන්න ඇරලා ඇහැව්වා 'දැන් කියහන්කො බලන්න උඹ මරාගෙන මැරෙන්න යන්නෙ මොකීවද' කියලා.

ඊට මිනිත්තු පහකට විතර පස්සෙ වතුර ටිකකුත් බීලා මේකා මට කියපි 'සර් මගේ ගර්ල්ෆ්‍රෙන්ඩ් මගේ අතන මෙතන පොඩියි, ලොකුයි, කැතයි, ගඳයි කියලා කැම්පස් එක පුරාම පතුරවලා කියලා. මම කෙල්ලො එක්ක ගියපු හොඳ පලපුරුදුකාරයෙක් නිසා මං වගේ සෙකන්ඩ් හෑන්ඩ් කොල්ලෙකුට අහුවෙන්න එපා කියලා අනිත් කෙල්ලොන්ට කියලා. ඒ නිසා දැන් සමහර ගෑනු ළමයි මගේ මූණ බලන්නෙ නෑ. තව සමහරු දකින දකින තැන මට විහිළු කරනවා' කියලා කිව්වා.

අන්තිමට මට මේ යකා කියන කතාවේ අග මුල ලිහාගන්න බැරුව අර දුවවත් මගේ ළඟට ගෙන්නලා මේ ගැන අහන්න සිද්ධ වුණා. එතකොට මේ කෙල්ල කියාපි, 'සර් මෙයා මාත් එක්ක කැම්පස් එකේ පාර්ක් එකට ගිහිල්ලා ඇවිත් මගේ ඩිකිය මදි, මං තුනී ලෑලි සංස්ථාව වගේ කියලා පිරිමි ළමයි සේරටම කියලා. ඒ නිසා හරිහමන් කොල්ලෙකුට මාව හරියන්නෙත් නෑ කියලා. ඒ විදියට මං අසම්පූර්ණයි කියන්න තරම් මෙයාට තියෙන සුදුසුකම් මොකද්ද සර්' කියලා ඒ දැරිවි මගෙන් ඇහුවා. ඒ සිද්ධියෙන් පස්සේ ගොඩක් පිරිමි ළමයි ඇයව දකින තැන සමච්චල් කරන්න පටන්අරන් කියලත් කිව්වා. ඊටපස්සෙ මං අර කොල්ලගෙන් මේ කතාවේ ඇත්ත නැත්ත ඇහුවම මේකා මගේ ඉස්සරහා මොකුත් නොකියා ඇටිකෙහෙල් ගිලපු උගුඩුවා වගේ අහක බලන් උන්නා.

ඒ දුවගේ හිතේ තිබුණ හයිය ගැන මට පැහැදීමක් තිබුණත් ඒ කරපු ක්‍රියාව වැරදි නිසා මම ඒක අනුමත කරන්න ගියේ නෑ. ටිකක් හිතන්න ඔයිට වඩා වෙනස් වුණත් ඔය වගේම ප්‍රශ්න නිසා අපේ දුවලා කී දෙනෙක් නම් ලැජ්ජාවට ලියුම් කෑලි ලියලා තියලා ගිහින් අර මහවැලි ගඟට පැනලා දිවිනහගෙන ඇද්ද? තමන් අසම්පූර්ණයි කිව්වට අර කොල්ලට ඒ දැරිව්ව මරන්න තරම් ආවේගයක් ආවානම් ගැහැනු දරුවෙක් අසම්පූර්ණයි කියලා ප්‍රසිද්ධියේ කිව්වම ඒ දරුවට කොහොම වේදනාවක් හිතට දැනෙන්න ඕනද? ඒ වෙලාවට අවශ්‍ය වෙන්නෙ එහෙම ප්‍රශ්නයක් ආපු ගමන් විලිලැජ්ජාවට ගඟේ මුහුදේ පනින දුවලද? එහෙමත් නැත්නම් තමන්ගේ අතින් වුණ වරදට බය නැතුව මූණදෙන්න පුළුවන් හිත හයිය දුවලද?

අන්න ඒ නිසා මම අපේ දුවලට, තරුණියන්ට වගේම විවාහක කාන්තාවන්ටත් කියන්නෙ යම්කිසි අවස්ථාවකට අනුව අසරණභාවක පත්වෙලා, ඔබට වරදක් වෙලා තියෙනවනම් ඒ නිසාම ඔබ මේ සමාජයේ ගොදුරක් බවට පත්විය යුතු නෑ. අතීතයේ සිද්ධ වුණු ඒ වරද මූලික කරගෙන අනාගතයේදීත් ඔබ ලේබල් අලවාගත යුතු නෑ.

අර කියමනක් තියෙනවානේ ගණිකාවක් වුණු ගැහැනියක් පිටිපස්සේ අනිවාර්යයෙන්ම ඊට දයක වුණු පිරිමියෙකුත් ඉන්නවා කියලා. කිසි කෙනෙකුට තනි අතින් අත්පුඩි ගහන්න බෑ. ඒ නිසා ඔබ කාන්තාවක් වුණු පමණින් යම් යම් කරණා මූලික කරගෙන ඔබට ලේබල් ගහන, ඔබව විනිශ්චය කරන අයගේ ගොදුරු බවට පත්වෙන්න එපා. සරලවම කිව්වොත්, ' කතා හදන උන් සේරම බෝසත්ලා නෙවෙයි' ඒ නිසා පෙරලා ප්‍රශ්න කරන්න බය වෙන්න එපා.

තොරතුරු
අත්තනායක එම්. හේරත්

■ **ලිහිණි මධුෂිකා**

මගේ අලි අම්මට වඩා මේ මාමලා හොඳයි

දැන් කුමක් කරන්නද? ආපසු ගොස් වීමේ හැකියාවක් නැත. තිබෙන සම්පත් අනුව මෙහෙයුම දියත් කිරීමට ඔවුහු සැලසුම් සැකසූහ. ඒ අස්සේ මීටර පනහක් පමණ ඈතින් සිටින අලි රංචුව පිඹිමින් දඟලමින් කාර්ය නිරීක්ෂණය කරනු පෙනේ. යම් හෙයකින් ඔවුන් ආවොත් පිරිසට වැලේ වැල් නැත. අවසානයේ ඔවුන්ට පිහිටට ආවේ රථය පණ ගැන්වීමට උදව් වූ අලි කඹයයි. එහි කොනක් මයිල ගසේ අත්තක ගැට ගසන ලදි. පසුව අනෙක් පසින් එය ජීප් රථයට සම්බන්ධ කර රථය පසුපසට ගනිමින් අත්ත ඇදීමට පියවර ගැනිණ. මයිල අත්ත ටික ටික ඈත් විය. ඒ අවසරයෙන් සෙසු පිරිස පැටවාගේ පසුපසින් තල්ලු කරද්දී ඔහු දෙබලෙන් නිදහස් වී පිටට ආවේය. සතුටින් කෑ ගැසූ අලි පැටවා අම්මා වෙත දුවනවා වෙනුවට ජීප් රථය වෙත පැමිණ හොඬයෙන් සුක්කානම අල්ලා ගත්තේය. වඳින්න ගිය දේවාලය ඉහේ කඩා වැටෙන ලකුණකි. මව් ඇතින්න ආවොතින් සියල්ල හමාරය. පැටවා සුක්කානම අත හැරීමටද සූදානම් නැත. වනජීවී ආරක්ෂක අනිල්ට සිදුවූයේ ඇඟිලිවලින් හොඬයට පාරවල් කීපයක් ගසා සුක්කානම නිදහස් කර ගැනීමටයි. එහෙත් ජීප් රථයේ ඇලි ඇලී ඉන්නවා මිස උන්දෑ යන පාටක් නැත. සෙසු පිරිස රථයට ගොඩ වෙද්දී පැටවාද පස්ස දෙරින් ඔලුව දැම්මේ "අනේ මාවත් නග්ගගන්න" කියන්නාක් මෙනි. පිරිස රථය ඉදිරියට ගනිද්දී පැටවාද පසුපස එයි. අවසානයේ ලොකු වටයක් එහෙට මෙහෙට යාමෙන් පැටවා මගහැරගැනීමට පිරිසට හැකිවිය. අනතුරුව පැංචා සිය රංචුවට එකතු විය. රැයක් පුරා නිදිවරමින් කළ මෙහෙයුමේ ප්‍රතිඵල ලැබිණ. ඒ සඳහා අලි අම්මා ප්‍රමුඛ රංචුව දැක්වූ සහාය ගැන වනජීවී ආරක්ෂක අනිල් විතානගේට අදටත් පුදුමය.

තොරතුරු - වනජීවී ආරක්ෂක අනිල් විතානගේ

රජනිකා ලියනගේ

මහදැනමුත්තාගේ කාලයේ මුට්ටියක හිස සිරකරගත් විළුවාගේ කතාව සහ එය විසඳූ ආකාරය අපි අසා ඇත. එහෙත් මයිල ගහක සිරවූ අලි පැටවාගේ රසවත් කතාව ඔබ අසා නැතුවාට සැක නැත. 2000 වසර ලබන්නට ඔන්න මෙන්න තිබියදී සිදුවූ මේ රසවත් සිදුවීම සිහිපත් කරන්නේ වනජීවී ආරක්ෂක අනිල් විතානගේ ය. එවකට හෙතෙම ලුණුගම්වෙහෙර ජාතික වනෝද්‍යානයේ සේවය කරමින් සිටියේය. එසේ සිටියදී දිනක් සැන්දෑයාමේ ඔහු හමුවට පැමිණියේ ගව හිමියෙකි.

"මහත්තයො, ආන්න අලි පැටියෙක් ගස් දෙබලක හිරවෙලා. අලි අම්මා එතනට වෙලා කෑ ගහනවා. ඒ මදිවට කිසි කෙනෙක්ට එතනින් යන්න දෙන්නෑ. පන්නනවා. හරකෙක්ටවත් ඉන්න දෙන්නෑ."

මේ හාදයා පණිවිඩය ගෙනාවේ නරක වෙලාවකය. රියැදුරාද නිවාඩු ලබාය. වෙනත් ආදේශකයක්ද නැත. අධීක්ෂණ නිලධාරියකු ලෙස සිටි අඩවි සහකාර ටී.එම්. අබේරත්න ඇතුලු සියලු දෙනා අසරණය. ඒ මොහොතේ ඔවුන් සැමගේ පිහිටට ආවේ අනිල් විතානගේය.

"මට ලයිසන් තියෙනවනේ. මං ජීප් එක එලවන්නං"

වැඩේ බරපතළකමට වඩා අලි පැටවා මුදගැනීමට අවධානය යොමුකළ පිරිසේ එකඟතාව ඊට හිමිවිය. අබේරත්න, දයානන්ද, නිහාල් සහ අනිල් ගමනට සූදානම්ය. සවස හයත් පසු වී ඇත. කොරේ පිටට මරේය. ජීප් රථය පණගැන්විය නොහැකිය. එහෙත් වැඩේ අතහරින්නට පිරිස සූදානම් නැත. පාරේ ගමන් ගත් බැකෝ රථයක් නවතා විශාල කඹයක් ජීප් රථයට ගැට ගසා බැකෝවෙන් ඇද එය පණගන්වා ගැනීමට හැකි විය. කළුවර වැටෙන යාමයේ මේ සියලු ජරමර අස්සේ අලි පැටවා සෙවීම පහසු නැත. එනිසා පණිවිඩය ගෙනා ගව හිමියාද සොයා ඔහුත් රැගෙන නඩය කැලෑවට ගියේ අරමුණ ඉටුකර ගැනීම වෙනුවෙනි. ජීප් රථයේ තෙල් ටැංකිය පිරී තිබීම සහනයකි.

රෑ පුරා හතර වටේ ඇවිද්දද අලි පැටවා සොයා ගැනීමට හැකි වූයේ නැත. යාන්තං එළිය වැටීගෙන එනවිට ලුණුගම්වෙහෙර පෑවුවැව ඉස්මත්තේදී අලි පැටවා සිරව සිටි ඉසව්වට පැමිණීමට පිරිසට හැකි විය. සාමාන්‍ය තරමේ මයිල ගහක ගහේ මුලින් ගිය ගස් දෙකක් අතර දෙබලක පැටවාගේ බණ්ඩිය සිරවී ඇත. එනිසා පැටවාට එහාටවත් මෙහාටවත් යා නොහැකිය. අලි ඇතුන් පෙරලන මහ ගස්වල හැටියට ඇතින්නට මේ මයිල ගස දෙකඩ කිරීම මහා කාර්යක් නොවේ. එහෙත් ගස වටේ යමින් අඬනවා හැපෙනවා හැරෙන්නට ඈ ඊට උත්සාහ දරා නැත. ඇතැම්විට ඉන් පැටවාට හානිවීමට ඉඩ ඇතැයි අලි අම්මාට සිතුණා විය හැකිය.

ජීප් රථය එතැනට ළඟාවීමත් සමඟ වූයේ අනපේක්ෂිත දෙයකි. පෙරදා හරකෙකුටවත් එතැනින් යාමට ඉඩ නොදුන් අලි අම්මා රංචුවද කැටුව තරමක් දුරට ගියාය. එබැවින් පරිසරය පැහැදිලිය. දැන් කළ යුත්තේ පැටවා මුදගැනීමයි. මෙහෙයුමට මනාව සැරසුණු වනජීවී නඩය ඇති පදමට තුවක්කු, පතොරම්, අලි වෙඩි පටවාගෙන ගොසිනි. එහෙත් කිසිවකුට පොරවක්, කියතක් රැගෙන වීමට තරම් කල්පනාවක් තිබී නැත.

F.A.Ads

ඔබට මුදල් හදිසිසියක්ද?
නැත්නම් ඔබේ වටිනා
රන් භාණ්ඩ
සින්න වෙන්න
යනවාද?

ඕනෑම බැංකුවක උකස් තබා ඇති රන් භාණ්ඩ ගණුදෙනුවක් සඳහා

පවුමට රු. 43,000/- ක් ම වැඩිපුර

1% ක අඩුම පොලියට ලබා ගන්න

ඔබ දැනට උකස්තබා ඇති රිසිට් පත අපට 0767 888 222 අංකයට WhatsApp කරන්න

විශේෂ සහන රැසක් සමගින්

නැවත බේරා ගැනීමේදී පහසු ගෙවීමේ ක්‍රමයට Loan එකකුත්

*කොන්දේසි අදාළවේ

කොළඹ	0771 408 547	මීගමුව	0766 227 056
කොටහේන	0702 539 382	ගම්පහ	0779 230 549
වැල්ලවත්ත	0710 870 686	කළුතර	0776 167 149
ග්‍රෑන්ඩ්පාස්	0742 379 739	හලාවත	0779 256 191
මොරටුව	0766 227 059	මාතර	0705 979 237
පානදුර	0767 952 286	ගම්පොල	0710 870 735
වෙන්නප්පුව	0710 869 378	නාවලපිටිය	0710 870 706
ගාල්ල	0705 979 274	හැටන්	0778 790 372
කුරුණෑගල	0766 227 061	කෑගල්ල	0703 583 363
දිගන	0778 156 738	ත්‍රිකුණාමලය	0771 201 854
බේරුවල	0740 920 356	පුත්තලම	0771 201 861
මතුගම	0771 201 860	මහියංගනය	0771 201 862
මොණරාගල	0771 201 852	වත්තේගම	0742 551 103
බදුල්ල	0771 201 863	හපුතලේ	0760 677 018
කල්පිටිය	0761 605 803	මාතලේ	0702 539 389
කටුගස්තොට	0779 476 206	තලවකැලේ	0710 871 009
නාදල	0763 226 230	රාගල	0710 870 703
කන්තලේ	0742 572 585	පූඩලඔය	0740 929 541
පොතුවිල්	0771 201 855	මස්කෙලිය	0760 909 822
වැලිමඩ	0778 764 751	පුස්සැල්ලාව	0742 531 360
බඟවන්තලාව	0742 588 267	අච්චුවේලි	0743 865 368
ආගරපතන	0765 930 715		

කවුරු මොනවා කිව්වත් පිරිමි එක්ක කරට කර වැඩ කරන්න පුළුවන් හයියක් මට තියෙනවා

කවී රාජපක්ෂ
ප්‍රධාන අලෙවි නිලධාරී
සොෆ්ට්ලොජික් ලයිෆ් ආයතනය

"කිසිම අභියෝගයක් බාරගන්න බැහැ කියන්න එපා. මුලින්ම අභියෝගය බාරගන්න. ඊටපස්සේ ඒක කරන විදිය ඉගෙනගන්න.

ඕක ඇමරිකාවේ ප්‍රසිද්ධ ව්‍යවසායකයෙක් වෙච්ච් රිචඩ් බ්‍රැන්ඩිසන් කියපු කතාවක්. ඇත්තටම ඒක ගොඩක් වටින කතාවක්. මමත් කොයිම වෙලාවකවත් කිසිම දෙයක් බැහැ කියලා අතාරින්නේ නැහැ."

සොෆ්ට්ලොජික් ලයිෆ් ආයතනයේ ප්‍රධාන අලෙවි නිලධාරිනිය කවී රාජපක්ෂ ඇගේ කතාව පටන්ගත්තේ එහෙමයි. බවලතියක් වයිට් කොලර් ජොබ් එකක නැත්තම් උසස් නිලයක ඉන්දැද්දි ගොඩක් අයට පේන්නේ ඒ කෙනා ලස්සනට අර ලොකු පුටුවේ වාඩිවෙලා ඉන්න අපූරුව විතරයි. හැබැයි කාන්තාවක් විදියට එතැනට එන්න ඇය කරපු කැපකිරීම් ගැන කතා කරන පිරිස අඩුයි. කවී කියන්නෙත් විවිධ කැපකිරීම් මැද අභියෝග දරාගෙන ඒ තැනට ආපු ශක්තිමත් ගැහැනියක්. ඉතින් ඇගේ සාර්ථකත්වයේ ගමනෙදි ඇයට ආපු අභියෝග, කැපකිරීම් ගැන ඇය අපිත් එක්ක කිව්වේ තවත් කෙනෙක්ට හයියක් වෙන අරමුණ ඇතිවයි. අද 'ධරණී' කවරය හැඩවෙන්නෙත් ඇගේ සොඳුරු රුවෙන්.

"අම්මයි, තාත්තයි, මමයි, නංගියි තමයි පවුලේ හිටියේ. ප්‍රාථමික අධ්‍යාපනය කළේ කොළඹ මියුසියස් විද්‍යාලයෙන්. මට අවුරුදු හතේදි තාත්තා නැතිවුණා. ඊටපස්සේ අම්මා තමයි අපි දෙන්නව බලාගත්තේ. ඉස්කෝලේ බර තනියම දරාගන්න ටිකක් අමාරුවුණු නිසා තාත්තා නැතිවුණාට පස්සේ විශාකා විද්‍යාලයට මාරුවුණා."

පුංචි සන්දියේ ඉඳලම ඇය ඉගෙනුමට බොහොම දක්ෂ ශිෂ්‍යාවක්ලු. ඉගෙනුමට අමතරව නාට්‍ය, විවාද, ක්‍රීඩා ඔය හැම අංශයකින්ම දක්ෂතා දක්වපු නිසා අවුරුදු දෙකක් එකදිගට ඉස්කෝලේ සෑම අතින්ම දක්ෂ ශිෂ්‍යාව වුණාලු.

"උසස් පෙළින් පස්සේ කොළඹ විශ්වවිද්‍යාලයේ රසායනික අංශයෙන් උසස් අධ්‍යාපනය හැදෑරුවා. ඒත් එක්කම පෞද්ගලික විශ්වවිද්‍යාලයකිනුත් රසායනික අංශයෙන් උපාධියක් කරන්න ශිෂ්‍යත්වයක් ලැබුණා. ඉතින් ෆස්ට් ක්ලාස් එක්ක උපාධි දෙකක්ම එකපාර සම්පූර්ණ කළා.

රසායනික අංශයෙන් ඉගෙනගන්න ගොඩක් අය කරන්නේ ආචාර්ය උපාධියට රට යන එක. හැබැයි අපේ රටේ සල්ලිවලින් ඉගෙනගෙන පිටරට යන එක රටට කරන අපරාධයක් කියලයි මට හිතුණේ. ඒ නිසා මම රට යන්න හිතුවේ නැහැ. පස්සේ මම යුනිලීවර් ආයතනයේ පර්යේෂණ සහ සංවර්ධන පැත්තට අයැදුම් කළා."

මේ කියන තනතුරට අයැදුම්කරුවන් විශාල ප්‍රමාණයක් අයැදුම් කළත් තේරුණේ කවී ඇතුළුව තවත් අයැදුම්කරුවන් හයදෙනෙක් විතරලු.

"තත්ත්ව පරීක්ෂා වගේ දේවල් තමයි මුලින්ම කළේ. ඊටපස්සේ මාස තුනක ප්‍රොජෙක්ට් එකකට මාව අලෙවි අංශයට දැම්මා. එතැනදි මට ලංකාවේ ප්‍රසිද්ධ බියුටි ප්‍රඩක්ට් එකක් එළිදක්වන්න අවස්ථාව ලැබුණා. ඒ ලැබුණු සාර්ථකත්වය නිසා ඒ අය මාව අලෙවි අංශයේම තියාගත්තා. 'ඇස්ට්‍රා' බ්‍රෑන්ඩ් මැනේජර් කියන තනතුර තමයි මට මුලින්ම ලැබුණේ."

රසායනික අංශයෙන් ඉගෙනගෙන මාර්කටින් පැත්තට යන්න කවී කැමති වුණාද?

"ඔව්, ගොඩක් ආසාවෙන් මම ඒ අභියෝගය බාරගත්තා. අනික පුංචි කාලෙ ඉඳලම මම නිර්මාණාත්මක වැඩවලට දක්ෂයි. බ්‍රෑන්ඩ් මැනේජර් විදියට ඔහොම වැඩ කරගෙන ඉන්දැද්දි ඇස්ට්‍රා ෆැක්ටරි තුනෙන් එකක් ගිනි ගත්තා. පස්සේ ඒ ප්‍රඩක්ට් එකෙන් ලොකු ප්‍රමාණයක් නිෂ්පාදනය කරගන්න ලංකාවේ ෆැක්ටරි එකක් නැතිවුණා. ඉතින් බ්‍රෑන්ඩ් මැනේජර් විදියට මම රට රටවල ගිහිල්ලා තැන් හොයාගෙන ඒ ප්‍රශ්නය විසඳුවා. මගේ ටීම් එකත් ඒකට මට ගොඩක් උදව් කළා."

ඒ අභියෝගය සාර්ථකව ජයගත්තු කවී රාජපක්ෂ අලෙවිකරණය පැත්තෙනුත් ඇගේ අධ්‍යාපන සුදුසුකම් සපුරගත්තලු.

"අර ප්‍රශ්නය හොඳින් කළමනාකරණය කරපු නිසා සීනියර් බ්‍රෑන්ඩ් මැනේජර් තනතුරට උසස් වුණා. හැබැයි සොෆ්ට්ලොජික් එකෙන් මට අවස්ථාවක් ලැබුණොත් ඒත් එක්කමයි. මාර්කටින් කළාට මම ඉන්ෂුවරන්ස් පැත්ත ගැන දැනගෙන හිටියේ නැහැනේ. ඒ නිසා ඒකත් කරලා බලන්න ආස හිතුණා. ඉතින් ජ්‍යේෂ්ඨ අලෙවි කළමනාකාරිනියක් විදියට සොෆ්ට්ලොජික් එකත් එක්ක එකතු වුණා. සොෆ්ට්ලොජික් එක 'සොෆ්ට්ලොජික් ලයිෆ්' කියලා අලුතින් පටන්ගත්තේ ඒ කාලේ. ඉතින් අපිට සම්පූර්ණයෙන්ම වගේ බ්‍රෑන්ඩ් එක ප්‍රොමෝට් කරන්න වුණා.

ඉන්ෂුවරන්ස් කිව්වහම ලංකාවේ තිබුණේ හරි අමුතු දෙයක්. දරුවා බලාගෙන ඉන්දැද්දි තාත්තා මැරෙන එක තමයි ප්‍රොමෝට් කළේ. ඒ සංස්කෘතිය වෙනස් කරන්නයි මට ඕන වුණේ. ඍණාත්මකව තිබුණු ඒ දේ ධනාත්මක විදියට වෙනස් කළා. ඒ නිසාම මේ බ්‍රෑන්ඩ් එක ලංකාවේ ඉහළම තැනකට ගේන්න පුළුවන් වුණා."

මම වාසනාවට වඩා මහන්සිය විශ්වාස කරන කෙනෙක්. සාර්ථකත්වය වෙනුවෙන් මම ගොඩක් මහන්සි වෙලා වැඩ කළා

කවීගේ ආගමනයත් එක්ක සිද්ධවෙච්ච ඒ වෙනස්කම්වලින් පස්සේ ඇගේ ආයතනයට සම්මාන රාශියක් ලැබෙනවා. හැබැයි ඒ හැම කටයුත්තක් පිටිපස්සෙම ඇගේ කණ්ඩායමත් හිටිය බව විශේෂයෙන්ම ඇය මතක් කළා.

"ආයතනයට ලැබුණු සම්මානවලට අමතරව 'Women Top 50' සම්මාන උළෙලේ 2022 වසරේ හොඳම අලෙවිකරු සම්මානය දිනාගන්නත් මට පුළුවන් වුණා."

මේතාක් වෙලා ඇය කතා කළේ සාර්ථකත්වය ගැන. ඒ පිටිපස්සේ තිබුණු මහන්සිය, කැපකිරීම් ගැනයි දැන් කවී කියන්නේ.

"මම වාසනාවට වඩා මහන්සිය විශ්වාස කරන කෙනෙක්. සාර්ථකත්වය වෙනුවෙන් මම ගොඩක් මහන්සි වෙලා වැඩ කළා. අවුරුදු 26 ඉඳලා මට මයිල්ඩ් ස්කොලියෝසිස් කියන කොන්ද ආශ්‍රිත ආබාධය තියෙනවා. තුන් තැනකින් කොන්ද නැවිලායි තියෙන්නේ. 2014 මම ඇස්ට්‍රා බ්‍රෑන්ඩ් එක කරන කාලෙදි මගෙ කොන්දේ අමාරුව වැඩිවුණා. මේකට සැත්කමක් කළොත් මට ඇවිදින්න බැරිවෙන්නත් පුළුවන්. ඒ නිසා කොන්දේ මස් දියකරලා කරන ආයුර්වේද ප්‍රතිකාරයක් කළා. ඒ දවස්වල මම නොසෑහෙන වේදනාවක් වින්ද. කාලයක් ඇවිදගන්නත් බැරිවුණා. හැබැයි ඒ අතරෙත් මම මගේ වැඩ කළා. බිත්තියට වාරුවෙලා ඔෆිස් ගියපු කාලෙකුත් තිබුණා. තරමක් හොඳ වුණත් තාමත් මගේ රෝගය සුව නැහැ. හැබැයි ඒ ගැන හිත හිතා ඉන්නේ නැතිව මම හැම වැඩක්ම කරගන්නවා."

ඒ දරාගැනීම ගැන කවී කතා කළේ බොහොම ආඩම්බර ලීලාවෙන්.

"මාකටින් එකේ ප්‍රධානියා වෙනකොට මට ලොකු වයසක් නැහැ. ඉතින් මම තරුණ ගැහැනු කෙනෙක් නිසා මම කියන දේවල් පිළිගන්න සමහරු අකමැති වුණා. 'ඔයා දන්නේ නැහැ, ඔයාට තේරෙන්නෙ නැහැ' කියලා මූණටම කියලා තියෙනවා. ඉතින් අනිත් අයට යමක් තේරුම් කරවන්න පිරිමි කෙනෙක්ට වඩා වැඩියෙන් මහන්සි වෙන්න වෙච්ච තැන් තියෙනවා. අනික ගෑනු කෙනෙක් වුණහම හරි සියුම්වට යටහත් පහත්වට කතා කරන්න ඕන කියලා මතයක් තියෙනවනේ. ප්‍රධානියෙක් විදියට රාජකාරි වැඩවලදි අපිට උස් හඬින් කතා කරන්න වෙන තැන් තියෙනවා. හැබැයි ඉතින් ඒක ඒ වෙලාවට විතරයි. ඒත් පුරුෂ පාර්ශවයේ අය ඒ දේවල් හිතේ තියාගෙන ඉන්නවා. ගෑනියෙක්ගෙන් බැනුම් අහන එක මදිකමක් කියලා ඒ අය හිතනවා වෙන්නත් පුළුවන්."

මොනතරම් කැපකිරීම් කරලා ඉහළට ගියත් ලොකු පුටුවල ඉන්න ගොඩක් බවලතියන්ට අහන්න වෙන්නේ වෙන කයිකතන්දර. ඒ ගැන කවී කිව්වේ මෙහෙම කතාවක්.

"ගෑනු කෙනෙක්ට රස්සාවක් කරන එකත් ලේසි වැඩක් නෙමෙයි. බොත්තමක් ගැලවිලා තිබුණත් අමුතු විදියටනේ බලන්නේ. උඩ පුටුවකට ගිය ගමන් අපෝ මෙයා වැරදි පාරෙන් ආපු කෙනෙක් කියලා කියනවා. කියන්නම දෙයක් නැත්නම් පදයක් හදලා හරි කියනවා. මම කරලා තියෙන වැඩ සහ සුදුසුකම් එක්ක කිසිම කෙනෙක්ට මගේ හැකියාව ගැන ප්‍රශ්න කරන්න බැහැ. ඒ නිසා මගේ චරිතයට ඒ වගේ කතා හැදිලා නැහැ. අනික කවුරු මොන දේ කිව්වත් පිරිමි එක්ක කරට කරට වැඩ කරන්න මට හයියක් තියෙනවා."

අනිත් අයට ඕන විදියටම ජීවත් වුණොත් වයසට ගිහිල්ලා ආපස්සට හැරිලා බලද්දි අපේ ජීවිතවල අපි ජීවත්වෙලා නැහැ කියලා දැනෙයි. ඒ නිසා අනිත් මිනිස්සු කියන ඒවා ගොඩක් ඔලුවට ගන්න යන්නත් එපා

කවී රාජපක්ෂ ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේත් (SLIM) සාමාජිකාවක්. SLIM එකත් එක්ක මේ දවස්වල ඇය රට වෙනුවෙනුත් අලුත් ව්‍යාපෘතියකට අතගහලා.

"දැන් හිතන්නකෝ ජපානය කිව්වහම අපේ ඔලුවට එන්නේ 'ජපනා හපනා' කියන එක. ඇමරිකාව කිව්වහම 'ලෝකයේ බලවත්ම රට.' මේවා ඒ අය දවසින් දෙකෙන් අපේ ඔලුවලට දුපු දේවල් නෙමෙයි. රටක් බ්‍රෑන්ඩ් එකක් විදියට මාකට් කරන එකත් සූක්ෂම විදියට කරන්න ඕන වැඩක්. SLIM එකෙන් රටට ජාතික සන්නාමකරණයක් හදන වැඩක් පටන්ගත්තා. ඒ ව්‍යාපෘතියේ ප්‍රධානියා විදියට වැඩ කරන්නේ මම. මේක පසු ප්‍රතිලාභ බලාපොරොත්තු නොවී අපේ රට ලෝකෙට අරගෙන යන්න අලෙවිකරණ ක්ෂේත්‍රයේ දක්ෂයෝ ටිකක් එකතු වෙලා කරන වැඩක්."

බ්‍රෑන්ඩ් එකක් වෙලා අපේ රට ලෝකෙට අරගෙන යන්න කරන ඒ උත්සාහයට කතාව අතරතුරදිම අපිත් සුබ පැතුවා. වෘත්තිය කතාවලින් පස්සේ ඇගේ පෞද්ගලික ජීවිතේ කළමනාකරණය කරගන්න හැටිත් ටිකක් කතා කළා.

"මම උයන්න සෑහෙන කැමැති කෙනෙක්. රසට උයන්නත් පුළුවන්. කොච්චර කාර්යබහුල වුණත් ගෙදර වැඩ ටික මගේ අතින්ම කරන එකෙන් මට ලොකු තෘප්තියක් ලැබෙනවා. ඒ වැඩවලට අමතරව මම මහනවා, චිත්‍ර අඳිනවා, ඩාන්ස් කරනවා. සමහර ආයතන ප්‍රධානියෝ ඉන්නවා එයාලගේ පෞද්ගලික පීඩන පවා යවන්නේ ඔෆිස් එකේ ටීම් එකෙන්. මට ස්ට්‍රෙස් එකක් ආපු හැටියේ මම කරන්නේ මැහුම් ගෙතුම් කරන එක. ඒකෙන් මගේ ස්ට්‍රෙස් එක අඩුවෙනවා වගේම නිර්මාණශීලීත්වයත් වැඩි වෙනවා."

දැන් කාලේ ගොඩක් කාන්තාවන් අධ්‍යාපනය පැත්තෙන් ඉහළට යන නිසා මැහුම් ගෙතුම්, ඉවුම් පිහුම් වගේ දේ ඉගෙනගන්න අවශ්‍ය නැහැ වගේ මතයක් තියෙනවනේ. හැබැයි ඉගෙනගන්න ඒ කිසිම දෙයක් අහක දාන්න වෙන්නේ නැහැ කියලයි ඇය කිව්වේ.

"ආදරේ කරන අයගෙන් ඇගයීම්, ප්‍රශංසා ලබාගන්න ගෑනු හරි කැමතියි. තමන් ආදරේ කරන අයට තමන්ගේ අතින් කාර්ඩ් එකක් හදලා දුන්නහම, රස කෑමක් හදලා දුන්නහම ඒ ලැබෙන අගය කිරීම සල්ලිවලට ගන්න බැහැ. මම කවදාවත් මගෙ අයට කඩෙන් කාර්ඩ් අරගෙන දීලා නැහැ. අනිවාර්යයෙන්ම මම්ම හදනවා. ඒකෙන් මටත් ලොකු සතුටක් දැනෙනවා."

'අපිට අයින් කරන් පුළුවන් හොඳම බර අනිත් අයගේ අදහස්වල බරයි.' පත්තරේ සාකච්ඡාවට කතා කරන්න කවීගේ දුරකතන අංකය සේව් කරගත්තහම ඇගේ වට්සැප් එකේ පේන්න තිබුණු ඔය කතාවේ තේරුම ගැනත් මම ඇගෙන් අහලා බැලුවා.

"ගෑනු අගය කරනවට හරි කැමතියි කියලා කිව්වනේ. ඒ වගේම තමයි පිරිමින්ට වඩා අනිත් අය කියන දේවල්වලින් ඔලු නරක් කරගන්නත් ගෑනු හරි දක්ෂයි. වෙන මිනිස්සු කියන ඒවා 100%ක්ම ගණන් නොගෙන ඉන්න ගෑනුන්ට බැහැ. මොකද ඒක මනෝවිද්‍යාත්මකයි. ඒ නිසා ඒ ගන්න ප්‍රතිශතය අඩු කරගන්නයි උත්සාහ කරන්න ඕනේ. අනිත් අයට ඕන විදියටම ජීවත් වුණොත් වයසට ගිහිල්ලා ආපස්සට හැරිලා බලද්දි අපේ ජීවිතවල අපි ජීවත්වෙලා නැහැ කියලා දැනෙයි. ඒ නිසා අනිත් මිනිස්සු කියන ඒවා ගොඩක් ඔලුවට ගන්න යන්නත් එපා.

තව දෙයක්. කොච්චර සාර්ථක වුණත් නැති දේ ගැන හිතලා දුක්වෙන අය ඉන්නවා. සාර්ථක කෙනෙක්ව දැක්කහම අනේ මෙයා වගේ මටත් ඉන්න පුළුවන්නම් කියලා කෙනෙක් හිතනවා. හැබැයි අපි නොදන්නවා වුණාට අර කෙනා හිත ඇතුළෙන් දුකෙන් ඉන්නවා වෙන්නත් පුළුවන්.

එක එක්කෙනා සාර්ථකත්වය මනින විදිය වෙනස්. කෙනෙක්ට සාර්ථක ගැහැනියෙක් කියන්න එයා ලොකු පුටුවක ඉන්න කෙනෙක් වෙන්නම ඕන නැහැ. මාවයි, නංගිවයි හොඳ තැන්වලට ගෙනාපු එක තමයි මගේ අම්මගේ සාර්ථකත්වය. ඒ නිසා නිතරම නැති දේ ගැන නොහිතා තියෙන දේවල් ගැන හිතන්න. දුක, සතුට කියන්නේ තෝරාගැනීමක්. ඉතින් නිතරම සතුට තෝරගන්න."

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි
ඡායාරූප - ක්‍රිෂාන් කාරියවසම්

පාසල් පිහිනුම් පොත අලුත් කරන පුංචි දියකිඳුරිය

වන්දනී

අක්කා පිහිනුම් ක්‍රීඩාවේ නිරතවන අයුරු බලාසිටි පුංචි වන්දනීගේ සිතද එතැන නතරවිනි. ඇයට ඕනෑවූයේ අක්කා මෙන්ම පුංචි දියකිඳුරියක සේ ඒ මේ අත පිහිනා යන්නටය.

එසේ පිහිනුම් ක්‍රීඩාව අරඹනවිට වන්දනීගේ වයස යන්තම් අවුරුදු හතකි. ඇය ඒ වනවිට ඉගෙනුම ලබමින් සිටියේ කලුතර බාලිකා විද්‍යාලයේ දෙක වසර පන්තියේයි. හැමදම හවසට විද්‍යාල පිහිනුම් තටාකයේ දැරියන් පිහිනුම් කටයුතු කරද්දී වන්දනීත් අම්මා සමගින් එතැනට යන්නේ අක්කා පිහිනන හැටි බලන්නටය.

"මටත් පිහිනන්න ඕනේ..." මෙසේ අම්මාට පමණක් ඇසෙන්නට මුලදී කී වැකිය, පුහුණුකරු කැෂියන් වික්‍රම මහතාගේ කනට යන්නටද වැඩි දවසක් ගියේ නැත. ඒ අනුව එවකට විදුහපල්පතිනිය, ආචාර්ය මණ්ඩලයේ ගුරු මහත්ම මහත්මීන්ගේ ආශිර්වාදයෙන් පුහුණුවට පැමිණි පුංචි දියකිඳුරිය පී.රවින්යා වන්දනී ප්‍රනාන්දු ය. ඇය තවමත් දහතුන් හැවිරිදිය. ඉගෙනුම ලබන්නේ නවය වසර පන්තියේයි.

මෙවර වයස 14න් පහල සමස්ත ලංකා පාසල් පිහිනුම් ශූරිය ඇයයි

එදා ඇවිටිලිකොට දියට බැස්සත්, ඇය දැනටම පුංචි දීපිකා ෂන්මුගම් කෙනෙකි. වාර්තා පිට වාර්තා තැබූ දීපිකා ෂන්මුගම් පිහිනුම පුහුණුවන්නේ බිෂොප් විද්‍යාලයේ ප්‍රාථමික අධ්‍යාපන ලබමින් සිටියදීය. 1972 වසරේ උපන් ඇය 1991 වසරේ කොළඹදී පැවති පස්වන සාෆ් ක්‍රීඩා උළෙලේදී මීටර් දෙසීය නිදහස් ආර, මීටර් 100 සහ 200 පසුපස ආර සහ ළය ආර ඉසව්වලින් නව වාර්තා පහක් සමගින් එදා ඇය රන් පදක්කම් හතක් දිනාගත්තාය. ඒ වාගේම ඔලිම්පික් ක්‍රීඩා උළෙලක ලංකාව නියෝජනය කරමින් පිහිනුම් ක්‍රීඩාවක නිරත වූ පළමු ක්‍රීඩිකාවද වන්නීය.

ෂන්මුගම් ක්‍රීඩිකාව එදා පෑ දස්කම් මතක් කළේ, වන්දනීටත් කැපවීමෙන් ඒ මග යෑමට අවස්ථාවක් ඇති හෙයිනි.

"මං 2018 වසරේ 45 වන ශ්‍රී ලංකා පාසල් ජල ක්‍රීඩා ශූරතාවලියේ වයස අවුරුදු නවයෙන් පහළ මීටර් 50 නිදහස් ආර හා පසුපස ආර ප්‍රථම ස්ථානය ලබාගත්තේ නව තරඟ වාර්තා දෙකකුත් එක්කයි. එහිදී මීටර් 200 කේවල මිශ්‍ර ආර ප්‍රථම ස්ථානයත් එක්ක සමස්ත ශූරතාවයම මට ලබාගන්න පුළුවන් වුණා."

පුහුණුකරු සමග

වන්දනී එසේ වදන් එක්කළාය. ඇයගේ පදිංචිය, බේරුවල නල්ලහේන ගම්මානයයි.

වන්දනීගේ සහෝදරිය දැන් විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන අතර සොයුරා මතුගම සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නන්ගර විද්‍යාලයේ උසස් පෙළ සිසුවෙකි. වන්දනීගේ පියා සුළු ව්‍යාපාර කටයුත්තක නියැලෙමින් පවුලේ අවශ්‍යතා මෙන්ම දරුවන්ගේ අධ්‍යාපන කටයුතුද සාර්ථක කරගැනීමට උරදෙමින් හිඳී. ඒ අතර වන්දනී පිහිනුම් ශූරියක කරන්නටද දැන් ඒ අම්මාටත් තාත්තාටත් සිහිනයක් තිබේ.

"ඇත්තටම දුව පුංචි කාලේ අනෙක් දරුවෝ දෙන්නට වඩා හරිම දඟයි. දුවනවා පනිනවා. ඉතින් ක්‍රීඩාවකට යොමු කරන්න අපි හිතුවා. ඒත් එයාම තමයි අක්කා පුහුණු වෙනවා බලන්න ගිහින් ඉඳලා මේ ක්‍රීඩාව තෝරාගත්තේ. ඉතින් එයා පිහිනුම් තරඟවලින් ඉදිරියට යාවි කියන බලාපොරොත්තුව දුවගේ පුහුණුකරු වන කැෂියන් වික්‍රම සර්ට වගේම පාසලේ වර්තමාන විදුහල්පතිනිය වන තුෂිනි වීරකෝන් මහත්මිය ඇතුළු ගුරු මහත්ම මහත්මීන් තුළත් බලාපොරොත්තුවක් ඇතිවෙලා තියෙනවා."

ඒ වන්දනීගේ මව ඩබ්ලිව්. හේමමාලි ප්‍රනාන්දුය. වන්දනී පසුපස සිටින සෙවනැල්ල ඇයයි.

දිනෙන් දින පුහුණුවෙන් ඉහළට එමින් සිටින වන්දනී මේ වනවිට ජාතික මට්ටමේ ජයග්‍රහණ රැසක් ලබාගෙන තිබේ. ඒ අතර මෙවර පැවති 47 වන සමස්ත ලංකා පාසල් ජල ක්‍රීඩා උළෙලේ වයස 14න් පහල සමස්ත ශූරතාවය දිනාගැනීමට සමත්වූයේද වන්දනීය. එහිදී මීටර් 50 නිදහස් ආර ප්‍රථම ස්ථානයත්, මීටර් 50 පසුපස ආර නව තරඟ වාර්තාවක් සමඟ ප්‍රථම ස්ථානයත්, මීටර් 100 පසුපස ආර තරඟයෙන් ප්‍රථමයා වීමටත් ඇය සමත් වූවාය.

කොතරම් පිහිනුම් පුහුණුවට කාලය වැය කළද විෂය කටයුතුද වන්දනී මග හරින්නේ නැත. ඒ වාගේම ඇය විවිධ නිර්මාණ කරන්නටද දක්ෂය. ගෙදර බිත්ති සැරසිලිවලින් කිහිපයක්ම හැඩවූයේ ඇය අතිනි.

ඒ සියල්ල මැද වන්දනීට ඇති ලොකුම සිහිනය නම් පිහිනුමයි.

"දවසක මගේ රට වෙනුවෙන් ක්‍රීඩා කරන්න මට ලොකු ආසාවක් තියෙනවා. ඒ වෙනුවෙන් කැපවීමෙන් පුහුණු වෙන්න වගේම හොඳින් ඉගෙනුම් කටයුතුවල නිරත වෙන්නත් මං කැමතියි."

ඒ සිහිනයට යාමට වන්දනී සූදානම්ය. ඒ මග සරසන්නට ඔබටද හැකිය. ඒ ඇයට ආශිර්වාද කිරීමෙනි. එය අනාගතයේ දවසක ජාතික මට්ටමින් ඇය ලබන ජයග්‍රහණයන්ටද හේතුවනු ඇත.

■ දීපා වසන්ති එදිරිසිංහ

13 වැනියාගේ දුව නොහිටින්න හැරී පෝටර් කියලා පොතක් මුද්‍රණය නොවෙන්න තිබුණා

ජේ.කේ.රෝලින්ග්

'ජේ.කේ.රෝලින්ග්' (J.K.Rowling) ගැන නොදන්නා කෙනෙකුට සමාවක් දුන්නද 'හැරී පෝටර්' (Harry Potter) ගැන නොදන්නා කෙනෙකුට නම් එසේ සමාව දිය නොහැකිය. ඒ ලොව වැඩිම අදායම් ඉපැයූ චිත්‍රපට මාලාව ලෙස 'හැරී පෝටර්'තවමත් පෙරමුණේ සිටින බැවිනි. 'හැරී පෝටර්' ග්‍රන්ථ මාලාව රචනා කළේ අප මුලින් කී ජේ.කේ.රෝලින්ග් ය. ලොව පුරා භාෂා හැටකට අධික ප්‍රමාණයකට පරිවර්තනය වී ඇති මේ ග්‍රන්ථ මාලාවේ මිලියන 450කට එහා පිටපත් ප්‍රමාණයක් අලෙවි වී ඇත. නමුත් එතරම් සාර්ථකත්වයක් අත්පත් කරගත් මේ පොතේ කතුවරියගේ ඉතිහාසය නම් එතරම් සතුටුදායී එකක් නොවේ. අඳුරු අතීතයක් පසුකර විත් ලොව සුප්‍රසිද්ධම සහ ධනවත්ම ලේඛිකාවක් බවට පත්වූ එකී ලේඛිකාව, ජේ.කේ.රෝලින්ග් ගැනයි මේ කතාව.

1965 ජූලි 31 වැනිදා එක්සත් රාජධානියේ උපන් ජේ.කේ.රෝලින්ග්ට පුංචි කාලයේ පටන්ම හරි අපූරු විනෝදාංශයක් තිබුණේය. අතට අහුවෙන පොතක්, පත්තරයක් හෝ ඕනෑම කොළ කැබැල්ලක් කියවීම ඇගේ ඒ විනෝදාංශයයි. ආරේ ගති නෑරේ කියන්නාක් මෙන් ඇගේ මව ද ඉඩක් ලද හැම මොහොතකම පොත්පත් කියවන ගැහැනියක් වීම ඊට හේතුව වුවා විය හැකිය. කෙසේ නමුත් වයස අවුරුදු හයක් පමණ වනවිට රෝලින්ග් කියවීමෙන් නොනැවතී යම් යම් දේවල් ලියන්නටද පටන්ගත්තාය. ඇගේ පුංචි වයසට වඩා පැහැනු ඒ ලියවිලි බොහෝවිට හැඩවුණේ කුතුහලය පිරි අභිරහස් කතන්දරවලිනි. ඒවා කියවූ ඇගේ මව ඇතුළු පවුලේ සියලුදෙනාම අනාවැකි කීවේ ඇය නම් මතු යම් දිනෙක ලේඛිකාවක වනු ඇත කියාය.

"හැබැයි අවුරුදු 15ක් විතර වෙනකොට මට හිතාගන්න බැරි දෙයක් සිද්ද වුණා. මගේ අම්මට සුසුම්නාව සහ ස්නායුගත ආබාධ තත්ත්වයක් තියෙනවා කියලා මට දැනගන්න ලැබුණා. ඇත්තටම ඒක මට දරාගන්න බැරිවුණා. මං ඒ වෙනකොට 'හැරිපෝටර්' පොත ලියන්න හිතාගෙනයි හිටියේ. ලියන්න ඕන හැම වචනයක්ම හිතේ තිබුණා. ඒත් අම්මගේ අසනීපය දැනගත්ත වෙලාවේ ඉඳන් මට ඒකට හිත හදාගන්න බැරිවුණා."

කාලය ගතවෙමින් ගොස් 1990 සීතල දෙසැම්බරයත් උදා විය. නමුත් හිමකැටි වැටෙන ඒ සීතලේ රෝලින්ග්ගේ ලෝකයට තිබුණු ලොකුම උණුහුම හොරු අරන් ගියාක් මෙන් අතුරුදන්ව ගියේ ඇගේ මව සදහටම දෑස් පියාගත් බැවිනි.

"මං ගොඩාක් ආසාවෙන් හිටියා ලියන්න යන පොත ගැන අම්මට කියන්න. ඒත් අම්මා මැරෙන්න කලින් මට හැරී පෝටර් ගැන කියන්න බැරිවුණා. ඒකට ඕනතරම් අවස්ථා තිබුණා. ඒත් මං ඒක කළේ නෑ."

එය වේදනාවක් වුවත් හිතේ තිබූ බලාපොරොත්තු උදුරා දැමීමට ඒ වේදනාවට පුළුවන්කමක් තිබුණේ නැත. වේදනාව හිතේ හිරකරගෙන ඇය පොත ලිවීමට පටන්ගත්තාය. ඒ අල්ලපනල්ලේම ඇගේ පෙම්වතාද ඇය හැරයාමට තීරණය කර තිබූ නිසා බලාපොරොත්තු නොවූ මොහොතක ඇය විෂාදය තත්ත්වයට පත්විය.

"ඊටපස්සේ මම පෘතුගාලයට ගියා. එහෙදි මට පෘතුගීසි ජාතික රූපවාහිනී මාධ්‍යවේදියකු වුණු ජෝජේ ඇරන්ටස් මුණගැහුනා. ඒ හමුවීම විවාහයකින් කෙලවර වුණා. 1992 ඔක්තෝබර් මාසේ 16 වැනිදා තමයි අපි විවාහවුණේ. ටික කාලෙකින් මට ගෑනු දරුවෙක් ලැබුණා."

නමුත් ඇරන්ටස් හා ගෙවූ යුග දිවියත් රෝලින්ග්ට නීරස එකක් විය.

"ඒක හිතපු තරම් ලස්සන විවාහ ජීවිතයක් වුණේ නෑ. එයා මට ගොඩාක් හිරිහැර කළා. අන්තිමේ මං පොලිසි ගියා. මට උවමනාව තිබුණේ දරුවා මට අරන් ඇරන්ටස්ගෙන් වෙන්වෙන්න. මට ඒක කරගන්න පුළුවන් වුණා.

පස්සේ මං දරුවත් එක්ක අලුත් ජීවිතයක් ගතකරන්න හිතාගෙන ආපහු මගේ රටට ඇවිත් කුලියට ගෙයක් අරන් පදිංචි වුණා. මමයි දරුවයි ජීවත්වුණේ රජයෙන් ලැබෙන සහනාධාරවලින්. ඒක හරිම දුෂ්කර කාලයක්. අපි හිටපු ගෙදර අපායක්. මීයෝ කැරපොත්තෝ පිරිලා. ඒ අතරේ සැරයක් දෙකක් ඇරන්ටස් දරුවා ඉල්ලගෙන ආවා. ඒත් එයාට දරුවා අරන් යන්න මං ඉඩ දුන්නේ නෑ."

ඒ රෝලින්ග්ගේ ජීවිතයේ අමාරුම කාලයයි. දැඩි මානසික ආතතිය නිසා වරක් ඇය දිවි නසාගැනීමට පවා උත්සාහ කර තිබුණි. නමුත් ඇගේ එකම අපේක්ෂාව වූයේ කුඩා කල සිටම සිහින මවමින් උන් හැරී පෝටර් පොත ලියා අවසන් කිරීමයි.

"මං අත් පිටපත ලියලා ඉවර කළා. ඒත් ඒක පොතක් විදියට මුද්‍රණය කරන්න කවුරුත් උදව් කළේ නෑ. මං ගොඩාක් පොත් ප්‍රකාශකයින් හොයාගෙන ගියා. ඒත් ඒ හැමෝම හැරී පෝටර් පොත ප්‍රතික්ෂේප කළා. ඒ දවස්වල මං හිටපු ගෙදර ලියුම් පෙට්ටිය පිරුණේ පොත ප්‍රතික්ෂේප කරලා එවලා තිබුණු ලියුම්වලින්."

පොත් ප්‍රකාශකයින් දෙළොස්දෙනෙකුගේ ප්‍රතික්ෂේප වූ පසුත් ඈ හැරී පෝටර් පොත රැගෙන තවත් පොත් ප්‍රකාශකයෙකු සොයා ගියාය. පසුව ඔහු ඉදිරියේ අසුන්ගෙන ඔහුට ඇසෙන්නට ඇය තමා ලියූ පොත කියවූවාය. නමුත් ඒ කතාව අසා සිටියේ ඔහු පමණක්ම නොවේ. එතැනට පැමිණි පොත් ප්‍රකාශකයාගේ අට හැවිරිදි කුඩා දියණියද දැහැනකට සම වැදුනාක් මෙන් කතාව අසා සිටියාය. ඇය ඉතා ආසාවෙන් එය අසා සිටින අයුරු දුටු පොත් ප්‍රකාශකයා හැරී පෝටර් මුද්‍රණය කිරීමේ කාර්යය බාරගත්තේ ඇයවද පුදුම කරමිනි.

සති කීපයක් පමණ ගතවිය. හැරී පෝටර් පළමු මුද්‍රණය දෙරට වැඩුනි. ප්‍රතික්ෂේප කළ සියලුදෙනාටම 'අනේ අපොයි' කියා සිතන්නට වැඩ සිද්ධ කරමින් එය මිලියන ගණනින් අලෙවි විය. ලැබූ ප්‍රසිද්ධිය සමඟ ඇය එම කතාව කතා මාලාවක් ලෙස නැවත නැවතත් ලිව්වාය. ඒ අතරවාරයේ හැරී පෝටර් පොත ඇසුරෙන් චිත්‍රපට මාලාවක්ද නිර්මාණය විය. ඒ චිත්‍රපට මාලාවම ඇමෙරිකන් ඩොලර් බිලියන ගණනින් ආදායම් ලබමින් සාර්ථක වූයේ ලෝකයේම පෙරළියක් සිදුකරමිනි. එපමණක් නොව භාෂා හැට ගණනකට එහා පරිවර්තනය වූ හැරී පෝටර් පොත නැවතුණේ ඇයව ලෝකයේ පොහොසත්ම ලේඛිකාවක බවට පත්කරමිනි.

"පරාජයේ භයානකකම මගේ ඉස්සරහා තිබුණු කඩයිම් ජයගන්න කියලා මට බල කළා. ජීවිතය අයෙමත් මගෙන් ලොකු කැපකිරීමක් ඉල්ලුවා. ඉතින් මං මගේ තිබුණු හැම ශක්තියක්ම එකට එකතු කරලා සාර්ථකත්වය වෙනුවෙන් විතරක්ම මහන්සි වුණා. මං මේ තරම් ශක්තිමත් ගැහැනියක් වෙන්න පදනම වුණේ ඒකයි."

සෑම අඳුරු වළාකවම රිදී රේඛාවක් ඇත්තා සේම රෝලින්ග්ගේ ජීවිතයේද රිදී රේඛාව වූයේ ඇගේ ලේඛන හැකියාවයි. දැඩි ප්‍රතික්ෂේප කිරීම් මෙන්ම අවාසනාවන්ත සිදුවීම් මැද ඇගේ ඒ හැකියාවට වාසනාවද කැටි වූ නිසා ඇය සාර්ථක වූවාය. පසුව ඇය යළිත් විවාහ ජීවිතයටද පිවිසියාය. මේ අතරවාරයේ ඇය තමා ලියූ පොතෙන් සල්ලිකාරියක වූ පසු එයින් සමාජයේ යහපත තකා බොහෝ දෑ කරන්නට විය. ඇය නිතරම අසරණ මිනිසුන්ට උදව් කළාය. සමාජයේ හඬක් අවැසි මිනිසුන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් නිර්භයව පෙනී සිටියාය. සංක්‍රාන්ති ලිංගිකයින්ගේ අයිතිවාසිකම් මෙන්ම ස්ත්‍රීන්ගේ අයිතිවාසිකම් උදෙසා ප්‍රමුඛත්වය ගත්තාය. ඒ නිසාම ඇය ලෝකයේ විශිෂ්ටතම සම්මාන ගණනාවකින්ම පිදුම්ද ලැබුවාය. නමුත් ඒ සියල්ල මැද ඇය නිතර නිතරම අපූරු කතාවක් කිව්වාය. ඒ සෑම අවස්ථාවකම ඇය දුටු අසාර්ථකම පුද්ගලයා ඇය බවයි. බොහෝවිට ඇගේ සාර්ථකත්වයේ රහසද ඒ සිතුවිල්ලම විය හැකිය. මන්ද එක් සාර්ථකවීමක් පසුපසම අසාර්ථක වීම් ගණනාවක්ම ඇති බව රහසක් නොවේ. හැරී පෝටර් ලියා ලෝකයම හෙල්ලූ ජේ.කේ. රෝලින්ග්ගේ කතාවෙන් කාට කාටත් උගතහැකි පාඩම එයයි.

මමයි දරුවයි ජීවත්වුණේ රජයෙන් ලැබෙන සහනාධාරවලින්. ඒක හරිම දුෂ්කර කාලයක්. අපි හිටපු ගෙදර අපායක් වගේ. මීයෝ කැරපොත්තෝ පිරිලා

■ රුවන් එස්.සෙනවිරත්න

පුද්ගලික සම්බන්ධතා ගත්තත්, රාජකාරී මට්ටමේ සබඳතා ගත්තත් බොහෝවිට අපි පුරුදුවී සිටින්නේ අගය කිරීමට හෝ ප්‍රශංසා කිරීමට වඩා චෝදනා කිරීමටයි. එසේත් නැතිනම් මැසිවිලි නැගීමටයි. එම සබඳතා නිසා සතුටු වෙන්නට කාරණා සියයක් ඇතත්, පසුතැවෙන්නට ඇති එක් කාරණාවක් හෝ මුල් කරගෙන අපි කරන්නේ සියල්ල අවුල් කරගැනීමයි. සැමියා දහම් සහ දරුවෝ තිදෙනා සමඟ ජපානයේ ජීවත්වන හෂිනි මනමේන්ද්‍ර ඇගේ ජීවිත අත්දැකීම් ඇසුරින් අපිට කියාදෙන්නේ විශේෂයෙන්ම 'පවුල' නමැති සම්බන්ධතාවයට මූලිකත්වය දීම සහ එය රැකගැනීමේ ඇති වැදගත්කමයි. එමෙන්ම ඕනෑම හොඳ හෝ නරක සිදුවීමකටම පසු සතුට විය හැකි කාරණා පමණක් ජීවිතයට එක් කරගැනීමෙන්, බලා සිටියදී පවුල් ජීවිතය සතුටින් පිරී ඉතිරී යන අයුරු ඇය කියන්නේ සතුටින් ජීවිතය දරණ ඇගේ ජීවන අත්දැකීම් සමුදාය මුල්කරගෙනය.

වෙනස් වෙන්න හේතු හදලා දීලා ඇයි දැන් වෙනස් වෙලා කියලා අහන්න එපා



සමහර ගැහැනු කියවන්න ගොඩක් දක්ෂයි. පොඩි ළමයි වගේ කියව කියව ඉන්න තියනවා නම් ඒ අයට වෙන මොකුත් ඕන නෑ. ඒත් එහෙම කියවන අයට අහන් ඉන්න කෙනෙකුත් ඕනේ. සවන්දෙන කෙනාටයි ඒ අය ගොඩාක්ම කිට්ටු වෙන්නේ. ඇතුම්කන් දෙන එක සම්බන්ධතාවයක් ඇතුළෙදි කොච්චර වටිනවාද කියලා මට දැනුණේ මගේ ජීවිතේ යම් යම් අත්දැකීම් නිසාමයි.

මමත් එහෙම ගොඩක් කියවන කෙනෙක්. දැන් කියෙව්වා ඇති පොඩ්ඩක් කටවහන් ඉන්න කියනකල් කියවනවා. සමහර වෙලාවට ඒක තවකෙනෙක්ට කරදරයක් කියලා දැනුණ අවස්ථාවලුත් නැතුවම නෙවෙයි. ඒත් මට එහෙම නොකියවා ඉන්න අමාරුයි. දහම් ගෙදර ආවම උදේ ඉඳන් වුණ හැමදේම නැවතිල්ලක් නැතුව කියන එක මගේ පුරුද්දක්. දුක, සතුට, විනෝදය එකතුවුණ කතා ගොඩයි කියන්න. සමහර වෙලාවට දහම් මං කියන දේවල් අහගෙන ඉන්නවද බලන්න මම කතාව අතරමගදි ප්‍රශ්නත් අහනවා. ඒවා නම් ඉතින් විනෝදෙට කරන්නේ.

ඉතින් ඔහොම දවසක් දහම් වැඩ ඇරිලා ගෙදර ආපුවාම මගේ හිත රිදුන සිද්ධියක් ගැන මං එයාට කියද්දි, ආව වෙලේ ඉඳන් කියවනවා පොඩ්ඩක් කටවහන් ඉන්න රෝසි කියලා කිව්වා. මට ඒක කොච්චර හිතට දැනුණද කිව්වොත් මං ආපහු වචනයක්වත් කතා කළේ නෑ. අහන දේට උත්තර දීලා හිටියා. ඇත්තටම මට කේන්ති ගියේ නැති වුණාට ටිකක් දුක හිතුණා. සාමාන්‍යයෙන් මං නින්දට යද්දි දුක හිතෙන දේවල් අමතක කරලා සතුටු හිතෙන දේවල් විතරක් මතක් කරගෙන නිදියන්නේ පහුවද උදේට හිනාවක් එක්ක ඇහැරෙන්න ඕන හින්ද. ඒත් එදා එහෙම වුණේ නෑ.

මං තොරතෝංචියක් නැතිව කියවන එක දහම්ට වදයක් කියලා හිතුණු නිසා ඊටපස්සේ මං මාවම හිර කරගත්තා. දන්නේම නැතුව දහම් වැඩ ඇරිලා එද්දි වෙනදා වගේ කියවන එක නැතිවුණා. දවසක් එයාම මගෙන් ඇහුවා ඇයි රේඩියෝ එක වැහිලා කියලා. එදත් මට දැනුණේ කියලා වැඩක් නෑ කියන හැඟීම. ඉතින් මං හිනාවෙලා නිකන් හිටියා.

දහම් මාසෙකට වතාවක් නිවාඩුවක් දලා මාත් එක්ක ඇවිදින්න යනවා. දරුවෝ ඉස්කෝලේ ගියාම ඒ පැය පහ අපි ඇවිදලා, එළියෙන් මොනවහරි කාලා දරුවෝ ගෙදර එන්න කලින් එනවා. එහෙම දවසක, දහම් කිව්වා **"මට ඔයා කියවන එක ඕනතරම් අහන් ඉන්න පුළුවන්, ඒත් අපිට අදළ නැති දේවල් කියවන්න එපා. ඔයාට හිත රිදුණේ අපිට අදළ නැති දේකට. ඒකයි එදා මං ඔයාට අරෙහෙම කිව්වේ. වෙනදා වගේ ඔයා අපි ගැන, දරුවෝ ගැන, උදේ ඉඳන් ඔයා කරපු දේවල් ගැන කියද්දි මට ඕනතරම් අහන් ඉන්න පුළුවන්. අපිට අදළ නැති දේවල්වලට හිත රිද්දන් මාවත් අවුල් කරලා ඔයත් අවුල් වෙනවා."** කියලා. මාත් එවලේ කිව්වා **"මට හිතෙන ඕන දෙයක් කියන්න ඉන්නේ ඔයා, ඔයා මට ඇහුම්කන් නොදුන්නාම මට දුක හිතුණා. ආයේ ඔයා එක්ක කිසි දෙයක් කියන්නේ නෑ කියලා මං තීරණේ කළා."** කියලා.

සමහර අවස්ථාවල ගැහැනියෙක්ගේ කියවීම ඇතුළේ තියෙන්නේ හිත නිදහස් කරගන්නවා වගේ හැඟීමක්. ඒක තේරුම් නොගන්න ගොඩක් පිරිමි ගැහැනුන්ව නිහඬ කරවනවා. ඊටපස්සේ අදාළ නැති දේ තියා අදාළ දේ කියන එකත් ගැහැනු අමතක කරනවා

එතකොට දහම් කිව්වා **"කිසිදෙයක් නෙවෙයි අදළ නැති දේ නොකියා ඉන්න."** එවලෙත් මං නිශ්ශබ්ද වුණා. මට කියන්න ඕන දේ කියන්න සුදුසු වෙලාව ඒක නෙවෙයි කියලා දැනුණ නිසා.

සමහර දේවල් තමන්ට කිට්ටු අය එක්ක කියවද්දී සමහරුන්ට අදළ දේ අදළ නැති කියලා වෙන්කරගන්න ඕනකමක් නෑ. දැනෙන හැඟෙන හැමදේම කියන්නයි ඕනේ. ඒක ගැහැනුන්ට වගේම පිරිමින්ටත් පොදුයි. සමහර අවස්ථාවල ගැහැනියෙක්ගේ කියවීම ඇතුළේ තියන්නේ හිත නිදහස් කරගන්නවා වගේ හැඟීමක්. ඒක තේරුම් නොගන්න ගොඩක් පිරිමි ගැහැනුන්ව නිහඬ කරවනවා. ඊටපස්සේ අදළ නැති දේ තියා අදළ දේ කියන එකත් ගැහැනු අය අමතක කරනවා.

එහෙම නිහඬ වෙන ගොඩාක් ගැහැනු දරදඬු වෙනවා. නැත්තම් මානසිකව වැටෙනවා. එහෙමත් නැත්තම් ඇහුම්කන්දෙන කෙනෙක්ව හොයාගන්නවා. ඒත් නැත්නම් අමාරුවෙන් හරි අදළ දේ විතරක් කියලා අනිත් හැමදේම හිතේ හිරකරගෙන ජීවත්වෙනවා.

හැබැයි මට දරදඬු වෙන්නවත්, මානසිකව වැටෙන්නවත්, ඇහුම්කන් දෙන කෙනෙක් හොයාගන්නවත් මං ඇතුළේ මාව හිරකරගන්නවත් ඕන වුණේ නෑ. හොඳම අවස්ථාවක් බලලා, දහම් මට නොතේරෙන දේ තේරුම් කරනවා වගේ මං දහම්ට එදා නොතේරුණු දේ තේරුම් කළා.

මට දැනෙන දේ කියන්න ඉන්නේ ඔයා විතරයි. ඉස්සර මට යාළුවෝ හොඳම යාළුවෝ කියලා දෙවර්ගයක් හිටියා. දැන් එහෙම නෑ. දැන් මට ඉන්න හොඳම යාළුවා ඔයා. ඔයා ගාව මට වෙනදු දැනෙන සැහැල්ලුව දැනෙන්නනම් මං දේවල් හිතේ හිරකරගෙන ඉන්නේ නැතුව නිදහස් කරගන්න ඕනේ. මං කැමති නෑ දවසක ඔයා මට කියනවාට මං වෙනස් වෙලා කියලා. එදට ඒ වෙනසට හේතුව ඔයාම තමා කියලා දැනගත්තාම ඔයාටම කළකිරෙයි.

ඊටපස්සේ මං මාවම හිර කරගත්තා. දන්නේම නැතුව දහම් වැඩ ඇරිලා එද්දි වෙනදා වගේ කියවන එක නැවතුණා

පස්සේ දහම් මගේ ඔලුව අතගෑවා. ඉතින් මට හිතුණා එයා මං කිව්ව දේ තේරුම්ගත්තා කියලා. ඒ වගේම මං දහම් කිව්ව දේත් හිතුවා. අපිට අදළ නැති, අනවශ්‍ය දේවල් කියවන්නෙ නැතුව ඉන්න ඕන කියලත්.

කසාද ජීවිතේ ඇතුළේ ඉගෙනගන්න කොච්චර දේවල් තියෙනවද කියලා එදා මට හිතුණා. මං නිහඬ වෙලා මට මාවම නැති කරගන්නවාට වඩා ගෑනු මෙහෙමයි, ගෑනුන්ගේ හැටි මෙහෙමයි, මාත් එහෙම සාමාන්‍ය ගෑනියෙක් කියලා ආදරෙන් තේරුම් කරලා දීලා වෙනදු වගේම සුපුරුදු විදියට ඉන්න ලැබුණ එකට ස්තූතිවන්ත වුණා.

ජීවිතේ වගේම කසාද ජීවිතේ අත්දැකීම්, අපිව ටිකෙන් ටික පරිණත කරනවා. ඉස්කෝලේ පොතපතෙන් ඉගෙනගත්ත දේට වඩා එදිනෙදා ලැබෙන අත්දැකීම්වලින් ජීවිතේට ලැබෙන පාඩම් ලොකු උදව්වක් වෙනවා කියලා මට දැනුණා.

ඇත්තටම අපි හිතනවට වඩා සමහර වෙලාවට පිරිමි අපිව ඉවසනවා, දරාගන්නවා. ඕනෑ එකයි එපා එකයි හැමදේම කියවන්න කලින් අපි ඒ ගැනත් හිතන්න ඕන කියලා මට හිතුණා.

■ හෂිණී මනමේන්ද්‍ර

මගේ පුතා මම දුන්නු කිරිවල ණය ගෙවලා ඉවරයි

එකල අංක 23 ජර්සිය ඇඳ ආරම්භක පිතිකරුවකු ලෙස ඔහු පිත්තත් රැගෙන ක්‍රීඩා පිටියට එන්නේ කොයි මොහොතේද එතැන් පටන් පන්දු යවන්නන්ට හුස්මක් කටක් ගන්නට ඉඩක් නැත. ඒ තරමටම පන්දු යවන්නන් ඉදිරියේ ඔහුගේ පිතිහරඹය අනුකම්පා විරහිතය. එපමණක් නොව මෙකී ක්‍රීඩකයාගේ දඟ පන්දුව හමුවේ මෙන්ම අතිවිශිෂ්ට පන්දු රැකීම හමුවේ ලෝකයේ නම ගිය පිතිකරුවන් රැසක්ම ඇඹරුණු අවස්ථා එමටය. තමන්ගේ නමින්ම ක්‍රිකට් ක්‍රීඩාවට පහරක් හඳුන්වාදුන් මේ ක්‍රීඩකයා වෙන කවුරුත් නොව ක්‍රිකට් පිටිය තුන් ඉරියව්වෙන්ම හෙල්ලූ ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ හිටපු තුන් ඉරියව් ක්‍රීඩක තිලකරත්න ඩිල්ශාන්ය. ඩිල්ෂාන් ගැන අපි නොදන්නා මේ කතාබහ ඔහුගේ ආදරණීය මව වන නන්දනී ප්‍රියලතා සමඟිනි.

ටී.එම්. ඩිල්ශාන්ගේ මව නන්දනී ප්‍රියලතා

මං එයාව ලැබෙන්න කළුතර, නාගොඩ ඉස්පිරිතාලෙට ගියේ මහා වැස්සේ පයින්. ඒ දවස්වල බයිසිකලයක්වත් අපේ ගෙදර තිබුණේ නෑ

ලෝක ප්‍රසිද්ධ ක්‍රිකට් ක්‍රීඩකයෙකුගේ අම්මා කෙනෙක් වීම කොයි විදියටද දැනෙන්නේ?

ඒක හරි අහිංසක සතුටක්. හැබැයි ඒ හැඟීම මෙහෙමයි කියලා කියාගන්න නම් මට තේරෙන්නේ නෑ.

පුංචි කාලේ ඩිල්ශාන් කියන්නේ හරිම අහිංසක දරුවෙක් කියන්නේ ඇත්තද?

අනේ ඔව්. දඟ වැඩකට කියලා කළේ මල්ලිලා නංගිලා ටික චුට්ටක් අවුස්සලා කෑ ගස්සපු එක විතරයි.

මල්ලිලා නංගිලා එක්ක ඩිල්ශාන්ගේ තිබුණු බැඳීම කොයි වගේද?

එයාට හිටියේ නංගිලා තුන්දෙනයි මල්ලියි. ඩිල්ශාන් තමයි වැඩිමලා. මං එයාට කතා කරන්නේ ලොකු පුතා කියලා. මං ගෙදර නැති වෙලාවට ඩිල්ශාන් තමයි ඒ අයව බලාගන්නේ. මට මතකයි දවසක් මං අසනීප වෙලා බෙහෙත් ගන්න ගිහින් එනකොට එයා මටයි තාත්තටයි පිඟානකට ලොකු බත් එකක් බෙදලා තියලා තව පිඟානකට බත් එකක් බෙදගෙන අනික් දරුවෝ හතරදෙනාට කවනවා. එදූ ඒ කවපු පිඟාන අදටත් මං පරිස්සම් කරලා තියෙනවා.

පුතා පුංචි කාලේ ඉඳන්ම බෝලවලට ආසයි කියන්නේ ඇත්තද?

ඩිල්ශාන්ගේ තාත්තා පාපන්දු ගැහුවා. ඉතින් මෙයාටත් ඒ හුරුව තිබුණා. යන්තම් ඇවිදින්න පුළුවන් වෙනකොට බෝලයක් දැක්කොත් පයින් ගහනවා. අපි කොහේ හරි ගියත් එයාට බෝලයක් තමයි ගෙනැත් දෙන්නේ. ඒ තරමටම බෝලවලට ආසයි.

එතකොට ඩිල්ශාන්ගේ පාසල් කාලය ගතවුණේ කොහොමද?

එයාගේ මුල්ම පාසල යාපනය සිංහල මහා විද්‍යාලය. ඊටපස්සේ ගම්පොල සහීරා කොලේජ් එකට ගියා. අන්තිමට ගියේ කළුතර මහා විද්‍යාලයට. ඒ කාලෙත් හරි අහිංසකයි.

ලංකාවේ තුන් පැත්තක තියෙන පාසල් තුනකට යන්න විශේෂ හේතුවක් තිබුණද?

අනේ ඒක මට කියන්න බැරිවුණා. ඩිල්ශාන්ගේ තාත්තා වැඩකළේ පොලිසියේ. ඉතින් එයාට මාරුවීම් ලැබෙන ගානේ අපිටත් ඒ ඒ පැතිවලට ගිහින් පදිංචි වෙන්න වුණා.

එතකොට ඩිල්ශාන් ක්‍රිකට්වලට උනන්දු වෙන්නේ කොයි කාලෙද?

ක්‍රිකට්වලට උනන්දු වුණේ කළුතර මහා විද්‍යාලයට යනකොට. ඒ දවස්වල ඉස්කෝලේ ඇරුණම එයා ගෙදර එන්නේ නෑ. මං ඉතින් පරක්කු ඇයි කියලා බලන්න ඉස්කෝලෙට යනවා. ඒ යනකොට මෙයා පිට්ටනියේ අයිනකට වෙලා ලොකු ළමයි ක්‍රිකට් ගහනවා බලාගෙන ඉන්නවා. ඉතින් මට තේරුණා එයාගේ ඇඟේ තියෙන්නේ ක්‍රිකට් කියලා. පස්සේ එයත් පාසලේ ක්‍රිකට් කණ්ඩායමට එකතුවුණා.

ක්‍රිකට් ගැහිල්ලක් හින්ද ඉගෙනීම් වැඩ අතපසු වෙනවා කියලා අම්මා එයාට බැනලා නැද්ද?

බැනලා නම් නෑ. ඒත් "ක්‍රිකට් ගහල හරියනවද පුතේ" කියලා අනන්තවත් අහලා තියෙනවා. මොකද ඒ කාලේ මට ක්‍රිකට් ගැන තේරුමක් නෑ. මට මතකයි එයාගේ පාසල් පුහුණුකරු සුනිල් සළුවඩන සර්. මං දවසක් සර්ටත් ගිහින් කිව්වා "ක්‍රිකට් නිසා පුතාගේ ඉගෙනීම් වැඩ පාඩුවෙයිද සර්" කියලා. එදූ සුනිල් සර් කිව්වා "අම්මා බයනොවී ඉන්න අම්මගේ පුතා ක්‍රිකට්වලින් ඉහළටම යනවා" කියලා. එදූ මං සර්ගේ ඒ වචනේ ගොඩාක් විශ්වාස කළා.

එහෙම අකමැත්තෙන් ක්‍රිකට් ගහන්න යවපු පුතා ජාතික කණ්ඩායමට තේරුණු දවසේ අම්මට මොකද හිතුණේ?

එදූ මට අදූ වගේ මතකයි. 1999 අවුරුද්දේ සිම්බාබ්වේ එක්ක ටෙස්ට් තරඟ සංචාරයකට තමයි පුතාව ජාතික කණ්ඩායමට කැඳවලා තිබුණේ. ඉතින් මං පවුලේ හැමෝටම කතා කරලා කිව්වා "ලොකු පුතා ක්‍රිකට් ටීම් එකට තේරිලා" කියලා.

*එදූ ඩිල්ශාන්ගේ මුල්ම තරඟයත් අම්මට අමතක නැතුව ඇති නේද?

ඒක කොහොම අමතක කරන්නද? එදූ පුතා නොදැවී ලකුණු 163ක් ගැහුවා. එයාගේ පළවැනි මැච් එක හින්දූ මටයි එයාගේ තාත්තටයි පුදුම සතුටුයි. මං දන්න තරමින් ඩිල්ශාන් ක්‍රිකට් නිසා වැඩිපුරම සතුටින් හිටියේ එදූ තමයි.

*එතකොට ඩිල්ශාන් ක්‍රිකට් නිසා වැඩිපුරම සංවේදි වුණු දවස අම්මට මතකයිද?

එයාට ක්‍රිකට් නිසා සංවේදී දවස් ඕනතරම් තියෙන්න ඇති. ඒත් කවදූවත් එයා ඒක අපිට පෙන්නුවේ නෑ. තනියම විඳදරාගත්තා. මොකද එයා හොඳටම දන්නවා එයාගේ කඳුළු අපට බලන්න බෑ කියලා.

ඒ වුණාට ඩිල්ශාන් ක්‍රිකට්වලින් සමුගත්ත දවසේනම් අම්මට දුක හිතෙන්න ඇති?

ඇත්තටම එදූ මට දුක හිතුණේ නෑ. මට ලොකු සතුටක් තමයි දැනුණේ. මොකද එයා ලොකු කැපකිරීමක් එක්ක තැනකට ඇවිත් ක්‍රිකට්වලින් සමුගත්තේ ලෝක පූජිත ක්‍රීඩකයෙක් විදියට. ඉතින් මට එදූ දුක් වෙන්න හේතුවක් තිබුණේ නෑ.

එතකොට ඩිල්ශාන් නිසා අම්මා වැඩිපුරම සතුටුවුණේ කවදද?

ඩිල්ශාන් නිසා මං වැඩිපුරම සතුටුවුණේ එයා ඉපදුණු දවසේ. එදා මට අමතක නොවෙන දවසක්. මං එයාව ලැබෙන්න කළුතර, නාගොඩ ඉස්පිරිතාලෙට ගියේ මහා වැස්සේ පයින්. ඒ දවස්වල බයිසිකලයක්වත් අපේ ගෙදර තිබුණේ නෑ. අද වෙනකල් එයා ඒ සතුට නැතිවෙන විදියේ වැඩ කරලා නෑ. වෙලාවකට මට හිතෙනවා ඩිල්ශාන් වගේ දරුවෙක් ලබන්න මං ගිය ආත්මේ කරපු පින මොකක්ද කියලා.

පුතා හින්දා ඒ කාලේ අම්මත් ඩිල්ශාන් තරමටම ප්‍රසිද්ධ වෙන්න ඇති නේද?

(සිනාසෙමින්) එදා විතරක් නෙවෙයි තාමත් මං පුතා නිසා ප්‍රසිද්ධයි. අදටත් මං කොහේ ගියත් "ඇන්ටි ඩිල්ශාන්ගේ අම්මා නේද" අහන පුතාලා දුවලා ඕනතරම් ඉන්නවා.

අම්මට පුතාලගේ 2014 විස්සයි විස්ස ලෝක කුසලාන ජයග්‍රහණයත් අමතක නැතුව ඇති?

මං ඒ තරඟය බලන්න ගියා. ඒ ජයග්‍රහණය අමතක නොවෙන එකක්.

එයාටම ආවේණික 'ඩිල්ස්කූප්' පහර ගැනත් අම්මට කියන්න දෙයක් ඇති?

ඒක එයාට ලොකු ගෞරවයක්. මොකද මං දන්න තරමින් ක්‍රීඩකයෙකුගේ නමින් එහෙම පහරක් නම් කරලා තියෙන්නේ පුතාට විතරයි. පුතා ක්‍රිකට්වලින් සමුගත්තත් අලුත් ළමයි ඒ පහර ගහද්දි කියාගන්න බැරි සතුටක් දැනෙනවා. මොකද ඒ හැමවෙලේම පුතාගේ නම කියැවෙනවා.

එයා ක්‍රිකට්වලින් සමුගත්තේ ලෝක පූජිත ක්‍රීඩකයෙක් විදියට. ඉතින් මට එදා දුක් වෙන්න හේතුවක් තිබුණේ නෑ

මං හිතන්නේ පුතා මේ වගේ තැනකට එන්න ලොකු කැපකිරීමක් කරන්න ඇති නේද?

අපි ලොකුවට සල්ලිබාගේ තිබුණු අය නෙවෙයි. පුතා උදෙන්ම ක්‍රිකට් බඩු බෑග් එකත් කරේ වල්ලන් කිලෝමීටර් තුන හතරක් පයින් තමයි පුහුණුවීම්වලට ගියේ. මහ රෑ ආවෙත් පයින්මයි. සමහර වෙලාවට අපි යනවා මගට එයාව එක්ක එන්න. ඒ කාලේ එයා ගෙව්වේ දුෂ්කර ජීවිතයක්.

ක්‍රිකට්වලින් සමුගත්තට පස්සේ අපි දැක්කා ඩිල්ශාන් සිංදු කියනවා, රඟපානවා එහෙමත්?

සිංදු කියන එක නම් පොඩි කාලේ ඉඳන්ම කළා. මට මතකයි නංගිලා ටිකයි මල්ලියි වටේට තියාගෙන එයා සිංදු කිය කියා නටනවා. පුතා රඟපාන්න ආවේ නම් මංජුලාව බැන්දට පස්සේ තමයි. හැබැයි ක්‍රිකට් වගේම එයා ඒ දේවල්වලටත් දක්ෂයි කියලා පෙනුණා.

පුතාගේ ආදරණීය බිරිඳ මංජුලා තිළිණි ගැනත් වචනයක් කියමු නේද?

එයා මට මගේම දුවක් වගේ. මට හරිම ආදරෙයි. හැමදාම වගේ මට කෝල් කරලා දුකසැප අහනවා. පුතාට එයා වගේ බිරිඳක් ලැබුණේ වාසනාවට කියලයි මට හිතෙන්නේ. ඒ තරමටම දෙන්නට දෙන්නා ආදරෙන් ඉන්නවා.

ඩිල්ශාන්ට කටට රහට උයන්නත් පුළුවන්ලු නේද?

(සිනාසෙමින්) පොඩි කාලේ එයා මගෙත් එක්ක කුස්සියේ වැඩ කළා. කැවිලි එහෙම හදද්දි එයාටත් දෙන්න ඕන එකක් දෙකක් හදන්න. ඒ හින්දමද මන්දෘ උයන එක පුතා හොඳට අල්ලගත්තා.

*දැන් ඩිල්ශාන් පවුල් පිටින්ම ඉන්නේ ඕස්ට්‍රේලියාවේ. ඒ කියන්නේ එයාලා ලංකාව ඇතෑරලා ගිහින්ද?

ඔව්. එයාලා ඕස්ට්‍රේලියාවේ පදිංචියට ගියා. පුතා පේන්න නැති එක ගැන නම් දුකයි. ඒත් එයා කොහේ හිටියත් සතුටින් ඉන්නවා නම් මට ඒ ඇති.

අවසාන වශයෙන් අම්මට ඩිල්ශාන් ගැන කියන්න දෙයක් ඇති. අපි කියමුද?

ඩිල්ශාන් වගේ පුතෙක් ලැබුණේ කලින් කියපු විදියට මගේ පිනකට. එයා අන්තිමේ අපේ මුළු පවුලම එළිය කරපු පහනක් වුණා. එයා නිසා මං අද ලෝකේ සතුටින්ම ඉන්න අම්මා කියලා කියන්න පුළුවන්. ඒ වගේම තමයි කතාවක් තියෙනවා "අම්මෙක් දරුවෙක්ට දෙන කිරිවලට ණය ගෙවන්න කවදාවත්ම දරුවෙකුට බෑ" කියලා. ඒත් මං දුන්නු කිරට මගේ ඩිල්ශාන් පුතා ණය ගෙවලා ඉවරයි කියලා මට හිතෙනවා.

■ රුවන් එස්.සෙනවිරත්න

අට මසක දරුගැබක් දරාගෙන අවාරේ සිරිපා කරුණා කළා

දරුවා ලැබුණුදාට පහුවදා කොළඹ මම ඉඳපු රෝහලට සිරිපාදේ පෙණුනා

හොඳම වැඩේ කියන්නේ දරුවා ලැබුණු දවසට පහුවදා උදේ මං නැවතිලා හිටපු කොළඹ පුද්ගලික රෝහලට සිරීපාදේ පෙනුණා. එතැන හිටපු අය කිව්වා ගොඩාක් කාලෙකට පස්සෙලු සිරීපාදේ ඒ විදියට පෙනුණේ කියලා

අවාරයට සිරිපා නැඟීම සුදුසු නැත. විශේෂයෙන්ම ඒ කාලය තුළ එහි කාළගුණය තේරුම්ගැනීම අපහසුය. කලාතුරකින් එහි ගිය නඩයක් ඇරෙන්නට මිනිස් පුළුටක් එහි නැත. විදුලි ආලෝකයක් නැත. අනිත් කාරණය ඒ වනසතුන් එළිබහින කාලයයි.

අවාරේ සිරිපා කරුණා කළ යුතුයැයි මගේ හිත කීවේ අදක ඊයෙක නොවේ. ඒත් බාලගිරි දෝෂය මෙන් දිනෙන් දින කල් ගිය ඒ ආසාව ඉටුකරගන්නට ඉඩක් ලැබුණේ පසුගිය නොවැම්බරයේය. නමුදු මටත් මගේ සගයන් දෙපළටත් වය අවාරයක් කියා නොදැනෙන තරමටම සිරිපා කරුණා කරන්නට පැමිණි නඩ කීපයක්ම අප ගිය රත්නපුර - පලාබද්දල මාර්ගයේදී මුණගැසුනි.

දැඩි සීතලත් ඝන කළුවරත් මැද පොද වැස්සක් ගමනට බාධා කරද්දී බුදු සිරිපතුල වැඳ පුදා ගන්නට අප ඉහළට කරුණා කරමින් සිටියේ තරමක වේගයෙනි. එහෙත් නොසිතූ මොහොතක අපට ප්‍රතිවිරුද්ධ දෙසින් ආ සුරූපී තරුණියක් නිසා නොදැනුවත්වම අපේ ගමන බාල විය. අහිතකින් නොවුණත් මගේ ඇස් කෙළින්ම ගියේ ඉදිරියට නෙරා තිබූ ඇගේ කුස දිහාවටය. සැමියාද සමඟ හෙමින් හෙමින් පහළට කරුණා කරමින් සිටි ඇගේ දරුගැබට මාස අටකට වැඩි මිසක් අඩු නම් විය නොහැකි යැයි මා සිතුවෙමි. ඒ නිසාම මට ඇය සුවිශේෂීය. ඉතින් පත්තරකාරයෙකු වූ මා ඇගේ ගමනේ අග මුල නොවිමසා සිටින්නේ කොහොමද?

"මං මීට කලින් දෙතුන් සැරයක්ම සිරීපාදේ ඇවිත් තියෙනවා. ගිය සැරෙත් ආවා. හැබැයි ඒ ආවේ සිරිපා වාරෙට. ගිය සැරේ ආවට පස්සේ මට හිතුණා කවදහරි දරුවෙක් ලැබෙන්න ඉද්දි මං සිරිපා කරුණා කරනවා කියලා. දැන් ඉතින් මට දරුවෙක් ලැබෙන්න ඉන්නේ. බඩට මාස අටක් වෙනවා. ඒ නිසා වෙනසකටත් එක්ක අවාරේ සිරිපාදේ ආවා."

දැඩි අධිෂ්ඨානයක් හිතේ තදකරගෙන සිරිපා කරුණා කළ ඇය කැලණිය, කොටිකාවත්ත ප්‍රදේශයේ පදිංචි ඉරේෂා පූර්ණිමා නම් නීතීඥවරියකි. ඇය පෙරදා සිරිපා කරුණා කර තිබුණේ ඊට ඇති දුෂ්කරම මග වන කුරුවිට - චිරන්ත පාරෙනි. වර්ෂාව නිසා ඒ පාරේ බොහෝ තැන්හි දිය පහරවල් චිමටය. ඒ නිසාම අඩියෙන් අඩිය පාර ලිස්සන සුළුය. බැලූ බැලූ අත දණක් උසට වැවුනු තණපඳුරු නිසා හරියට පාරක් තොටක් පේන්නේද නැත. ඉතින් දරුවෙකු කුසදරා එවන් දුෂ්කර මගක් පසුකර පැමිණි ඇය ගැන මට පුදුමය.

"හිත ගැස්සුණු තැනුත් නොතිබුණාම නෙවෙයි. ඒත් සමන් දෙවියන්ගේ පිහිට ආරක්ෂාව හැමතැනදීම මට ලැබුණා කියලා මං විශ්වාස කරනවා. අනික සැමියයි මගේ යාළුවොයි හැමෝම නිතරම මගේ ළඟින්ම හිටියා."

අවාරයට සිරිපා නැඟීම සුදුසු නැත. විශේෂයෙන්ම ඒ කාලය තුළ එහි කාළගුණය තේරුම්ගැනීම අපහසුය. කලාතුරකින් එහි ගිය නඩයක් ඇරෙන්නට මිනිස් පුළුටක් එහි නැත. විදුලි ආලෝකයක් නැත. අනිත් කාරණය ඒ වනසතුන් එළිබහින කාලයයි. ඒ කාරණා සියල්ල අමතක කළද වැදගත් කාරණය ඇයට දරුවෙක් ලැබෙන්නට සිටීමයි. මගෙන් ඇයට ලැබුණු ඊළඟ ප්‍රශ්නය වූයේ එයයි.

"ඇත්තටම මං මේ ගමන ආවේ හොඳ සැලසුමක් එක්ක. මං මුලින්ම මගේ ඩොක්ටර්ගෙන් ඇහුවා මට මේ වගේ ගමනක් යන්න ඕන, ගියාට කමක් නැද්ද කියලා. ඩොක්ටර් කිව්වා ඕන තැනක යන්න, හැබැයි වැටෙන්න නම් එපා කියලා. ඊටපස්සේ මං ඩොක්ටර්ගෙන් ඇහුවා බබෙක් ලැබෙන්න ඉන්නකොට ඇවිදින්න එහෙම හොඳ නෑ කියලා කතාවක් තියෙනවා නේද කියලා. පස්සේ ඩොක්ටර් කිව්වා මොන බොරුද, කොච්චර ඇවිද්දත් කමක් නෑ කියලා. ඒ නිසා මේ ගමන ගැන මට පුංචි බයක්වත් තිබුණේ නෑ."



ඉරේෂා සිටි පෞද්ගලික රෝහලට උදෑසන ශ්‍රීපාදය දිස්වූ අයුරු

කෙසේවෙතත් අවාරේ සිරිපා යන කිසිවෙකුටත් උඩමළුව නම් විවෘත වන්නේ නැත. එය විදූ ඉඳන්ම පැවති සම්ප්‍රදායකි. නමුත් ඉරේෂාගේ හෝ ඇගේ කුසේ උන් දරුවාගේ වාසනාවට ඇයට විදූ උඩමළුවට ගොස් පද්මය වඳින්නට අවස්ථාවක් ලැබී තිබුණි.

"මොකක්දෝ වාසනාවකට වගේ පූජාවකට කියලා උඩමළුව ඇරලා තිබුණා. ඒ නිසා ආපු ගමන සම්පූර්ණයි කියලා හිතුණා. මං හිතනවා ඒ මේ බඩේ ඉන්න දරුවගේ වාසනාව කියලා."

ඇගේ සැමියාද ඉංජිනේරුවරයෙකි. අවසානයේ ඇය පවසා සිටියේ ඔවුන්ගේ රැකියාවන්හි ස්වාභාවයත් සමඟ මානසික නිදහස වෙනුවෙන් නිතරම ඔවුන් රට පුරාම මෙලෙසින් සංචාරය කරන බවයි.

කෙසේ හෝ චිම හමුවීමෙන් පසු සති හතර පහක් ගෙවී යන්නට ඇත. මගේ මතකයෙන්ද චිකී සිදුවීම අමතකව ගොස් තිබුණි. එහෙත් පසුගියදා 'දරුගැබක් කුස දරන් සිරිපා කරුණා කළ ලෝයර් අම්මා' නමින් සමාජ මාධ්‍යවල පල වූ සටහන් මගේ ඒ මතකය නැවත අවදි කළේය. ඉතින් මට සිතුණේම සිරිපා ගමනේදී ඇගෙන් ඉල්ලාගත් දුරකතන අංකයට ඇමතුමක් ගෙන බලන්නටය.

ඉරේෂා පූර්ණිමා

"ආ අපිව මතක් වෙලා තියෙන්නේ. දන්නවද දැන් ටික දවසකට උඩදි මට බබා ලැබුණා. එයා ගෑනු ළමයෙක්. කිසිම අමාරුවක් වුණේ නෑ. හොඳම වැඩේ කියන්නේ දරුවා ලැබුණු දවසට පහුවද උදේ මං නැවතිලා හිටපු කොළඹ පුද්ගලික රෝහලට සිරිපාදේ පෙනුණා. එතැන හිටපු අය කිව්වා ගොඩාක් කාලෙකට පස්සෙලු සිරිපාදේ ඒ විදියට පෙනුණේ කියලා."

මට වචනයක් හෝ කියන්නට නොදී ඈ කියවාගෙන යයි. එහෙත් ඇගේ කතාව මැද්දෙන් පැන හෝ මට අහන්නට එක ප්‍රශ්නයක් ඉතිරිව තිබුණි. ඒ එදා සිරිපා ගමනින් පසු ගෙදර උදවියගෙන් ලැබුණු ප්‍රතිචාරයයි. ඊට සිනාසෙමින් ඇය කිව්වේ මෙවැන්නකි.

"අම්මෝ ඉතින් අපි යාළුවෙක්ගෙ ගෙදර යනවා කියලනේ ගියේ. ආරංචි වුණු ගමන් ගෙදර අයට කේන්ති ගියා. උඩදි අමාරුවුණා නම් එහෙම මොකද කරන්නේ කියලා ඇහුවා. ඇත්තමයි දවසක් දෙකක් යනකල් එයාලා මගෙත් එක්ක හරියට කතා කළෙත් නෑ."

■ රුවන් එස්.සෙනවිරත්න

හිතේ හයියෙන් ජීවිතය දිනන්න කැමති කොයිකාටත් අතහිත දෙන්න 'ධරණී' හැමදාමත් කැමතියි. නිකරුණේ ගෙවිලා යන කාලය තමන්ගේම කියලා ස්වයං රැකියාවක් වෙනුවෙන් යොදවන්න කැමති කාන්තාවන්ට හොඳ ඉල්ලුමක් තියෙන විවිධ දෑ පියවරෙන් පියවර ගෙදරදිම හදාගන්න හැටි කියලා දෙන්න අපි හිතුවේ ඒකයි. කඩදාසි, මැටි, රෙදි, විවිධ ආහාර, සබන් ඇතුළු විවිධ දේ නිර්මාණය කරන විදිය ගැන සහ ඒවා වෙළඳපොළ වෙත යොමු කරන ආකාරය ගැන මේ ලිපි මාලාව හරහා ඔබව දැනුවත් කරනවා.

සීතා පොන්නම්පෙරුම
ස්වයං රැකියා පාඨමාලා උපදේශිකා

එංගලන්තෙ මහ රැජිනටයි අපේ රූ රැජිනටයි නැතුවම බැරිවුණු රත්තරන් සිරප් එක

බකිංහැම් පැලස්,
1960 ජනවාරි 24.

ආදරණීය ඩිවයිට් ජනාධිපතිතුමා,

අද උදෑසන ඔබේ ජායාරූපයක් පුවත්පතක පළවී තිබෙනු දුටුවා. ඔබ ඉතා ප්‍රීතියෙන් බාබක්‍යූ පුළුස්සන තැනක සිටින අන්දම එයින් මා දුටුවා. ඔබ අපේ රටට පැමිණි අවස්ථාවේ එවැනි කෑමක් පිළියෙල කරගන්නට නොහැකිවීම ගැන මා තුළ බලවත් කණගාටුවක් ඇතිවුණා.

ඒත් ඔබට ඉතා රසවත් බාබක්‍යූ එකක් පිළියෙල කරගන්නා හැටි ලියා දක්වන්න මම කැමතියි. ඒ සඳහා අවශ්‍ය වට්ටෝරුව මේ සමඟ එවනවා. සියලු දේ ඔබට කැමති අන්දමට එකතු කරන්න.

හැබැයි කිසිම වෙලාවක මේකට සීනි සිරප් නම් යොදන්න එපා. ඒ වෙනුවට ගෝල්ඩන් සිරප් යොදාගන්න. එයින් බාබක්‍යූ එකේ රසය වැඩි වෙනවා. ඉතින් ඔබටත් ඔබේ ආදරණීය බිරිඳටත් සුබ පතමින් නවතිනවා.

මෙයට හිතවත්,
එළිසබෙත්

ඩිවයිට් ඩී අයිසන්හවර්, ඇමරිකාවේ 34 වැනි ජනාධිපතිතුමා. ඩිවයිට් ජනාධිපතිතුමයි එංගලන්තෙ එළිසබෙත් රැජිනයි ඒ කාලේ බොහොම සුහදයිලු. ඉතින් රැජින ඩිවයිට් මහත්තයට යැව්ව ලියුමක් තමයි ඔය උඩදි කියැව්වේ.

කේක්, අතුරුපස, බිස්කට්, අයිස් කෝපි, බාබක්‍යූ වගේ කෑම ජාතිවල රසය වැඩි කරන්න ගෝල්ඩන් සිරප්වලට පුළුවන්. සීනි පැණියට වඩා ගෝල්ඩන් සිරප් නැත්තම් රත්තරන් සිරප් හොඳයි කියලා රැජින ඔය ලිපියේ විශේෂයෙන්ම සඳහන් කරලා තියෙන්නේ ඒකනේ.

එක්දස් අටසිය ගණන්වල එංගලන්තෙ ජීවත්වෙච්චි ආබ්රම් ලයිල් කියන ව්‍යාපාරිකයාට ණයක හිලව්වට සීනි පිරිපහදුවක් ලැබිලා. පිරිපහදුවේදි සෑහෙන සීනි ප්‍රමාණයක් අපතේ යනවලු. ඉතින් මේ අපතේ යන සීනිවලින් වැඩක් ගන්න හිතපු ආබ්රම් එක එක පරීක්ෂණ කරලා අවසානෙදි ගෝල්ඩන් සිරප් හදලා පස්සේ වාණිජමය ව්‍යාපාරයක් විදියට අලෙවි කළාලු. ඉතින් දැන් යුරෝපීයයන් පැණි රස ආහාරවලට වැඩිපුරම යොදන රසකාරකය විදියට හඳුන්වන්නේ මේ ගෝල්ඩන් සිරප්.

ඕට්ස්, කෝර්න් ෆ්ලේක්ස් වගේ කෑම එක්ක මෙව්වා නිකන් කන්නත් පුළුවන්. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීනී රෝසි සේනානායක එකපාරක් පාර්ලිමේන්තුවට ගෝල්ඩන් සිරප් ඕනේ කියලා යෝජනාවක් ඉදිරිපත් කරලා. ඉතින් 2012 ඉඳලා පාර්ලිමේන්තුවේ උදේ කෑමට රත්තරන් සිරපුත් දෙනවා කියලයි ආරංචිය.

එව්වා කොහොම වෙතත් වෙඩින් කේක්, නත්තල් කේක් වගේ කේක් නිෂ්පාදනය කරන අයගෙන් වගේම අතුරුපස කර්මාන්තයෙනුත් ගෝල්ඩන් සිරප්වලට හොඳ ඉල්ලුමක් තියෙනවා. රත්තරන් සිරප්වලින් රන් කහවණු හොයන හැටි කියලා දෙන්න හිතුවේ ඒකයි.

මුලින්ම ගෝල්ඩන් සිරප් 750mlක ප්‍රමාණයක් හදමු. ඒකට සීනි 100g, වතුර මේස හැඳි 3, ආයෙත් සීනි 500g, උණුවතුර 300ml, දෙහි/ලෙමන් පලු 1/4 සපයාගන්න.

1 සීනි 100g සහ වතුර මේස හැඳි 3 භාජනේකට දාලා ටිකක් දියකරලා ලිපෙන් තියන්න. පස්සේ මේ මිශ්‍රණය කුරුගාන්නේ නැතිව කැරමල් කරගන්න.

2 මිශ්‍රණය කැරමල් වුණාට පස්සේ උණුවතුර 300ml එකතු කරන්න. දැන් ඉතුරු සීනි 500gයි ලෙමන් නැත්තම් දෙහි කෑල්ලයි දාලා මද ගින්දරේ උකුවෙනකල් විනාඩි 46-55 පිසගන්න.

සීනි කැට ගැහෙන එක නවත්තන්නයි දෙහි එකතු කරන්නේ. ඉතින් මිශ්‍රණේ ලිපෙන් බෑවට පස්සේ දෙහි කෑල්ල අයින් කරන්න. උණුවෙන්ම ජීවානුහරණය කළ බෝතල්වලට දාන්න.

ගෝල්ඩන් සිරප් 300gක් 300- 400 අතර මිලකට දෙන්න පුළුවන්. ගෝල්ඩන් සිරප් ගැන තවත් විස්තර දැනගන්න ඕනේ නම් 0714766819 අංකයට කතා කරන්න.

■ සෙව්වන්දි හෙට්ටිආරච්චි

අවසරයි

බියංකා නානායක්කාර ලියයි

100 කොටස



අපි හෙට කසාද බඳිමු මං ඔයාට වැරැද්දක් වෙන්න දෙන්නෙ නෑ..

හැඟීම් සිතුවිලි ගැන කොතෙක් දේ කියවා දැන ඉගෙන ඇතත් ඒ සියල්ල කුමකටදැයි තේනුකට සිතුණේ කාමරයෙන් පිටව යන අංජනා දෙස බලද්දීය. කා, බී, නා ඇඳට ගියේ ඈ ළඟින් තබාගෙන බොහෝ දේවල් කතා කිරීමේ බලාපොරොත්තුවෙනි. ඒත් පිටත වැස්සත් දෙදෙනාගේම සිත සෙවූ උණුසුමත් ඒ සුන්දර මොහොත ගිනිබත් කළ බව වැටහුණේ සියල්ල සිදුවූවාට පසුවය. තේනුක තෙන්නකෝන් ඇඳේ ඉඳගෙන දෑතින් හිස බදාගෙන සිතුවේය. ඔහුට ඔහු ගැනම කළකිරීමක් දැනෙමින් තිබිණි. හදවත ඇතුළාන්තයෙන් බොහෝ දෙස් නගනු ඇසෙයි. ඔහු දෑතින් නළලත මිරිකාගත්තේය. අංජනා කාමරයට එන්නට පෙර ඔහු ඇඳෙහි තිබූ ළා නිල් පැහැති ඇඳ රෙද්ද අකුලා අතට ගත්තේය. වය පොඩි නොවන්නට නවා අල්මාරියේ ඇඳුම් අතර සැඟෙව්වේය. වෙනත් ඇඳ රෙද්දක් අල්මාරියෙන් ගත් ඔහු වය රැළි නොසිටින සේ ඇඳට එලා ඇඳෙන් ඉඳගත්තේය. තව දින කීපයකින් මාතලේ යන්නට පෙර ඇය සමඟ විවාහය ලියාපදිංචි කරන්නට ඔහු ක්ෂණිකව සිතා ගත්තේය. ඒ ගැන අංජනා හා කතා කළ පසු ඇගේ හිතත් හැදෙනු ඇතැයි ඔහු සිත කීවේය. මලක් සේ මේ වහල යටට ආ අංජනා ඇල්ලේපොල මලක් සේම රැකගන්නට බැරිවීම ගැන සිත උඩට එන සිතුවිලි පරද්දන්නට ඔහුට බැරිවුණේය.

අඩි හඬක් ළං ළංව ඇසුණේය. නාන කාමරයට ගිය අංජනා ආපසු කාමරයට ආවාය. නාන කාමරයට යන්නට පෙර ඒ ගැන මේ තරම් පශ්චාත්තාප වන්නට එපා කියා අංජනා කීවේ ඇත්තටමය. සිදුවූයේ යළි හැදිය නොහැකි වරදක් වුවත්, ඊට ඔහු පමණක් වරදකරුවෙකු කිරීම අසාධාරණය. තමන්ද ඊට අනුබලයක් නොදුන්නා නම් මේ සිදුවීම මේ තරම් දුර නොයන බව අංජනාගේ හිත ඇයට පහදා දුන්නේය. ජීවිතය මෙය නම් එය වින්දට පසු විඳවීම හොඳ නැති බව දවසක්ද අප්පච්චි කීවා මතකය. ඒ නිසා, මේ මොහොතෙ හිත හදාගෙන ඉදිරියට මුහුණ දෙන්නට ඇය නාන කාමරයේදී සිතා ගත්තාය. හිතේ සැනසිල්ලට ඇත්තේ ඉමක් කොනක් නොපෙනෙන ඔහුගේ ආදරයයි. අංජනා පැමිණි ඔහුගේ ඇඟේ ගෑවීගෙන සේ ඉඳගත්තාය.

"නෝනා... ඔයා මට සමාව දෙනවද?"

ඇගේ කරවටා අත දමා වැරෙන් පපුවට තුරුලු කරගනිමින් තේනුක ඇහුවේ සැබැවින්ම හඬන හඬවතෙනි. අංජනා මොහොතක් කතා නොකර සිටියාය. ඇඳේ රෙද්ද මාරුවී තිබෙනු දුටුවත් ඇය ඒ ගැන අසන්නට ගියේ නැත. තවමත් පිටත වැස්ස පායා නැත. ඒ නිසා ඔහු ළඟින් දැනෙන උණුසුමේ ආයෙත් වැතිරෙන්නට තරම් ඇගේ හිත කීවේය.

"අහන්න ඔයා ඒ ගැන ඔයතරම් දුක් වෙන්න එපා. වුණේ හොඳ දෙයක් නෙවේ... ඒත් මං අඬන්නෙ නෑ නේද මං දිහා බලලා හරි ඔයා ඔයා වෙන්න. තේනුක තෙන්නකෝන් කියන්නේ කෙළින් වැඩ කරන කෙනෙක් කියලා දන්න හින්ද තමයි මං මගේ ජීවිතේ ඔයාට බාර දුන්නේ. අපේ අම්මා මාව ඔයාට බාර දීලා බය නැතුව ඉන්නෙ. ඉතින් මං දන්නවා ඔයා මට අසාධාරණයක් කරන්නෙ නෑ කියලා."

තේනුක අංජනාගේ මුහුණ දෑතට අල්ලාගෙන ඒ මුහුණේ මුහුණ ඔබාගත්තේය. අංජනා දෑස් වසා ගත්තාය. යාන්තම් රැවුල් කොට මුහුණේ එහා මෙහා වදිනු දැනෙයි. ඔවුන් අතරේ හුවමාරු වූයේ කෙටි සුසුම් දිග සුසුම් පමණය.

"හෙට අපි බඳිමු..."

ඇගේ මුහුණින් මුහුණ පසෙකට ගත් තේනුක ඒ ඇස්වලට එබීගෙනම කීවේය. අංජනා ඇහි පිල්ලමක් හෝ නොගසා ඔහුගේ දෑස් දෙසම බලා උන්නාය.

"බොරු නෙවේ නෝනා ඇත්තමයි කියන්නේ අපි දෙන්නා හෙට කසාද බඳිමු. මං ඔයාට වැරැද්දක් වෙන්න දෙන්නෙ නෑ "

අංජනාගේ දෙතොල් අතරේ යන්තම් සිනා රැල්ලක් ඇඳුණේය. තේනුකට පුදුම සිතුණි. ටෙලි නාට්‍යවල, චිත්‍රපටවල ඒත් නැත්තම් කියවූ පොත්වල මෙවන් අවස්ථාවකට මුහුණ දුන් තරුණියන් හැසිරෙන ආකාරය ඔහු දැක කියවා තිබුණි. ඇය ඊට වඩා කෙතරම් නිවුණු කෙනෙක්ද? මේ ලක්ෂණ ඈ තුළින් ඔහු දුටුවේ මේ මොහොතේ පමණක් නොවේ.

"දැන් මං කිව්වද ඔයාට හෙටම මාව බඳින්න කියලා ඔයා මාව දෑලා යන්නෙ නෑනේ. ඔය මූඩ් එක වෙනස් කරන්න දැන්. අපි පස්සෙ ඔය ගැන කතා කරමු. කොහොමත් අපි බඳින්න ඕන. මගේ බබාලගේ අප්පච්චි වෙන්න ඕන ඔයානේ "

අංජනා වැඩිපුර කතා කළේ ඔහුගේ හිත හැදෙන්නටය. තේනුක ළඟට ආයෙත් ඔහුගේ පුරුදු හිත ගෙන්වා දෙන්නටය. ඇය ඇඳෙන් නැගිට ඔහුගේ අතින් ඇද නැගිට්ටිවේය.

"යන්න ගිහින් ඇඟ හෝදගෙන එන්න. මං රස්නෙට තේ එකක් හදන්නම්. පාන් පෙත්තකුත් දෙන්නම් පරිප්පු දෑලා ටෝස්ට් කරලා "

ඇය කුස්සියට යන්නට යද්දී ඔහු ආයෙත් අංජනාගේ අතින් ඇද නවතා ගත්තේය.

"මට හරි පුදුමයි ඔයා ගැන "

"ඇයි..?"

"සිද්ධවෙච්ච දේ ඔයා දරාගන්න විදිය. ඇත්තමයි. මට තාම හිත හදාගන්න අමාරුයි..."

ඇගේ දෙවුර මතට දෑත් බර කරමින් ඔහු කීවේ සෙමිනි.

"අපි ජීවිතේ විඳලා ඒ සතුටින් හුස්ම ගමු. විඳව විඳව දුක් වෙන්න ඕං නෑනේ "

"කවුද ඔය කතාව කියලා දුන්නේ..?"

"අප්පච්චි... එයාගේ නෑයෝ ඔක්කොම එපා කියලා අම්මත් අරන් මාතලේ ගිහින් තියෙන්නෙත් ඒකයි "

ඔහුව නාන කාමරයේ දොර ළඟටම තල්ලු කරගෙන ගිය අංජනා ඔහුව එහි දමා දොරත් වැසුවාය.

"ඇඟ හෝදන්නෙ නැතුව එන්න එපා "

ඔහුට ඇසෙන්නට කියමින් අංජනා මුළුතැන්ගෙයට ඇවිද ගියාය.

සෙනෙහෙලතා මැණිකේ සිටියේ පිරුණු හිතෙනි. ඒ කලකට පසු තේනුක දකින්නට ලැබීමත් ඔහු හා කෙටි කාලයක් හෝ ගෙවන්නට ලැබීමත් නිසාය. ඒත් හිතේ කෙළවර බරට තැන්පත් වූ කරුණක් සැරින් සැරේ හිත උඩට මතුවුණේය. ඒ තේනුක තෙන්නකෝන්ට පෙම්වතියක් සිටින බව කී කතාවය. වය තවත් ප්‍රශ්න ගොඩක ආරම්භයක් බව දැන දැනම ඇය ඒ තරුණිය බලන්නට මාතලේ යන්නටත් සිතා ගත්තාය.

"නැන්දම්මේ... අම්මෝ මීට පස්සෙ නම් මේනක අයියත් එක්ක ගමන් යන්නෙ නෑ "

සෙනෙහෙලතා මැණිකේ ගැස්සී ගියාය. චතුමිණී නිවස තුළට එනවා දැනුණේවත් නැත. ඒත් ඈ කී දෙය නම් ඇසුණේය.

"ඒ මොකද මැණිකේ..?"

"මෙයා ආවා නෙවේ ඉගිල්ලුණානේ. හෙමින් එමු කිව්වට ඇහුවෙ නෑ මං හිතුවා මට වලාකුළුත් අල්ලන්න පුළුවන් වෙයි කියලා. කෝල් එකක් ආවා විතරයි මෙයාට තදියම හැදුණා "

ඇගේ කතා විලාශයට සෙනෙහෙලතා මැණිකේට සිනහ නැගුණාය.

"කෝ දැන් ලොකු පුතා..?"

"මාව ගේට්ටුව ළඟින් හැලුවා. ආයෙත් ඉගිල්ලුණා ගෙදරටවත් ආවෙ නෑ "

"ඔය දරුවා ඔහොම තමයි ටික දවසක් යනකොට මැණිකෙත් ඕවට හුරුවෙයි..."

සෙනෙහෙලතා මැණිකේගේ සිනාවට චතුමිණී ද එක්වූවාය. සෙනෙහෙලතා මැණිකේ චතුමිණීගෙන් ගෙදර තොරතුරු අසන්නට සූදානම් වූවා පමණි, ඇයගේ දුරකතනය හැඬෙවෙන්නට ගත්තේය. සෙනෙහෙලතා මැණිකේ ඇමතුම ගත්තාය. එහා කොන වූයේ තෙන්නකෝන් බණ්ඩාර ඇමතිවරයාගේ ආරක්ෂකයෙකු වන සුමංගල ය.

"මැඩම්... කලබල වෙන්න එපා. ඇමතිතුමාට පොඩ්ඩක් අසනීපවෙලා හොස්පිට්ල් එකට ආවා. මැඩම්ට පුළුවන්ද ජයවර්ධනපුර හොස්පිට්ල් එකට එන්න..?"

සෙනෙහෙලතා මැණිකේගේ හිතට මහා බයක් දැනුණි. ඇය විස්තර ඇසුවද සුමංගලගෙන් ඊට වඩා දෙයක් ගන්නටත් බැරි වුණේය. සෙනෙහෙලතා මැණිකේ වෙන ඔසරියක් පටලවාගත්තේ කලබලයෙන්මය. චතුමිණී ඒ අතරේ කැබි රියකට කතා කළේ වාහන එකක්වත් නිවසේ නැති නිසාය. එළියට බහිනවිටත් සෙනෙහෙලතා මැණිකේගේ හිත අහේතුකවම බියට පත්ව තිබුණි.

කැබි රියේ පසුපස අසුනට චතුමිණී නැග්ගාට පසු සෙනෙහෙලතා මැණිකේ නගින්නට සැරසුණාය. ඔසරියේ පය පැටලුණු සෙනෙහෙලතා මැණිකේ වැටෙන්නට යද්දී ඈ අල්ලාගත්තේ එතැනට පැමිණ සිටි ගේට්ටුවේ ආරක්ෂක නිලධාරියාය.

"මැඩම්... බාධයි වගේ. ටිකක් ඉඳලා නගින්න..."

ආරක්ෂක නිලධාරියා එසේ කීවත් සෙනෙහෙලතා මැණිකේට මොහොතක්වත් පමාවෙන්නට සිතුණේ නැත. ඇය වාහනයට නැගුණාය.

ලබන සතියට

තලෙළු යුවතියක් උඩරට මනාලියක් ලෙසින්

අද 'ධරණී මනාලිය' තුළින් ඉදිරිපත් කරන්නේ තවත් සුන්දර උඩරට මනාලියක්. මේ මනාලිය හැඩගන්වලා තියෙන්නේ මාලඹේ අමේලි බ්‍රයිඩ්ල් සැලෝන්හි මනුජා ප්‍රියදර්ශනී විසින්.

මැය සාම්ප්‍රදායික උඩරට මනාලියක්. සුදු මේඩප් සාරියේ Pearls stones වලින් තමයි වර්ක් එක කරලා තියෙන්නේ.

මනාලිය උස නිසා පෝසි ආකාරයේ බොකේ එකක් දුන්නා. ස්වාභාවික නෙළුම් මල් සහ සල්මල් පොහොට්ටු යොදාගෙන බොකේ එක හදලා තියෙනවා. හෙඩ්ස් එක හදන්නත් භාවිතා කරලා තියෙන්නේ ස්වාභාවික මල්, පොහොට්ටු සහ පර්ල්ස්.

ජුවලරි තෝරාගනිද්දී සම්ප්‍රදායික පෙනුමක් තියෙන නවීන විලාසිතාවේ තැල්ලක් භාවිත කළා. ආභරණ කට්ටලයට මාල 5ක්, ඉරහඳ සහ අනෙකුත් ආභරණ භාවිතා කළා. මනාලියගේ මුහුණේ හැඩයට ගැලපෙන විදියට පොඩි තැල්ලක් තමයි භාවිතා කළේ.

මනාලිය පැහැපත් තලෙළු සමක් තියෙන කෙනෙක්. ඒක නිසා සමේ පැහැයට ගැලපෙන විදියට makeup එක කළා. Eye makeup එක පොඩ්ඩක් ඉස්මතු වෙන විදියට කළා.

කොණ්ඩා මෝස්තරය සාම්ප්‍රදායික ක්‍රමයට බන් එකක් ආකාරයට සකසලා තියෙනවා. මුහුණ දිගටි හැඩැති නිසා ඉදිරිපස කොණ්ඩය උස් කරන්නේ නැතුව මුහුණට ගැළපෙන ආකාරයට දැම්මා.



හැඩගැන්වීම
මනුජා ප්‍රියදර්ශනී
(අමේලි බ්‍රයිඩ්ල් සැලෝන්)

ඡායාරූප
හසුන් විතාරණගේ
ෆොටෝග්‍රැපි

සම්බන්ධීකරණය
ක්‍රිෂාන්ත පුෂ්පකුමාර

ඔබත් කෙට්ටුද?
ස්ත්‍රී / පුරුෂ දෙපක්ෂයටම

ඔබගේ කෙට්ටුව නැති කර පිරිපුන් පැහැපත් පෙනුමක් ලබා ගැනීමට අපගේ ආරක්ෂාකාරී ප්‍රතිකාර

පැමිණ හෝ තැපැල් මගින් ලබාගන්න

077 4227503 / 071 4194464

අධික තරබාරුව, පොතුකබර, කාන්තා රෝග, දද, කුෂ්ඨ ඇතුළු සියලුම සර්වාංග රෝග සඳහා විශේෂ ප්‍රතිකාර

දේශීය ඖෂධාලය
කොළඹ නුවර පාර මිරිස්වත්ත ගම්පහ
මිරිස්වත්ත හංදියේ කොළඹ දෙසට යන බස් නැවතුම්පොළ අසල
වෛද්‍යවරයා හමුවීම සෙනසුරාදා ඉරිදා හා සඳුදා දිනවල පෙ.ව 09.00 - 04.00 දක්වා

ආදරය නිසා කඳුළු සැලූ මට පිහිටවූ එකම තැන

- පවුලේ ඇති වන සියලුම ගැටලු වලට විසඳුම්
- මත් කුඩු සුරාව නවතා දැමීමට
- පෙම්වතා/පෙම්වතිය ලඟා කර ගැනීමට
- අඹු සැමියන් අතර ආරවුල් වලට විසඳුම්
- ව්‍යාපාර දියුණුවට හා නොවිකිණෙන ඉඩම් විකිණීමට
- 2022 / 2023 සියලු විභාග සමත් වීම සඳහා විමසන්න
- නිවාස ආරක්ෂාවට හා පවුලේ දියුණුවට
- රැකියා ලබාගැනීමට
- හැරගිය අය ගෙන්වීමට
- අයුතු සබඳතා නැවැත්වීමට

ක්ෂණික ඇමතුම් -0777 444908

බිංගිරියේ ගුරු හාමුදුරුවෝ
සමග සේන මහතා 037 22 48 828
(පූජා භාණ්ඩ ඔබ විසින් සැපයිය යුතුය)

හමුවීම
සෙනසුරාදා - ඉරිදා
උදේ 8.00 සවස - 3.00 දක්වා

ගමන් මාර්ගය නාරම්මල සිට කුලියාපිටිය පාර, වෑවගම හෙට්ටිපොළ කුලියාපිටිය බසයක නැග හොරොම්බා හන්දියෙන් බැස මැටිවල ගෙදර පාරේ මීටර් 50 ඉදිරියෙන් ගුරුගල්ගොඩ මෝලවත්ත කාර්යාලය පිහිටා ඇත.

careteker
— Guru Dewa Shanthi Services —
Post Code No ' 60181
Gurugalagoda "Molawatta"
Horombawa

භාරකාරතුමා
"ගුරුදේව ශාන්ති සේවාව"
තැ. ස අංකය 60181
ගුරුගල්ගොඩ
මෝලවත්ත
හොරොම්බාව

විදේශගත අයගේ රැකියා, ගේ දොර ඕනෑම ප්‍රශ්නයක් සඳහා මුහුදෙන් එතරට බලපාන පරිදි සකසා DHL මගින් ඔබ අතට ඉක්මනින් විසඳුම්
0094 37 22 48828

උකස් රන් භාණ්ඩ
බේරාදී වැඩිම මිලට මිලදී ගනු ලැබේ.
කැරට් 20, 18,14, 09.
රජයේ ලියාපදිංචි ආයතනයකි.
074 152 30 35
SL PROMO

උගස් තැබූ රත්තරං
ඔබ උගස් තැබූ ආයතනයට පැමිණ
බේරාදී වැඩි මිලට මිලදී ගනු ලැබේ.
කැරට් 22 සඳහා ඉහල මිලක්
076 101 88 53
SL PROMO

ගුරුගේ එල්ඩස් කෙයා ශාඛා ජාලයේ විවෘතවූ නව ශාඛා 2 ක් සඳහා නේවාසිකයින් බඳවා ගැනීම ඇරඹුනා. රෝගී, නීරෝගී ඕනෑම වයස් මට්ටමක වැඩිහිටියන් සඳහා යාබඳ නාන කාමර සහිත තනි කාමර, හුවමාරු කාමර හා ශාලා ආදී වශයෙන් සාධාරණ මිල ගණන් යටතේ රැකවරණ පහසුකම් ඇත. විශ්වාසනීය හා කාරුණික රැකවරණය, හදිසි අසනීප රෝහල් ගත කිරීම්, මරණ කටයුතු වැනි අවස්ථාවලදී භාරකරුවන් හට සහයෝගයක් වී එම කටයුතු ආයතනයෙන් ඉටුකරනු ලැබේ.

070 - 441 44 44 / 076 - 5 560 608
076 - 714 44 49 / 070 - 4 441 244

ඔබගේ දරුවා මෙවර අපොස සා.පෙ/උ.පෙ/ ශිෂ්‍යත්වය විභාගවලින් ඉහළින්ම සමත් කරන්නේ කෙසේද? අදම අමතන්න

- අයුතු සම්බන්ධතා නවතා ගැනීමට නොහැකිද?
- පෙම් සමබන්ධතා බිඳ වැටී ඇත්ද?
- විවාහය ඉක්මන් කරගන්න
- ආර්ථික අපහසුතා මැද්දේ රැකියාවක් ලැබෙන්නේ නැද්ද?
- ව්‍යාපාර කඩා වැටුණාද?

උපන් දිනය සහ වේලාව සමඟ අමතන්න
071 031 4878

ජාත්‍යන්තර කීර්තියට පත් ගුප්ත විද්‍යා විශේෂඥ සද්ධර්ම කීර්ති ශ්‍රී ජෝර්ති විද්‍යාශූර විහාරාධිපති
අති පූජ්‍ය වේරපිටියේ ඥාණිස්සර වෙද හාමුදුරුවෝ
පුරාණ විහාරය වේරතැන්න, වේරපිටිය.

මාගේ දරුවාගේ විභාගයෙන් විශිෂ්ඨ ලෙස සමත් කරදුන් නිසා රත්නපුරයේ සමන්ති කුමාරි විසින් මෙම දැන්වීම පළ කරන ලදී

ධරණී
ලිබර්ටි පබ්ලිෂර්ස් ප්‍රයිවට් ලිමිටඩ්
අංක 91, විජේරාම මාවත, කොළඹ 07.
දුරකථන-0115 200 900
බෙදහැරීමේ අංශය -0112 127204
දැන්වීම් අංශය-0112672801 0112672603
ෆැක්ස්-0112 673 451

දැන්වීම් සඳහා අමතන්න
0112 672 601
0112 672 603

නිවාස ඉතා විශ්වසනීයව ඉදි කරවා ගැනීමට ලංකාවේ ඕනෑම තැනක සුවිශේෂී වට්ටම්.
077 1600 792
077 2220 886

කඳාන SALON
එකක් සඳහා ඉතා දක්ෂ රූපලාවණ්‍ය ශිල්පී, ශිල්පිනියන් ඉක්මනින් අවශ්‍යයි.
ඉහළ වැටුප් හා කොමිසන්
077 222 0886

ගවුම් මැසීමට ඔපරේටර්වරියන් අත් උදව් කරුවන්, අයන්, පැකින් සාදන්නන් අවශ්‍යයි, නවාතැන් ඇත. කැබලි ගණනට හෝ වැටුප් 40000/මැෂින් 10 වඩා වැඩි අයට සබ් දෙනු ලැබේ. (අවට අය විශේෂයි)
පන්නිපිටිය
071 700 9756

නාවල
පිහිටි ආයතනයකට කාන්තා ඇඳුම් මැසිය හැකි මැහුම් ශිල්පීන් අවශ්‍යයි. නවාතැන් පහසුකම් සැපයේ.
077 866 6599
076 587 5840

වාණිජ බැංකු ඇබෑර්තු
★ ප්‍රමුඛතාවයට පත්වෙමින් පවතින ආධුනික බැංකු කිහිපයක පුරප්පාඩු සඳහා දිස්ත්‍රික්ක මට්ටමින් අයදුම්පත් කැඳවේ.
★ අවම සුදුසුකම් O/L වේ.
★ වැටුප් සමග පුහුණුව.
★ රැකියාව තම ප්‍රදේශයටම.
සහනාධාර 40,000/-
18/40 ගැ/පි
(මෑන් පවර් නොවේ)
0712 564 715 | 0703 346 072
0774 024 155 | 0702 725 731
0761 125 624 | 0702 231 694

සුදු කබර / පොතු කබර විශේෂ ප්‍රතිකාර
චර්ම රෝග විශේෂඥ වෛද්‍යවරයෙක් විසින්
සහන චැනල් සෙන්ටර්
68, පේරාදෙණිය පාර, මහනුවර. (වෙබ්ලි සිනමා අසල)
හමුවීම ඉරිදා 8.00 සිට 10.00 දක්වා
විමසීම්: 0777 488932, 0718202297, 0727900990
ශාඛාවන් :- හෝමාගම / මීගමුව
පළමු දින පැමිණ සුව වූ රෝගීන්ගෙන් විමසා බලා ප්‍රතිකාර ලබා ගන්න

රත්තරන් වාසියක්
උකස් තබා ඇති රන් භාණ්ඩ බේරා වැඩි මිලට ගනු ලැබේ.
077 97 71 322

උගස් රත්තරන්
සින්න වීමට යන රන් භාණ්ඩ අප ආයතනය විසින් ඔබ උගස් කල ආයතනයට පැමිණ බේරා දී පොරොන්දු වූ මිලටම මිලදී ගනු ලැබේ දිවයින පුරා සේවාව, බොරුවලට නොරුවටෙන්න
පවුම - 180,000/-
070 157 0936 / 070 155 2260

මෙවර සාමාන්‍ය පෙළ / උසස් පෙළ / ශිෂ්‍යත්වය ඇතුළු සියලුම විභාගවලින්
විශිෂ්ට ජයග්‍රහණ ලබා ගැනීම සඳහා පැමිණ හමුවන්න.
නැතහොත් ලිපියක් මගින් විමසන්න.
(පූජා භාණ්ඩ ඔබ විසින් සැපයිය යුතුයි.)

ප්‍රේම සබඳතා බිඳවැටෙන්නේ ඇයි?
ව්‍යාපාර/ගේ දොර පාළු වී යන්නේ ඇයි?
අයුතු සම්බන්ධතා නිසා පවුල් අවුල් වන්නේ ඇයි?
මෙන්න!
එයින් මිදෙන්න නිසි මඟක්...

අයුතු සම්බන්ධතා නැවතීම
* නිවාස ආරක්ෂා
* නඩුහබ දිනීමට
* දරුඵල ලබීමට
මත්කුඩු සහ සුරාව
* රැකියා ලබා ගැනීමට
* සියලු විභාග සඳහා
* නොවිකිනෙන ඉඩම් විකිණීමට
*විවාහ පමා අයට
*හැරගිය අය ගෙන්වීම
*අසාර්ථක ව්‍යාපාර දියුණුවට

මාතර වෙද හාමුදුරුවෝ
ඔබ කුමන හෝ මත්ද්‍රව්‍යකට ඇබ්බැහි වූ අයෙක් ද?
එසේ නම් ඉන් මිදීමට අමතන්න.
වරු තුනෙන් ප්‍රතිඵල පැමිණ හමුවන්න
අමතන්න 077 362 77 14

හමුවීම
බදාදා, සෙනසුරාදා
පෙ.ව. 8.00 සිට
ප.ව. 3.00 දක්වා
කුරුණෑගල, පොතුහැර චන්ද්‍රසේල පිරිවෙන් පුරාණ විහාරයේදී

ශාස්ත්‍රවේදී පණ්ඩිත මාතර වෙද හාමුදුරුවෝ
හාරකාරතුමා, ජනසෙත වෙද මැදුර, චන්ද්‍රසේල පිරිවෙන් විහාරය, කොළඹ පාර, පොතුහැර, කුරුණෑගල, පොතුහැර චන්ද්‍රසේල පිරිවෙන් පුරාණ විහාරයේදී

කවි යාය

ඉස්කෝලෙට ඔබ එනකොට

සාලාවට ගල තියන්ඩ ඉස්කෝලෙට ඔබ එනකොට
අඳින්ඩ ඕනෑ ඇඳුමුත් අහන්ඩ ඕනෑ ප්‍රශ්නත්
කොඩි වනන්ඩ, බුලත් දෙන්ඩ වඳින්ඩ ඕනෑ විදියත්
කල්තියාම ටීචර්ලා කියලා දුන්නා අකුරට

කහට පාට සුදු කමීස පස්ස ගෙවුණ කලිසම් කොට
වාටි ලිහපු අණ්ඩ දමපු කිහිළි ඉරුණ පරණ ගවුම්
ඒ සේරම අයින් කරල තියෙන හොඳම ඇඳුම් ඇඳල
පාන්දරම අපි ආවේ කොළඹින් එන ඔබ දකින්ඩ

වටෙන් එන්ඩ හූඟක් දුරයි ඒදඬු මංකඩ ගාවට
මෙච්චරකල් අපි ආවේ ගලින් ගලට පය තිය තිය
රෑයට දෙකට එක හුස්මට වලවල් ගල් මුල් මඟ හැර
කෙටි පාරක් කපා ගමට කොඩි දැම්මා ඔබට එන්ට

දෙට්ට බරක් හැදුන ගමන් අත උස්සා අවසර ගෙන
රේස් එකේ දුවල ගිහින් ඉස්කෝලේ වත්ත කොනට
පයිප්ප ඇරියා වාගේ මූණු බලා හිනැහීගෙන
තාමත් අපි චූ කරන්නෙ කැලෑව ළඟ කම්බි වැටට

ඒ වුණාට අපි බලන්න
ඔබ එනකොට ඉස්කෝලෙට
අලුතින් හැදූ කක්කුස්සිය
හරි කදිමයි සුදු පාටට!

ඉන්ද්‍රා පුෂ්පාණී ජයවර්ධන

බුදු දහමින් ජීවිතයට

නිසරු ජීවිතය තුළ
යස ඉසුරු පොදි බැඳන්
සිහින කප්පරක්
සිතෙහි සිරවී
නෑ... නිමක්

නිසරු කතරක් තුළ
මිරිඟු දිය පසුපස යමින්
පසුතැවීමෙන්
නෑ... පලක්

අනන්ත ගගනතල තුළ
ඇසෙන සම්බුදු බණ
එයින් ළංකරගෙන බිඳක්
සැනසෙමුද අපි
වෙනත් නම් නැත
දුක නිවාගන්නට
අන් මඟක්

ඊ.ඒ.එම්.එදිරිසූරිය
කුරුණෑගල

මෙන්න මගෙ ලොවෙහි ඉඩ

නුඹේ ඇස් මා දෙසම
යොමුවෙලා තියෙනවා
දන්නවද ඒත් මං
නොදුටු ලෙස ඉන්නවා
මගේ හිත මල් පිපී
හෙමි හෙමින් නටනවා
ගන්නනම් එපා ඇස්
හිතින් මං පතනවා

පෙමින් පිරෙනා දෑසෙ
ලියැවෙනා කවි දහක්
හොරෙන් කියවන විටදි
දැනෙනවා හරි රහක්
දුවන්විත් සිපගන්න
තියේනම් මට ඉඩක්
තවත් බලමින් නොඉඳ
අසන් මාගෙන් බහක්

අහසෙ පියඹා යන්න
තියෙන විට හොඳට ඉඩ
ඇයිද තවමත් ඉන්නෙ
හිරවෙලා කොටුවකට
එන්න අත අල්ලන්න
මෙන්න මගෙ ලොවෙහි ඉඩ
ඇසින් කළ ඇරයුමට
කරන්නම් ඔබව හැඩ

මුදිතා පෙරේරා
පානදුර

තෘෂ්ණා සිත් ඇවිලේ

දකිමින් වෙනස්කම්
විඳිමින් කුරිරුකම්
රවටමින් බැඳෙන බැඳීම්
ළය පාරවන වේදනා

අවුස්සමින් සිතිවිලි
පෙරටුවම අකුසල සිත
රැස් කරවමින් නිති කෙලෙස්
විවර කරවන්න සසරක ද්වාර

පෙනෙන්නට ඇත වේදනා
අසන්නට ඇත
කිනිසි පහරමෙන් වදන්
දකින්නට නැත අවංකකම
තෘෂ්ණා සිත් ඇවිලේ දින දින

නිපුනි සමෝදනා වත්තෙගම
බෙලිඅත්ත

මිතුදම

හිරු පායා බැස ගියාට
සඳ නැගලා සැඟ වුණාට
මම ඒ වගෙ නෑ
නිල් ගුවනත කළු වුණාට
වැහි විහිදන් සැඟවුණාට
මම දන්නවා ඔබ කවදත්
තරහ වෙන්නේ නෑ
මතු දිනයක වෙන්වුණාට
වෙන් වී ඈතට ගියාට
මම දන්නවා ඔබේ හිතට
මං අමතක නෑ
හිරු අයෙත් පායයි නම්
සඳ අයෙත් නැඟ එයි නම්
අපෙ මිතුදම ඒ වගෙම
වෙනස් වෙන්නේ නෑ

කිවිඳි නිර්මාලි ජයතුංග
ගාල්ල

කිරුළ නුඹ ජීවිතේ

පිනි වැටී නෙලුම් පෙති
හිනැහේවි විල්තෙරේ
සියොත් කැළ ගී ගයයි
කියා සැනසුම ජීවිතේ
සෝතැවුල් ලියමි මම
පිපුණු මල් පෙති මතේ
දෝණියේ නුඹයි මගෙ
කිරුළ මේ ජීවිතේ

මා ළඟින් දැවටෙමින්
තවම උණුසුම සොයනවා
කිරිල්ලිය වගේ නුඹ
නිදහසේ තටු සලනවා
සඳ සදිසි මුව විඳ
සිනහ කැන් බෙදනවා
සතුට සැනසුම සඳ
නුඹ අපට ගෙනෙනවා

පැතුම් දහමක් නැතේ
මම නුඹෙන් පතන්නේ
ළතෙත් බව ඉවසීම
පමණමයි වටින්නේ
හිනැහියන් හැම දිනේ
දුක දරන් ජීවිතේ
සැනසීම දුර නොවෙයි
නුඹ ළඟයි තියෙන්නේ

ප්‍රියංකා පතිරණාරච්චි
කිරිඳිවැල

වලවේ කුමරියේ

සොබාදම් දිනිතියගෙ නිපැයුම් රසබරය
අලි කොටි වලස් රජ දහනක කෙළවරය
මගෙ ගම මැදින් ගලනා ගඟ මනහරය
වලවේ කියන නම ඊටම හිතකරය

සම්බුදු පහස ලද සමනල කඳුවැටියේ
මිහිදුම් සේලෙ දවටාගත් බඳපටියේ
හිරිමල් සිනා පෙන්වන මට කිරිකැටියේ
වලවේ කුමාරිය හැඩවෙයි හිටිහැටියේ

වතුපිටි කුඹුරු ගොඩමඩ කරමින් සාර
පහළට ඇදෙන සීතල නිල් ජලධාර
කාගෙත් සිතට ගැම්මක් ගෙන දෙන සූර
නදි රාජිනිය ඔබටයි මගෙ උපහාර

සමනල කන්ද මුදුනේ සිට පැන නැංගා
වී කුරුලන් රැළක් මෙන් ගයමින් උංගා
සුදු පෙන බුබුළු මිණි කැට සළුයට හංගා
හෙමිහිට ගලා බැස යනු වලවේ ගංගා

ශ්‍රියා වතුකාර
වලේබොඩ

රැගෙන යන වත්කම

සැපයම සොයා
මිරිඟුව පසුපස දුවන
උපයන ධනය
යොදවා පස්කම් විඳින
සුන්දර ලොවක
තිර නොවනා ගිමන්හල
හැරදා යා යුතුය
හිත් ඔලගුව රැගෙන

සුවිසල් මැදුරුවල
පිරවු සැපපහසු
නෑ හිතවතුන්
පිරිවර පෙර ආවඩපු
කිසිවකු නොඑනු ඇත
සිව් රියනට ගැඹුරු

ලස්සන පියුමකට
සිදුවන අනියතය
පහදා දෙන්නෙ
ජීවිතයේ අතිර බව
හැරදා යා යුතුය
මරුවා හා සමඟ
කළ කී දේ පමණි
වත්කම රැගෙන යන

පාලිත නාරංගොඩ
පරගම්මන
යක්විල

කවි යාය

ඔබේ කවි නිර්මාණ පහත ලිපිනයට එවන්න.
''කවි යාය''ධරණී' කර්තෘ මණ්ඩලය, අංක 91,විජේරාම මාවත,කොළඹ 07 නැතිනම්
dharanee.editor@liberty.lk ලිපිනයට ඊමේල් කරන්න

HOME

SLT-MOBITEL
Home 4G
ගෙදරට හයියක්

වැඩිම ආවරණය

හොඳම Data Add-ons

Loyalty Data

4GLTE

ශ්‍රී ලංකාවේ වේගවත්ම
බ්‍රෝඩ්බෑන්ඩ් ජාලයෙන් බලගැන්වේ.

www.sltmobitel.lk

SLTMOBITEL
එකම එක සබැඳියාව

කොළඹ 7 විජේරාම මාවත අංක 91 නි පිහිටි ලිබර්ටි පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම විසින්, මල්වාන කළුකොදයාවේ පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.